51. ටයර්, ටියුබ් වෝල්කනයිසින් කිරීම
52. සිමෙන්ති නිපදවීම
53. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටස් භාණ්ඩ නිපදවීම
54. වැලි කඩදාසි නිපදවීම
55. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම
56. ගඩොල් පිළිස්සීම

57. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම
58. අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත පිරවීම
59. උළු නිෂ්පාදනය
60. පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයක් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම
61. යන්ත්‍රානුසාරයෙන් බ්ලොක් ගල් නිපදවීම
62. නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීම
63. කුකුළු වෙළඳසලක් පවත්වාගෙන යාම
64. විෂබීජනාශක නිපදවීම
65. ටයර්, ටියුබ් අලුත්වැඩියා කිරීම
66. සපත්තු/ බෑග්/ සම් භාණ්ඩ නිෂ්පාදනය
67. දුම්කොළ යොදා කරන සිගරට්, බීඩි, සුරුට්ටු නිපදවීම

අන්තරායදයක ව්‍යාපාර :

1. කළුගල් තැනීම හෝ කැඩීම
2. සිසිල් බීම නිෂ්පාදනය
3. අයිස් නිෂ්පාදනය
4. එළවළු තෙල් නිෂ්පාදනය
5. පොල් තෙල් නිෂ්පාදනය
6. ගිනි පෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
7. මෙතිලේටඩ් ස්ප්‍රිතු නිෂ්පාදනය
8. තේ පෙට්ටි නිෂ්පාදනය
9. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය
10. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය
11. පිදුරු තබා ගැනීම
12. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම
13. ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම
14. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම
15. හිරිගල් හෝ හුණුගල් කැඩීම
16. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම
17. හිස් ගෝනි හෝ හිස් බෝතල් තබාගැනීම
18. පා පැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීම
19. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබාගැනීම
20. විසිතුරු පින්තාරු කිරීම
21. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම
22. ලෝහ සංස්කාරක කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම)
23. වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම

ජීඛාකාරී හා අන්තරායදයක ව්‍යාපාර :

1. තලාතු මිනිරන් ශුද්ධ කිරීම
2. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම
3. ඩ්‍රයික්ලීන් කිරීම
4. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම
5. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම
6. තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම
7. හුණුගල් හෝ හිරිගල් නිපදවීම
8. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු නිපදවීම
9. මෝර තෙල් සකස් කිරීම
10. බෝට්ටු තැනීම
11. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම
12. ලෝහ වර්ග පෑස්සීම
13. මෝටර් වාහන අලුත්වැඩියාව

14. මෝටර් වාහන සේවා කිරීම
15. යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම
16. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම
17. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
18. මෝටර් වාහන බෝඩි තැනීම
19. කෘමිනාශක, දිලීරනාශක, පැළෑටි හෝ පළිබෝධනාශක නිපදවීම
20. විෂබීජ නාශක නිපදවීම
21. මදුරු දඟර නිපදවීම
22. දැව ආරක්ෂණ නිපදවීම
23. ගල්තාර හෝ බිටුමන්මය ද්‍රව්‍ය නිපදවීම
24. වීදුරු භාණ්ඩ නිපදවීම
25. වීදුරු කැඩපත් නිපදවීම
26. යකඩ තහඩු ගැල්වනයිස් කිරීම
27. පාස්සන ඊයම් නිපදවීම
28. ඇළුමිනියම් භාණ්ඩ නිපදවීම
29. කටු කම්බි නිපදවීම
30. කම්බි ඇණ නිපදවීම
31. කාබන් කඩදාසි හෝ යතුරුලියන පටි (රිබන්) නිපදවීම
32. බෙලෙක් බඳුන්, වානේ රිප්ප හෝ කාබනික ටැංකි නිපදවීම
33. ජීඅයි බාල්දි නිපදවීම
34. වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ නිපදවීම
35. වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ අලුත්වැඩියා කිරීම
36. බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම
37. යන්ත්‍රෝපකරණ නිපදවීම
38. විදුලි භාණ්ඩ නිපදවීම
39. රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම
40. සංචායන බැටරි නිපදවීම
41. ට්‍රැක්ටර් රථ එකලස් කිරීම
42. රේඩියේටර් නිපදවීම
43. ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම
44. වියලි කෝෂ බැටරි නිපදවීම
45. වී මෝල්
46. මිනී පෙට්ටි තැනීම
47. දුරකතන නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම
48. විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව හෝ එකලස් කිරීම
49. පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම හෝ අළුත්වැඩියාව

12 - 178/8

පස්සර ප්‍රාදේශීය සභාව

පස්සර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති කිසියම් හෝටල්, ආපනශාලා හා නවාතැන් පොළවල් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2025 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන වෙළඳ බලපත්‍ර මත ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2024.09.24 දිනැති තීරණ පොතේ තීරණ අංක 2361 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ පස්සර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ පස්සර ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව වෙළෙඳ බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී වෙළඳ ව්‍යාපාරය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තාවූ ද වන අවස්ථාවක ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන් පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන් පොළෙහි හෝ 2025 වර්ෂය තුළ ලැබීම් වලින් සියයට එකක් (1%) විය යුතු බවටත් තීරණය කරමි.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ පස්සර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා 2025 වර්ෂයේදී ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මත ගාස්තුවක් අය කරනු ලබන බවත් එම බලපත්‍රය මාර්තු 31ට පෙර ලබා ගත යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරමි.

ඩබ්ලිව්. එස්. එම්. එන්. වනසිංහ,
සභා ලේකම්
පස්සර ප්‍රාදේශීය සභාව.

12 - 178/9

පස්සර ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2024.09.24 දිනැති තීරණ පොතේ තීරණ අංක 2362 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 154 (1) වැනි වගන්තියෙන් පස්සර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පස්සර බල ප්‍රදේශය ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් 1% කට සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු, තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට තීරණය කරමි.

ඩබ්ලිව්. එස්. එම්. එන්. වනසිංහ,
සභා ලේකම්
පස්සර ප්‍රාදේශීය සභාව.

12 - 178/10

පස්සර ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2024.09.24 දිනැති තීරණ පොතේ තීරණ අංක 2363 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පස්සර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පස්සර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ගොඩනැගිලි ඉදි කිරීමට හෝ ස්ථාවර *නැනහොන්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැතිනම්; හෝ
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක; හෝ
(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යට වී ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 10 : 1 ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එකී සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2025 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් 1% ක වාර්ෂික බද්දක් පස්සර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කරමි.

ඩබ්ලිව්. එස්. එම්. එන්. වනසිංහ,
සභා ලේකම්
පස්සර ප්‍රාදේශීය සභාව.

12 - 178/11

පස්සර ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2024.09.24 දිනැති තීරණ පොතේ තීරණ අංක 2364 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 යටතේ (3) හා (5) වගන්ති යටතේ මෙම බදු මුදල 1988.08.23 අංක 520/7 සම්මත අතුරු ව්‍යවස්ථා 40 ප්‍රකාරව පස්සර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2025 වර්ෂයේදී පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු II තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අයකිරීමට තීරණය කරමි.

ඩබ්ලිව්. එස්. එම්. එන්. වනසිංහ,
සභා ලේකම්
පස්සර ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
(1) (i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
	(අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
(iii)	සෑම කරත්තයක් සඳහා	20 0
(iv)	සෑම අත් කරත්තයක් සඳහා	10 0
(v)	සෑම රික්ෂෝවක් සඳහා	7 50
(vi)	සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
(vii)	සෑම ඇතකු සඳහා	50 0

(2) විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යයක් සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

(3) බලු කරපටි එකක් - රු. 150.00

වාහන ගාල් කිරීමේ ගාස්තු -

		රු.	*මාසික ගාස්තුව* *රු. ශත*
(4)	(i) ත්‍රිරෝද රථ සඳහා - දිනකට	20.00	600 0
	(ii) වෑන් රථ සඳහා - මාසික ගාස්තුව		400 0
	(iii) ලොරි රථ සඳහා - මාසික ගාස්තුව		500 0

12 - 178/12

පස්සර ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා සභාව සතු දේපළ කුලියට දීමේ ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2024.09.24 දිනැති තීරණ පොතේ තීරණ අංක 2365 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 1988.08.23 දිනැති අංක 520/7 හා 2013.06.28 දිනැති අංක 1816/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති අතුරු ව්‍යවස්ථා අනුව පස්සර ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ වාහනයක් පහත උපලේඛනවල සඳහන් කටයුත්තක් සඳහා කුලියට ගැනීමේදී එක් දිනකට/පැයකට එහි II වන තීරුවේ සඳහන් අනුරූපිත කුලිය හා III තීරුවේ සඳහන් තැන්පත් ගාස්තුව 2025.01.01 දින සිට පනවා අයකිරීමට තීරණය කරමි.

ඩබ්ලිව්. එස්. එම්. එන්. වනසිංහ,
සභා ලේකම්
පස්සර ප්‍රාදේශීය සභාව.

01. පැරණි නගර ශාලාව සඳහා ගාස්තු අය කිරීම -

I තීරුව	*II තීරුව* *(දිනකට)* *රු. ශත*	*III තීරුව* *(දිනකට)* *රු. ශත*
➢ විවාහ උත්සවයක් සඳහා	20,000 0	7,500 0
➢ ව්‍යාපාරික කටයුත්තක් සඳහා	6,300 0	5,000 0
➢ සේල් ව්‍යාපාර සඳහා (නගරයෙන් පිට)	17,500 0	10,000 0
➢ සේල් ව්‍යාපාර සඳහා (නගරය තුළ)	12,000 0	10,000 0
➢ රැස්වීමක් සඳහා (දේශපාලන හා දේශපාලන නොවන)	5,000 0	5,000 0
➢ සම්මන්ත්‍රණ සඳහා	5,000 0	5,000 0
➢ පුහුණු වැඩමුළුවක් සඳහා	5,000 0	5,000 0
➢ සංචාරක නඩයක් සඳහා නවාතැන්	5,000 0	5,000 0
➢ රජයේ කාර්යාල උත්සව සඳහා	5,000 0	5,000 0
➢ පාසල්/පෙර පාසල් ළමුන්ගේ වැඩසටහන්	4,500 0	
➢ ආගමික වැඩසටහන් සඳහා	6,000 0	5,000 0
➢ කඳවුරු/රාත්‍රී වැඩමුළු සඳහා	6,000 0	5,000 0
➢ ප්‍රදර්ශන සඳහා	4,500 0	

I තීරුව (දිනකට)	*II තීරුව* රු. ශත	*III තීරුව* රු. ශත
02. නව නගර ශාලාව (නව ශ්‍රවනාගාරය) සඳහා ගාස්තු අය කිරීම :		
➢ විවාහ උත්සව සඳහා	36,500 0	15,000 0
➢ උත්සව සඳහා ශ්‍රව්‍ය උපකරණ	3,000 0	
➢ රජයේ කාර්යාල උත්සව සඳහා ශ්‍රව්‍ය උපකරණ සහිතව	14,500 0	10,000 0
➢ සම්මන්ත්‍රණ සඳහා දිනකට (ශ්‍රව්‍ය උපකරණ සහිතව)	15,000 0	10,000 0
➢ රැස්වීමක් සඳහා (දේශපාලන හා දේශපාලන නොවන)	13,500 0	5,000 0
➢ වෙළඳ ප්‍රදර්ශන සඳහා	25,000 0	10,000 0
➢ පසුබිම් ප්‍රොජෙක්ටර් ස්ක්‍රීන් එක සඳහා (ස්ක්‍රීන්)	2,000 0	
➢ පාසැල්/පෙර පාසල් ළමුන්ගේ වැඩසටහන්	9,500 0	2,500 0
➢ ආගමික වැඩසටහන්	10,000 0	2,000 0
➢ පුහුණු වැඩසටහන් සඳහා	6,500 0	
➢ කඳවුරු/රාත්‍රී වැඩමුළු සඳහා	10,000 0	5,000 0
➢ ශ්‍රවනාගාර ඉහළ විවෘත කොටස ව්‍යාපාර කටයුතු සඳහා දිනකට	8,500 0	
03. ක්‍රීඩා පිටිය සඳහා ගාස්තු අය කිරීම :		
1. පාසල්/පෙර පාසල් කටයුතු සඳහා	3,500 0	
2. ක්‍රීඩා උත්සව සඳහා (රජයේ නොවන)	4,500 0	
3. ක්‍රීඩා උත්සව සඳහා (රජයේ ආයතන)	3,000 0	
4. ව්‍යාපාර කටයුතු සඳහා	6,000 0	10,000 0
5. කානිවල් /සංගීත ප්‍රසංග සඳහා	8,000 0	15,000 0
5. තොරන්	4,500 0	5,000 0
7. විදුලිය සඳහා (සාමාන්‍ය විදුලි)	2,500 0	
8. විශේෂ සංදර්ශන, කානිවල් සඳහා විදුලිය	3,500 0	
9. ක්‍රීඩා සමාජ සඳහා	3,000 0	
10. රැස්වීමක් සඳහා (දේශපාලන හා දේශපාලන නොවන)	15,000 0	
11. වෙනත් පොදු කටයුත්තක් සඳහා	2,500 0	
04. වාහන සහ යන්ත්‍රෝපකරණ කුලියට දීම :		
1. චෙන්සෝ යන්ත්‍රය - දිනකට ගාස්තු	5,000 0	5,000 0
2. ට්‍රැක්ටර් රථය හා ට්‍රේලරය පැය 8ක් සඳහා	4,000 0	2,000 0
3. තලකම්පනය - දිනකට	5,000 0	5,000 0
4. ගල්රෝල - දිනකට	5,000 0	5,000 0
5. කොන්ක්‍රීට් මිශ්‍රණය කුලියට දීම	4,500 0	4,500 0
6. බැකෝ යන්ත්‍රය අවම පැය 03ක් සඳහා එක් පැයකට ඉන්ධන සහිතව	5,560 0	
7. මෝටර් ග්‍රේඩරය අවම පැය 03ක් සඳහා එක් පැයකට ඉන්ධන සහිතව	7,245 0	

05 ජල බවුසරය සඳහා ගාස්තු :

		රු. ශත	
1.	ලීටර් 2,000 ජල බවුසරය නගර සීමාව තුළ	3,500 0	
2.	ලීටර් 4,000 ජල බවුසරය නගර සීමාව තුළ	6,000 0	
3.	ලීටර් 6,000 ජල බවුසරය නගර සීමාව තුළ	8,500 0	
	නගර සීමාවෙන් පිටත ප්‍රවාහන ගාස්තුව කිලෝ මීටරයක් සඳහා	150 0	බැගින්
	කිලෝ මීටර් 10ට වඩා වැඩි දුරක් සඳහා අවස්ථානුකූල පරිදි තීරණය කරන මුදල		
4.	එක් රාත්‍රියකට ජල බවුසරය රඳවා ගැනීමේ ගාස්තුව	2,000 0	

* ඉන්ධන මිලෙහි විචල්‍ය අනුව සභාව තීරණය කරන ආකාරයට කාර්මික නිලධාරිතුමාගේ නිර්දේශය මත එදිනට තිබිය යුතු ඉන්ධන මිල අනුව ප්‍රවාහන ගාස්තු ගෙවීම ගණනය කෙරේ.

06. පුහුල්වත්ත වැව භූමියට ඡායාරූප ගැනීම සඳහා වෙන් කිරීමේ ගාස්තු රු. 2,000 0

07. නිල නිවාස කුලිය මූලික වැටුපෙන් 12.5% ක් අය කළ යුතුයි.

12 - 178/13

පස්සර ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා මළ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ සේවා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2024.09.24 දිනැති තීරණ පොතේ තීරණ අංක 2366 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 03 වගන්තිය, 126(ix) (ආ) වගන්තියේ විධිවිධාන අනුව පස්සර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය පරෝහණය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා වූ පොදු පරිපාලන අධිකාරිය වන පළාත් පාලන ආයතන මළ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ සේවාව පහත සඳහන් ගාස්තු යටතේ 2025.01.01 දින සිට පනවා අයකිරීමට තීරණය කරමි.

ඩබ්ලිව්. එස්. එම්. එන්. වනසිංහ,
සභා ලේකම්
පස්සර ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

		රු. ශත	*රු. ශත*
(1)	ගලි බවුසර් ගාස්තුව එක් වාරයකට වරිපනම් සීමාව තුළ	11,480 0	
	ගලි බවුසර් ටැංකිය පිරිසිදු කිරීම හා නඩත්තු ගස්තු	1,280 0	
	සේවක ගාස්තු	1,500 0	
	එක් වාරයක් සඳහා අය කරනු ලබන මුළු ගලි බවුසර් ගාස්තුව		14,260 0
(2)	ගලි බවුසරය එක් වාරයකට වරිපනම් සීමාවෙන් පිටත	14,480 0	
	ගලි බවුසර් ටැංකිය පිරිසිදු කිරීම හා නඩත්තු ගස්තු	1,280 0	
	සේවක ගාස්තු	1,500 0	
	එක් වාරයක් සඳහා අය කරනු ලබන මුළු ගලි බවුසර් ගාස්තුව		15,260 0

		රු. ශත	රු. ශත
(3)	ගලි බවුසර් ගාස්තුව එක් වාරයකට පස්සර බල ප්‍රදේශයෙන් පිටත	15,000 0	
	ගලි බවුසර් ටැංකිය පිරිසිදු කිරීම හා නඩත්තු ගස්තු	1,280 0	
	සේවක ගාස්තු	1,500 0	
	එක් වාරයක් සඳහා අය කරනු ලබන මුළු ගලි බවුසර් ගාස්තුව		17,780 0

- ප්‍රවාහන ගාස්තු දුර අනුව එක් කිලෝමීටරයක් සඳහා රු. 150.00 බැගින් අය කෙරේ.

12-178/14

පස්සර ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා අයාලේ යන ගවයින් හා සතුන් පිළිබඳ නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2024.09.24 දිනැති තීරණ පොතේ තීරණ අංක 2367 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66(1), (2) හා (3) වන වගන්ති ප්‍රකාර පස්සර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියලුම පොදු මාර්ගවල හෝ පොදු ස්ථානයක හෝ ඒ අවට බැඳ දිගේලි කර හෝ අයාලේ යන හෝ ගවයින්, මී ගවයින්, එළුවන්, ඌරන් ආදී සතුන් ඇල්ලීමටත්, එසේ අල්ලාගනු ලබන සතුන් ගාල් කිරීමටත්, එසේ ගාල් කරනු ලබන සතුන් නිදහස් කිරීම සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමට සහ අයාලේ යන සතුන් අල්ලා දින 07 ක් ඇතුළත අයිතිකරුවන් තම සතුන් නිදහස් කර නොගතහොත් එම කාලයට පසුව එකී සතුන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා අදාළ ගාස්තු සහ වෙන්දේසි කිරීමේ වියදම් එමගින් අය කිරීමටත් තීරණය කරමි.

අයාලේ යන සතුන් අල්ලා දින 07ක් ඇතුළත අයිතිකරුවන් තම සතුන් නිදහස් කර නොගතහොත්, එම කාලයට පසුව එකී සතුන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා අදාළ ගාස්තු සහ වෙන්දේසි කිරීමේ වියදම් එමගින් අයකර ගන්නා බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එස්. එම්. එන්. වනසිංහ,
සභා ලේකම්
පස්සර ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

*	ඇල්ලීමේ ගාස්තු එක් දිනකට	-	රු. 1,000.00
*	වැඩිවන සෑම දිනකට ම	-	රු. 1,000.00 බැගින් කණු ගාස්තු.

12 - 178/15

පස්සර ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා අයදුම්පත් හා වෙනත් සේවා ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2024.09.24 දිනැති තීරණ පොතේ තීරණ අංක 2368 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පස්සර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, සම්මත අතුරු ව්‍යවස්ථා අංක 520/7, 1988.08.23 හා 2013.06.28 අංක 1816/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් ප්‍රකාශයට පත්කර, පස්සර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවලට අනුව පස්සර ප්‍රාදේශීය සභාව විසින් සපයන සේවාවන් සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2025.01.01 දින සිට නැවත දන්වන තුරු අය කිරීමට තීරණය කරමි.

ඩබ්ලිව්. එස්. එම්. එන්. වනසිංහ,
සභා ලේකම්
පස්සර ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

		රු. ශත
01.	පුස්තකාල සාමාජික අයදුම්පත්‍රයක් සඳහා	50 0
	1. පුස්තකාල සාමාජික ගාස්තු (වැඩිහිටි)	300 0
	2. පුස්තකාල සාමාජික ගාස්තු (ළමා)	150 0
02.	1. විද්‍යුත් පුස්තකාල සාමාජික අයදුම්පත්‍රයක් සඳහා	50 0
	2. විද්‍යුත් පුස්තකාල සාමාජික ගාස්තු පැයකට	50 0
03.	පුස්තකාල ප්‍රමාද ගාස්තුව දිනකට (එක් පොතක් සඳහා)	10 0
04.	පෙර පාසල් ඇතුළත් වීමේ ගාස්තුව	1,500 0
05.	වරිපනම් නම් වෙනස් කිරීමට අදාළ අයදුම්පත්‍රයක් නිකුත් කිරීම සඳහා	300 0
06.	වරිපනම් ලේඛනයේ නම් වෙනස් කිරීම සඳහා	1,250 0
07.	වරිපනම් ලේඛනයේ සහතිකයක් සඳහා	500 0
08.	වරිපනම් ලේඛන සෙවීමේ ගාස්තු වර්ෂයකට රු. 50.00 බැගින්	
09.	පාපැදි බලපත්‍ර සඳහා	100 0
10.	**අලෙවි ප්‍රවර්ධන වැඩසටහන සඳහා සේවා ගාස්තු** -	
	1. අලෙවි ප්‍රවර්ධන වැඩසටහන සඳහා දිනකට	3,000 0
	2. පැය 2 ට වැඩි පැය 24 ට අඩු වැඩසටහන් සඳහා (දිනකට)	1,000 0
	3. තාවකාලික වෙළෙඳ කුටියක් පැවැත්වීමට එක් දිනක් සඳහා	3,000 0
	4. වෙනත් වෙළෙඳාමක් සඳහා (දිනකට)	750 0
11.	**භාණ්ඩ සැපයීම** -	
	i. කුඩා මේසයක්	250 0
	ii. බුෆේ සෙට් එකක් සඳහා	1,500 0
	iii. පෝසිලේන් පිඟන් එකක් සඳහා	5 0
	iv. වීදුරු එකක් සඳහා	5 0
	v. ප්ලාස්ටික් පුටු එකක් සඳහා	5 0
	vi. නගර ශාලාව තුළ ශබ්ද විකාශන සැපයීම සඳහා	2,500 0
	vii. අතුරුපස කප්	3 0
	* භාණ්ඩ කැඩී බිඳී ගිය අවස්ථාවක දී භාණ්ඩයේ වර්තමාන වටිනාකම තැන්පත් මුදලින් අයකරනු ලැබේ.	
12.	**ආදාහනාගාර සේවා සැපයීම** -	
	1. පස්සර බල ප්‍රදේශය තුළ	13,750 0
	2. බල ප්‍රදේශයෙන් පිටත	15,750 0
	3. භූමදාන කටයුතු	1,500 0
13.	උත්සව අවස්ථාවල ගවයින්/එළුවන් ඝාතනය කිරීම සඳහා ගාස්තු	5,500 0
14.	ක්ලෝරීන් හිස් බකට් විකිණීමේ ගාස්තු	250.00

පස්සර ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පිළිබඳ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2024.09.24 දිනැති තීරණ පොතේ තීරණ අංක 2369 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව ඉහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122, 126 වැනි වගන්තිවලින් පස්සර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ගරු විෂය භාර අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලද පස්සර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති 2013.06.28 වැනි දින අංක 1816/43 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාරව පස්සර ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් විදියකට, පාරකට, ඇළකට හෝ අහසට පෙනෙන පරිදි ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2025 වර්ෂය සඳහා පනවා අයකර ගැනීමට තීරණය කරමි.

ඩබ්ලිව්. එස්. එම්. එන්. වනසිංහ,
සභා ලේකම්,
පස්සර ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

අ. අ.	*ප්‍රචාරක දැන්වීම් විස්තරය*	*2025 වර්ෂයේ අවසර පත්‍රය සඳහා අය කරන ගාස්තු*		
		දින 01 සිට දින 15 දක්වා *රු. ශත*	*දින 15 සිට දින 30 දක්වා* *රු. ශත*	*මාසයක කාලයකට වැඩි හෝ වර්ෂයක කාලයක් සඳහා* *රු. ශත*
1.	බිත්තියක හෝ තාප්පයක ප්‍රදර්ශනය කරන එක් හතරැස් අඩියකට (චිත්‍රපටි පෙන්වීම සම්බන්ධ දැන්වීම් නොවන)	25.00	50.00	60.00
2.	පුවරුවක ප්‍රදර්ශනය කරන වර්ග අඩියක ප්‍රචාරක දැන්වීම සඳහා	60.00	100.00	150.00
3.	යම් තැනැත්තෙකු විසින් උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවිකොට ඇති ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට (වෙළඳ ව්‍යාපාර සඳහා භාවිතා කරන වාහන සඳහා අදාළ නොවේ.)	25.00	50.00	60.00
4.	චිත්‍රපට පෙන්වීම සම්බන්ධ එක් ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට	20.00	30.00	40.00
5.	ප්‍රචාරක බැනරයක් සඳහා වර්ග අඩියකට	35.00	50.00	100.00
6.	දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කරන විද්‍යුත් ප්‍රචාරක එම පුවරුවක් සඳහා වර්ග අඩියකට	60.00	100.00	250.00

පස්සර ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා පෙරසැරි ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2024.09.24 දිනැති තීරණ පොතේ තීරණ අංක 2370 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව ඉහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1988.08.23 දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළාත් පාලන, නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කරනු ලදුව පස්සර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ පනවා පස්සර බල ප්‍රදේශයේ පස්සර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් කොටස් කිරීම, අලුතින් තාප්ප ඉදිකිරීම, අලුතින් ගොඩනැගිලි ඉදිකිරීම, පවත්නා ගොඩනැගිලි අළුත්වැඩියාව සහ අනුකූලතා සහතික නිකුත් කිරීම වැනි කාර්යයන්හි දී පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2025 වර්ෂය සඳහා පනවා අයකිරීමට තීරණය කරමි.

පස්සර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් කොටස් කිරීම, අලුතින් තාප්ප ඉදිකිරීම, අලුතින් ගොඩනැගිලි ඉදිකිරීම, පවත්නා ගොඩනැගිලි අලුත්වැඩියාව සහ අනුකූලතා සහතික නිකුත් කිරීම වැනි කාර්යයන්හි දී පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2025 වර්ෂය සඳහා පනවා අයකිරීමට තීරණය කරන ලද බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එස්. එම්. එන්. වනසිංහ,
සභා ලේකම්,
පස්සර ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

		රු. ශත
01.	වීථි රේඛා හා නොපවරා ගැනීමේ අයදුම්පත්‍රයක් නිකුත් කිරීම සඳහා	200 0
02.	වීථි රේඛා හා නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම සඳහා පරීක්ෂණ ගාස්තු	750 0
03.	වීථි රේඛා හා නොපවරා ගැනීමේ සහතිකයක් නිකුත් කිරීම සඳහා	1750 0
04.	ගොඩනැගිලි අයදුම්පත්‍රයක් සඳහා	900 0
05.	ගොඩනැගිලි සැලසුම වර්ෂයකින් දීර්ඝ කිරීම	3,500 0
06.	අනුමත ගොඩනැගිලි සැලසුමක දෙවැනි පිටපතක් සහතික කිරීම සඳහා	2,750 0
07.	සංවර්ධන කාර්යය සඳහා බලපත්‍රයක් ලබාගැනීමේ අයදුම්පත්‍රය සඳහා (ඉඩමක් අනු කොටස්වලට බෙදීම)	400 0
08.	ඉඩම් හා ගොඩනැගිලි සහ වෙනත් කාර්යයන් සඳහා වාර්තාවක් හෝ ලිපියක් ලබා දීමේ ගාස්තු	500 0
09.	අනුකූලතා සහතික නිකුත් කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	150 0
10.	ගොඩනැගිලි පෙරසැරි ගාස්තු අයකිරීම : නාගරික සීමාව තුළ නාගරික සංවර්ධන ආඥාපනත යටතේ සහ නගර සීමාවෙන් පිටත නිවාස හා නගර නිර්මාණ ආඥාපනත යටතේ ද ගාස්තු අය කෙරේ.	

10. **අනුකූලතා සහතික නිකුත් කිරීම** (භූමි ප්‍රමාණයට අනුව වර්ග මීටර ප්‍රමාණයට තීරණය කරනු ලැබේ.)

වර්ග මීටර් ප්‍රමාණය	*වර්ග මීටරයට ගාස්තු (නිවාස)* *රු. ශත*	*ව්‍යාපාරික* *රු. ශත*
0 - 400	4,000 0	4,500 0
401 - 800	4,500 0	5,000 0
801 - 1200	5,000 0	5,500 0
1201 - 1600	5,500 0	6,000 0
1601 - 2000	6,000 0	6,500 0
2001 - 2400	6,500 0	7,000 0

- වැඩිවන සෑම වර්ග කිලෝමීටරයකට රු. 25.00 බැගින් අය කරනු ලැබේ.

11. ඉඩම් කට්ටි කිරීමේ පෙරසැරි ගාස්තු :

	රු. ශත
1. ඉඩම් කට්ටි කිරීම සඳහා අනුමත කිරීමේ ගාස්තු එක් ඉඩම් කට්ටියක් සඳහා (ආදායම 80% පරිපාලන ගෙවීම් සඳහා 20%)	3,000 0
2. ආවරණ අනුමැතිය සඳහා ඉඩම් කට්ටි එකක් සඳහා	3,000 0

12. නාගරික සීමාවෙන් පිටත ඉඩම් කට්ටි කිරීමේ අවම ඉඩම ප්‍රමාණය :

පස්සර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නාගරික සීමාවෙන් පිටත ගොඩනැගිලි ඉදිකිරීමේදී ඉඩමේ බෑවුම් ආනතිය 60^{0} ට වැඩි භූමි සඳහා ඉඩම් කට්ටියක අවම භූමි ප්‍රමාණය පර්චස් 30 විය යුතු අතර 60^{0} - 45^{0}කට අඩු ආනතියකින් යුතු භූමි සඳහා ඉඩම් කට්ටියක අවම භූමි ප්‍රමාණය පර්චස් 20 ක් විය යුතුවේ. 45^{0} අඩු පර්චස් 15ක් විය යුතුයි.

13. **දුරකථන විදුලි සංදේශ කුළුණු ඉදිකිරීමේ පෙරසැරි ගාස්තු :**

	රු. ශත
I. උස මීටර් 05 සිට 20 දක්වා	2,00,000 0
II. උස මීටර් 20 සිට 40 දක්වා	2,50,000 0
III. උස මීටර් 40 සිට 50 දක්වා	3,00,000 0
IV. වැඩිවන මීටරයක් සඳහා රු. 5,000.00 බැගින් ආවරණ අනුමැතිය සඳහා (උස සෑම මීටර් 05කට)	15,000 0

14. **පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීමේ පරීක්ෂණ ගාස්තු :**

උපරිමය (ආයෝජන මුදල)

01. රු. 250,000 හෝ ඊට අඩු	3,000 0
රු. 250,001 සිට 500,000	3,750 0
රු. 500,001 සිට 1000,000	5,000 0
රු. 1000,001ට වැඩි	10,000 0
02. පරිසර ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත්‍ර ගාස්තු	100 0
03. පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පත්‍ර සඳහා	100 0
04. පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු	4,500 0

14. නාගරික සීමා බල ප්‍රදේශයෙන් පිට අනවසර ඉදිකිරීම් නීත්‍යානුකූල කිරීමේ දී එම ගොඩනැගිල්ල සඳහා දඩ මුදල් අය කිරීම :

		රු. ශත
I.	නිවාස සඳහා වර්ග අඩියක්	8 0
II.	ව්‍යාපාරික ස්ථානයක් සඳහා වර්ග අඩියක්	10 0
III.	අනවසර තාප්ප සඳහා මීටරයක්	700 0
IV.	අනවසර බැමි සඳහා මීටරයක්	700 0

12 - 178/18

පස්සර ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ගෙඩනැගිලි ඉදිකිරීම් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2024.09.24 දිනැති තීරණ පොතේ තීරණ අංක 2371 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21,44 වගන්තියෙන් පස්සර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හා අංක 1816/43 දරන පළාත් පාලන *අති විශේෂ ගැසට් පත්‍රයේ* ගරු ඌව පළාත් සභා විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කර ප්‍රකාශයට පත්කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 08, 11 වන කොටස් යටතේ පාරවල් හා මංමාවත්වල බාධක අවහිර කිරීම් හා අලාභහානි කිරීම වැලැක්වීම හා ගොඩනැගිලි තැනීම සහ වැඩ කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි පස්සර ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම් හා අනවසර ඉදිකිරීම් සඳහා උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු අය කිරීමට තීරණය කරමි.

ඩබ්ලිව්. එස්. එම්. එන්. වනසිංහ,
සභා ලේකම්
පස්සර ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

නිවාස හා නගර නිර්මාණ ආඥාපනත යටතේ පෙරසැරි ගාස්තු අය කිරීම :

ස්ථාවර ගාස්තු	*නිවාස* *රු. ශත*	*ව්‍යාපාරික* *රු. ශත*
වර්ග අඩි 1200ට අඩු	5,000.00	7,000.00
වර්ග අඩි 1200 - 1500	5.00	6.00
වර්ග අඩි 1500 - 2000	7.50	8.50
වර්ග අඩි 2000 - 3000	10.00	11.00
වර්ග අඩි 3000ට වඩා	12.50	13.50

*** පරීක්ෂණ ගාස්තු :**

		රු. ශත
1.	ගොඩනැගිලි අයදුම්පත්‍ර පරීක්ෂා කිරීම	600 0
2.	මායිම් තාප්ප හා රැඳවුම් බැම්	500 0
3.	අනුකූලතා සහතික ලබාදීමේ පරීක්ෂාව	600 0
4.	අනුබෙදුම් පරීක්ෂාව	1,000 0
5.	පිඹුර අනුමත කිරීම	500 0

*** නගර සීමාවෙන් පිටත ඉදිකර ඇති නිවාස හා ව්‍යාපාරික ස්ථාන සඳහා දඩ මුදලක් අය කිරීම**

		වර්ග අඩියක් සඳහා
1.	නිවාස හා ව්‍යාපාරික ස්ථාන අත්තිවාරම දක්වා පමණක් ඇතිවිට	රු. 1.50 / 2.00
2.	වහළ දක්වා බිත්ති ඉදිකර ඇතිවිට	රු. 2.00 / 2.50
3.	වහළ සමග බිත්ති ඉදිකර ඇතිවිට	රු. 2.50 / 3.00
4.	වහළ සමග බිත්ති වැඩ අවසන් කර ඇති වැඩ අවසන් කොට ඇතිවිට	රු. 3.00 / 4.00
5.	සියලු වැඩ අවසන් කොට තීන්ත ආලේප කොට ඇතිවිට	රු. 4.00 / 5.00

*** කුඹුරු ඉඩමක් ගොඩකිරීම සඳහා නිර්දේශ ලබාදීම සඳහා පරීක්ෂා කිරීමේ ගාස්තු :**

	රු. ශත
පර්චස් 1 ක් සඳහා	3,500 0

* දූව ප්‍රවාහනය කිරීමේ ගාස්තු :

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් සභාව සතු මාර්ග භාවිතා කර දූව ප්‍රවාහනය සිදු කිරීමේ දී මාර්ගයට අලාභහානියක් සිදුවුවහොත් තැන්පත් මුදලින් එය පියවා ගැනීමටත්, එසේ අලාභහානියක් සිදුනොවුනහොත් තැන්පත් මුදලින් 10%ක පරීක්ෂණ ගාස්තුවක් අය කර තැන්පත් මුදල නිදහස් කිරීමටත් කටයුතු කරනු ලැබේ.

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් ඊ. එම්. කේ. එන්. ලක්මාලි වන මා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) හා 146(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2025 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පිළිබඳව 2024 වර්ෂයෙහි ඔක්තෝබර් මස 08 වැනි දින තීරණ අංක 2820 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඊ. එම්. කේ. එන්. ලක්මාලි,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 453/7 හා 1987.05.12 දිනැති *ගැසට් පත්‍රය* යටතේ සංස්ථාපිත බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2021 වර්ෂයේ දී සිදු කරන ලද වරිපනම් ප්‍රතිශෝධනය මත එම තක්සේරුව සත්‍යෝක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා කලින් වර්ෂයේ බලපැවැත් වූ අනුප්‍රමාණයට වන වාර්ෂික වටිනාකමින් සියයට පහක (5%) වරිපනම් බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අයකරගත යුතු බවටත් මම තීරණය කරමි.

තව ද, 2025 වර්ෂයෙහි පහත උපලේඛනයෙ හි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර වාර්ෂික වරිපනම් බද්ද 2025 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව වෙනුවෙන් තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවට ගෙවන්නේ නම් එක කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%ක) වට්ටමක් ද, බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත්, තව ද බදු මුදල එක් එක් කාර්තුව අවසානයේ නොගෙවනු ලබන අවස්ථාවක දී එම මුදල අයකර ගැනීම පිණිස නිකුත් කරනු ලබන බලපත්‍රයක් යටතේ හිස් බිම් හා නිවාස ස්ථාන දේපළ සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට පහළොවක (15%) වරෙන්තු ගාස්තුවක් ද හිස් බිම් හා නිවාස ස්ථාන නොවන දේපළ සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට විස්සක (20%) වරෙන්තු ගාස්තුවක් ද අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව කාර්තුව	*II වැනි තීරුව* ගෙවිය යුතු දිනය	*III වැනි තීරුව* වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය
පළමු වැනි කාර්තුව	2025 මාර්තු 31	2025 ජනවාරි 31
දෙවන වැනි කාර්තුව	2025 ජූනි 30	2025 අප්‍රේල් 30
තුන්වන වැනි කාර්තුව	2025 සැප්තැම්බර් 30	2025 ජූලි 31
හතරවන වැනි කාර්තුව	2025 දෙසැම්බර් 31	2025 ඔක්තෝබර් 31

12-195/1

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් ඊ. එම්. කේ. එන්. ලක්මාලි වන මා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 149 වන වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂයෙහි ඔක්තෝබර් මස 08 වෙනි දින තීරණ අංක 2821 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

2025 වර්ෂය සඳහා පනවන ලද බලපත්‍ර ගාස්තු 2025 මාර්තු මස 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරමි.

ඊ. එම්. කේ. එන්. ලක්මාලි,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 147 හි වගන්තිය හා 149 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2025 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විටදී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2024 වර්ෂයේ ලැබීම්වලින් සියයට එකක් (1%) බලපත්‍ර ගාස්තුව ලෙස 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මම තීරණය කරමි.

උපලේඛනය

	I තීරුව	*II තීරුව*		
	බලපත්‍රයේ ස්වභාවය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන විට*	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි මුත් රු. 1,500 ට වැඩි නොවන විට*	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	මල් ශාලාවක් පවත්වාගෙන යාම හා සැරසිලි සිදු කිරීම	500 0	750 0	1,000 0
2.	හෝටල් හා ලැගුම්හල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	භෝජන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
5.	මස් විකිණීම	500 0	750 0	1,000 0
6.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I තීරුව බලපත්‍රයේ ස්වභාවය	*II තීරුව*		
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන විට	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි මුත් රු. 1,500 ට වැඩි නොවන විට*	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
පීඩාකාරී ව්‍යාපාර :				
7.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
8.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
9.	සම් විකිණීම	500 0	750 0	1,000 0
10.	සත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
11.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
12.	පශු වෛද්‍ය ගිලන් හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
13.	විකිණීම සඳහා නරක්වනසුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
14.	කරවල, ලුණුමාලු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
15.	පොල්කටු, අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
16.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17.	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
18.	පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
19.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
20.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	අළුත් හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
22.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
23.	ගෘහභාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
24.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
25.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
26.	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
27.	රසකැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
28.	පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0
29.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
30.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
31.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
32.	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
33.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
34.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
35.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
36.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
37.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
38.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංශභෝග, කුළුබඩු හෝ කිරිපිටි ඇඹරීම හා ඇඹරුම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
39.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
40.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
41.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0

		I තීරුව	*II තීරුව*	
		බලපත්‍රයේ ස්වභාවය		
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන විට	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි මුත් රු. 1,500 ට වැඩි නොවන විට*	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
42.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
43.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
44.	සුවඳ විලවුන් නිපදවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
45.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
46.	ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
47.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
48.	ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
49.	සිමෙන්ති කිලෝග්‍රෑම් 1,000ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
50.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බෙස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.	500 0	750 0	1,000 0
51.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
52.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
53.	පොහොර, හුණුපිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
54.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
55.	ධාන්‍ය හෝ මාංශභෝග කිලෝග්‍රෑම් 250 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
	අන්තරාදායක ව්‍යාපාර :			
56.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු, සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
57.	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
58.	මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
59.	කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
60.	එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
61.	ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
62.	දර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
63.	කළු ගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
64.	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
65.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
66.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
67.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
68.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
69.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
70.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
71.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
72.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම	500 0	750 0	1,000 0

	I තීරුව බලපත්‍රයේ ස්වභාවය	*II තීරුව*		
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන විට	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි මුත් රු. 1,500 ට වැඩි නොවන විට*	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
73.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
74.	පා පැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීමේ වැඩපළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
75.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
76.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
77.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම	500 0	750 0	1,000 0
78.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
79.	ශීත කළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
	පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර :			
80.	දැව ගබඩා කිරීම	500 0	750 0	1,000 0
81.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් කෙදිකිරීම	500 0	750 0	1,000 0
82.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
83.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
84.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
85.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අළුහුණු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
86.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
87.	මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
88.	මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
89.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
90.	බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
91.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
92.	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500 0	750 0	1,000 0
93.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
94.	ප්ලාස්ටික් හා ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
95.	කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
96.	වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
97.	ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
98.	පෙට්‍රල්, ඩීසල්,තෙල් හෝ වෙනත් යම් ඛණිජතෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
99.	කෘෂි රසායන, ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
100.	වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
101.	විදුලි කර්මාන්ත වැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
102.	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
103.	රූපලාවන්‍යාගාරයක් හෝ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් ඊ. එම්. කේ. එන්. ලක්මාලි වන මා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වගන්තියේ (1) වන උප වගන්තිය ප්‍රකාරව 2024 වර්ෂයෙහි ඔක්තෝබර් මස 08 වෙනි දින තීරණ අංක 2822 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

2025 වර්ෂය සඳහා පනවන ලද කර්මාන්ත බදු 2025 වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරමි.

ඊ. එම්. කේ. එන්. ලක්මාලි,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*		
කර්මාන්තය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
1. වඩු වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2. ජා කොටුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3. හඳුන්කුරු හෝ සුවඳ කුඩු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4. රබර් ෂීට් සෑදීමේ හා දුම් ගැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5. නූල් බෝල/ නූල් පන්දු සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6. ලී භාවිතයෙන් තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීමේ හා බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7. සිල්ක් හා කෘත්‍රිම රෙදි විවීම හා විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8. සෙල්ලම් බඩු නිෂ්පාදනය කිරීමේ හා අත්කම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9. රබර් හා කොහු මෙට්‍රස් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10. අභ්‍යාස පොත් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I වැනි තීරුව	*II වැනි තීරුව*		
කර්මාන්තය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
11. ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12. බට පැළැලි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. පොලිෂ් වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. යන්ත්‍ර භාවිතයෙන් තොරව කරනු ලබන කුඩා කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15. අබලි ප්ලාස්ටික් ද්‍රව්‍ය කුඩු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16. වෙළෙඳාම් නාම පුවරු/ප්ලාස්ටික් නාම පුවරු නිෂ්පාදනය හා ප්‍රචාරක ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17. සෙල්ලම් බඩු පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18. අයිස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19. මදුරුනාශක දඟර නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20. විදුලි ලාම්පු ආවරණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21. පින්තූර රාමු පටි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22. පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23. කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24. බිම් මල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-195/3

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු පැනවීම

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් ඊ. එම්. කේ. එන්. ලක්මාලි වන මා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 වන උපවගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂයෙහි ඔක්තෝබර් මස 08 වැනි දින තීරණ අංක 2823 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

2025 වර්ෂය සඳහා පනවන ලද ව්‍යාපාර බදු 2025 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරමි.

ඊ. එම්. කේ. එන්. ලක්මාලි,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් බණ්ඩාරගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2025 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2024 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2025 වර්ෂය සඳහා නියම කොට අයකළ යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව *2024 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම*	*II වැනි තීරුව* *රු. ශත*
රු.6,000/- නොඉක්මවන අවස්ථාවක	අය කිරීමක් නැත
රු.6,000/- ඉක්මවන එහෙත් රු.12,000/- නොඉක්මවන අවස්ථාවක	90 0
රු.12,000/- ඉක්මවන නමුත් රු.18,750/- නොඉක්මවන විට	180 0
රු. 18,750/- ඉක්මවන නමුත් රු.75,000/- නොඉක්මවන විට	360 0
රු. 75,000/- ඉක්මවන නමුත් රු.150,000/- නොඉක්මවන විට	1,200 0
රු.150,000/- ඉක්මවන විට	3,000 0

12-195/4

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා වෙන්දේසිකරුවන් හා බ්‍රෝකර්වරුන් සම්බන්ධව ගාස්තු අය කිරීම

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් ඊ. එම්. කේ. එන්. ලක්මාලි වන මා විසින් 2024 වර්ෂයෙහි ඔක්තෝබර් මස 08 වෙනි දින තීරණ අංක 2824 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඊ. එම්. කේ. එන්. ලක්මාලි,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 1989 අංක 15 දරන වෙන්දේසිකරුවන් හා බ්‍රෝකර්වරුන් පිළිබඳ ආඥාපනතේ විධිවිධානවලට අනුව බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වෙන්දේසිකරුවකු, බ්‍රෝකර්වරයකු හෝ වෙන්දේසිකරුවකු හා බ්‍රෝකර්වරයකු වශයෙන් කටයුතු කරයි නම්, 2025 වර්ෂය සඳහා පහත දක්වා ඇති පරිදි ගාස්තුවක් පනවා අය කිරීමට සුදුසු බවට මම තීරණය කරමි.

	රු. ශත
වෙන්දේසිකරුවෙකු හා බ්‍රෝකර්වරයෙකු	60 0
වෙන්දේසිකරුවෙකු	50 0
බ්‍රෝකර්වරයකු	50 0

12-195/5

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා බනිජ තෙල් ආඥාපනත යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් ඊ. එම්. කේ. එන්. ලක්මාලි වන මා විසින් 2024 වර්ෂයෙ හි ඔක්තෝබර් මස 08 වෙනි දින තීරණ අංක 2825 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඊ. එම්. කේ. එන්. ලක්මාලි,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 1937 බනිජ තෙල් (භූමිතෙල් හා සුපර් පෙට්‍රල්) ගබඩා කිරීමේ බලපත්‍ර ගාස්තු වශයෙන් අමාත්‍යවරයා විසින් සාදා ඇති 1937 බනිජ තෙල් සේවා ස්ථාන රීති මාලාවේ 9 වැනි රීතිය ප්‍රකාරව බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව බනිජ තෙල් බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක එක් අවස්ථාවක දී ළඟ තබාගනු ලබන මෙහි පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත බනිජ තෙල් (භූමිතෙල් හා සුපර් පෙට්‍රල්) ගැළුම් ප්‍රමාණයන් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක බනිජ තෙල් (භූමිතෙල් හා සුපර් පෙට්‍රල්) ගබඩා කිරීමේ බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය

	I වැනි තීරුව *එක් අවස්ථාවක දී ළඟ තබාගනු ලබන ප්‍රමාණය*	*II වැනි තීරුව* *ගාස්තුව* *රු. ශත*
(අ)	ගැලුම් 160 නොඉක්මවන විට	5 0
(ආ)	ගැලුම් 160 ඉක්මවන එහෙත් ගැලුම් 500 නොඉක්මවන	10 0
(ඇ)	ගැලුම් 500 ඉක්මවන එහෙත් ගැලුම් 2,000 නොඉක්මවන	30 0
(ඈ)	*ගැලුම් 2,000 ඉක්මවන විට :*	
	(1) ප්‍රථම ගැලුම් 2,000 සඳහා	30 0
	(2) එක් එක් අතිරේක ගැලුම් 2,000 ප්‍රමාණයක් සඳහා හෝ එහි කොටසකට	30 0

12-195/6

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් ඊ. එම්. කේ. එන්. ලක්මාලි වන මා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂයෙහි ඔක්තෝබර් මස 08 වෙනි දින තීරණ අංක 2826 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඊ. එම්. කේ. එන්. ලක්මාලි,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 148 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව නියම කර අය කිරීමට මම තීරණය කරමි.

උපලේඛනය

	I වැනි තීරුව *වාහනය හෝ සත්ත්ව වර්ගය*	*II වැනි තීරුව* *රු. ශත*
(i)	මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා :	
	(අ) වෙළෙඳ කාර්යය සඳහා යොදවන්නේ නම්,	18 0
	(ආ) වෙළෙඳ කාර්ය නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
(iii)	සෑම කරත්තයක් සඳහා	20 0
(iv)	සෑම අත් කරත්තයක් සඳහා	10 0
(v)	සෑම රික්ෂෝවක් සඳහා	7 0
(vi)	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
(vii)	සෑම ඇතෙකු සඳහා	50 0

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ වෙළඳ කාර්ය යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-195/7

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් /දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව ප්‍රචාරක දැන්වීම් පිළිබඳ ගාස්තු පැනවීම

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් ඊ. එම්. කේ. එන්. ලක්මාලි වන මා විසින් 2024 වර්ෂයෙහි ඔක්තෝබර් මස 08 වෙනි දින තීරණ අංක 2827 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඊ. එම්. කේ. එන්. ලක්මාලි,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 122 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව හා 2015.12.28 වැනි දින අංක 1947/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ හා 2016.08.03 වැනි දින 1978/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ඉහත කී 1947/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* නිවැරදි කිරීමේ විධිවිධාන ප්‍රකාර එකී සම්මත අදාළ අතුරු ව්‍යවස්ථාව අනුව බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017.11.24 දිනැති අංක 2047 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ගැසට් පත්‍රයේ* සඳහන් විධිවිධාන පරිදි බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ කිනම් ආකාරයකට හෝ පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2025 වර්ෂයට ගාස්තු නියම කිරීම පහත උපලේඛනයේ ආකාරයට විය යුතු බව මම තීරණය කරමි.

උපලේඛනය

අනු අංකය	*ප්‍රචාරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3 ට අඩු	250	350	500
		3 ට වැඩි	3 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		

අනු අංකය	*ප්‍රවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
	2. පල්දෙණිය ග්‍රාම නිලධාරී වසමේ ජනතාවගේ මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා	19,000 0
	3. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් තැනැත්තෙකුගේ මෘත දේහයක් ආදාහනයක කිරීම සඳහා	20,000 0
	4. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත යම් තැනැත්තෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා	22,000 0
27	දුරකතන හා විදුලි සම්ප්‍රේෂණ කුළුණු අනුමත ගාස්තුව	75,000 0

12-205/11

පල්ලේපොල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට ගොඩනැගිලි ඉදිකිරීම මත ගාස්තු හා මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීමේ ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(3) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂයේ නොවැම්බර් මස 18 වැනි දින තීරණ අංක 1228(XII) යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. ඩී. පතිරාජ ,
ලේකම්,
පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 18 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21.49.78 වගන්තිවලින් පල්ලේපොල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2009.04.17 දිනැති අංක 1597/8 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ I කොටසේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලදුව නිවාස සහ නගර ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 2025.01.01 දින සිට ක්‍රියාත්මත වන පරිදි ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධ ගාස්තු පහත උපලේඛනයේ සඳහන් පරිදි අයකිරීමට පල්ලේපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

1 වන උපලේඛනය

ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර ගාස්තු	නාගරික	- රු. 2,000 0
	ග්‍රාමීය	- රු. 1,000 0

(i) සංවර්ධන අවසර පත්‍ර ලබාගැනීම සඳහා පෙරසැරි ගාස්තු ආවරණය අනුමැතිය දීම සඳහා ගාස්තු සහ සේවා ගාස්තු :

සංවර්ධන කාර්යයේ ස්වභාවය		*භාවිතා කළ යුතු ආකෘති පත්‍රය*	*අය කළ යුතු ගාස්තු*
i. ඉඩම් අනු කොටස්වල බෙදීම සඳහා සංවර්ධන බලපත්‍රය නිකුත් කිරීම	''අ''	*පෙරසැරි ගාස්තු බිම් කට්ටියක ප්‍රමාණය* ව. මී. 150-300 අතර ව. මී. 301-600 අතර ව. මී. 601-900 අතර ව. මී. 901 වැඩි	*එක් බිම් කට්ටියකට අය කළ යුතු මුදල (මාර්ග, කාණු හා පොදු බිම් කොටස් හැර)* රු. 500 0 රු. 400 0 රු. 300 0 රු. 200 0

ii. ගොඩනැගිලි ඉදිකිරීම්/පවත්නා ගොඩනැගිලිවලට කොටසක් එකතු කිරීම /නැවත ඉදිකිරීම සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම	''ආ''	*ගෙබිමේ විශාලත්වය වර්ග මීටර්වලින්*	*පදිංචිය සඳහා රු. ශත*	*වාණිජ හෝ වෙනත් භාවිත රු. ශත*
		45 ට අඩු	500 0	1,000 0
		45-90	1,500 0	2,000 0
		91-180	2,500 0	3,000 0
		181-270	3,500 0	4,000 0
		271-450	4,500 0	6,000 0
		451-675	5,500 0	8,000 0
		676-900	6,500 0	10,000 0
		901-1225	7,500 0	12,000 0
		1225 ට වැඩි	7,500 0	12,000 0
			ව. මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව. මී. 90 ක් සඳහාම රු. 1000.00 බැගින්	ව. මී. 1226 ඉක්ම වීමෙන් පසු සෑම ව. මී. 90 ක් සඳහාම රු. 1,250.00 බැගින්

(ii) **නීත්‍යානුකූල කිරීමේ දී දඩ මුදල් අය කිරීම :**

(අ) අත්තිවාරම් අවසානය දක්වා ඉදිකර ඇත්නම් වර්ග අඩියකට	රු. 5.00 බැගින් ද,
(ආ) ජනේල මට්ටම දක්වා ඉදිකර ඇත්නම් වර්ග අඩියකට	රු. 6.00 බැගින් ද,
(ඇ) බිත්ති අවසානය දක්වා ඉදිකර ඇත්නම් වර්ග අඩියකට	රු. 7.00 බැගින් ද,
(ඈ) වහල අවසානය දක්වා ඉදිකර ඇත්නම් වර්ග අඩියකට	රු. 8.00 බැගින් ද,

(iii) ගොඩනැගිලි අයදුම්පත්‍ර කාලය දීර්ඝ කිරීමේ ගාස්තු එක් වර්ෂයකට රු. 1,000.0

* මායිම් තාප්ප/ආරක්ෂිත බැමි ඉදිකිරීමේ දී අනුමැතිය ලබාගැනීම හා පළමු මීටර් 100 සඳහා රුපියල් 1000.0ක් ද ඊට වැඩිවන සෑම වර්ග මීටරයකට ම රුපියල් 10.0 බැගින් ද අයකළ යුතුය.

* ඉඩම්/කුඹුරු ඉඩම් ගොඩකිරීමේදී - වර්ග මීටර් 150ට අඩු ඉඩම් සඳහා රුපියල් 2000 ක් ද ඊට වැඩිවන සෑම වර්ග මීටරයකට ම රු. 20.0 බැගින් ද අයකළ යුතුය.

* අනුකූලතා සහතිකය නොමැතිව ප්‍රාදේශීය සභාවට නොදන්වා නිවසේ පදිංචි වූ අවස්ථාවක දී දඩ මුදල් අයකිරීම - අනුකූලතා සහතිකය නොමැතිව පදිංචි වූ දින සිට දිනකට රුපියල් 20.0 බැගින් අය කළ යුතුය.

පල්ලේපොල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට යන්ත්‍රෝපකරණ කුලියට දීමේ ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(3) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂයේ නොවැම්බර් මස 18 වන දින තීරණ අංක 1228(XIII) යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. ඩී. පතිරාජ ,
ලේකම්,
පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 18 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් පල්ලේපොල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, පල්ලේපොල ප්‍රාදේශීය සභාවට අයත් යන්ත්‍රෝපකරණ කුලියට දීමට පල්ලේපොල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නීය.

		රු. ශ.
*	6000l ජල බවුසරය කුලියට දීම සඳහා පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දිනකට (පැය 8) එක් වතාවක් ජලය රැගෙන යාම සහ ආපසු ඒම බල ප්‍රදේශයෙන් පිටත වැඩිවෙන කි.මී. 1ට රුපියල් 200/- බැගින්	15,500 0
*	පල්ලේපොල නගර සීමාව තුළ (3000l) බවුසරය කුලියට දීමට (ජලය හා ප්‍රවාහනය සඳහා එක් වරකට) (ජලය රැගෙන යන අවස්ථාවේම ජලය අස්කර නොගෙන දෙවෙනි වතාවට ජල බවුසරය රැගෙන යෑමට සිදුවන්නේ නම් ඒ සඳහා අමතරව රු. 2,000.00ක් අය කෙරේ)	5,000 0
*	පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ (3000l) (ජලය රැගෙන යන අවස්ථාවේ ම අස්කර නොගෙන දෙවෙනි වතාවට ජල බවුසරය රැගෙන යාමට සිදුවන්නේ නම් ඒ සඳහා ර. 5,000.00 ට අමතරව රු. 2,500.00 ක් ද අය කෙරේ.)	5,000 0
*	පල්ලේපොල බල ප්‍රදේශයෙන් පිටත වැඩිවන කි.මී. 1ට (3000l)	200 0
*	ජලය සහ බවුසරය පමණක් දිනකට (3000l)	2,500 0
*	බවුසරය පමණක් දිනකට (3000l)	1,000 0
I.	බැකෝ ලෝඩර් යන්ත්‍රය මීටර් පැය 1 ට (යෑමට ඒමට ඉන්ධන වියදම අය කර ගැනීම) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ (අවම පැය 2ක්) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පිටත (අවම පැය 3ක්) (යෑමට, ඒමට ඉන්ධන වියදම අයකර ගැනීම) සඳහා ගාස්තු ගෙවිය යුතුය.	6,000 0

		රු. ශ.
II.	මාර්ග තලන යන්ත්‍රයට මීටර් පැ. 1 ට නගර සීමාව තුළ (අවමය පැය 1ක්) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ (අවම පැය 3ක්) සඳහා ගෙවිය යුතුය. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පිටත (අවම පැය 5ක්) සඳහා ගාස්තු ගෙවිය යුතුය.	6,500 0
III.	ලොරි රථය ඉන්ධන හා රියදුරු සමග එක් වරකට කි.මී. 10ක් ඇතුළත	4,000 0
	කි.මී. 70ට වඩා වැඩි වන සෑම කි.මී. 1ට ම	250 0
	* නවතා තැබීමට	100 0
	* වැඩිවන සෑම පැය 1ට	1,625 0
IV.	ටිපර් රථය	
*	රියදුරු හා ඉන්ධන සමග දිනකට (පැය 8) - කි.මී. 50ක් ඇතුළත	20,000 0
*	කි.මී. 50ට වැඩිවන සෑම කි.මී. 1ටම	250 0
*	නවතා තැබීමට	100 0
*	වැඩිවන සෑම පැය 1ටම	2,500 0
ට්‍රැක්ටරය		
*	රියදුරු හා ඉන්ධන සමඟ දිනකට (මීටර් පැය 8)	15,000 0
වතුර පොම්පය		
*	ඉන්ධන සමඟ දිනකට (පැය 8)	6,000 0
*	අතිරේක පැයකට	300 0
රථගාල කුළියට දීම එක් දිනකට		2,500 0

12-205/13

පල්ලේපොල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(3) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂයෙ නොවැම්බර් මස 18 වන දින තීරණ අංක 1228(XIV) යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2025 වර්ෂය සඳහා පනවන ලද ඒ රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 30 වැනි දිනට පෙර පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තවදුරටත් නිවේදනය කරනු ලැබේ.

ටී. ඩී. පතිරාජ ,
ලේකම්,
පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 18 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තිය යටතේ රථ වාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමට එකී පනතේ 147 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙන අතර මෙම බදු මුදල 2025 මාර්තු 31 දින හෝ ඊට පෙර එකී පනතේ 148.3 වැනි වගන්තිය යටතේ ගෙවිය යුතු බවට යෝජනා කරමි.

		රු. ශ.
1.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, හෝ ජීන් රික්ෂෝවක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් කාරයක් හෝ කරත්තයක් සඳහා	
	(අ) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් සේවා ගාස්තු	18 0
	(ආ) වෙළඳ කාර්යය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් සේවා ගාස්තු	4 0
2.	සෑම කරත්තයක් සඳහා සේවා ගාස්තු	20 0
3.	සෑම අත් කරත්තයක් සඳහා සේවා ගාස්තු	10 0
4.	සෑම රික්ෂෝවක් සඳහා	15 0
5.	සෑම අශ්වයෙකු, පෝනියෙකු, කොටළුවෙකු සඳහා	7 50
6.	සෑම ඇතෙකු සඳහාම	15 0

12-205/14

පල්ලේපොල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා පල්ලේපොල ජල යෝජනා ක්‍රමවල ජල ගාස්තු සංශෝධනය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(3) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂයේ නොවැම්බර් මස 18 වැනි දින තීරණ අංක 1228(XV) යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. ඩී. පතිරාජ ,
ලේකම්,
පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 18 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1988.08.25 අංක 520/7 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ IV (ආ) හි 34 වන කොටසේ ජල සම්පාදනය යටතේ දක්වා ඇති ජලය සැපයීමේ ගාස්තු සංශෝධනය කිරීමටත්, ජල ගාස්තු උපලේඛන (i), (ii) හි සඳහන් පරිදි 2025.01.01 සිට අය කිරීම සුදුසු බවටත් යෝජනා කරමි.

උපලේඛනය (i)

පල්ලේපොල, අලුත්ගම, දිඹුල්ගමුව, මැදලන්ද, කොටනෑපෑල ජල යෝජනා ක්‍රමවල සංශෝධිත ජල ගාස්තු

ගෘහස්ථ		*අර්ධ ව්‍යාපාරික*		*ව්‍යාපාරික*	
ස්ථාවර - රු. 250		*ස්ථාවර - රු. 300*		*ස්ථාවර - රු. 400*	
ඒකක	රු.	ඒකක	රු.	ඒකක	රු.
1	270	1	330	1	440
2	290	2	360	2	480
3	310	3	390	3	520
4	330	4	420	4	560
5	350	5	450	5	600
6	380	6	490	6	650
7	410	7	530	7	700
8	440	8	570	8	750
9	470	9	610	9	800
10	500	10	650	10	850
11	540	11	700	11	910
12	580	12	750	12	970
13	620	13	800	13	1,030
14	660	14	850	14	1,090
15	700	15	900	15	1,150
16	750	16	960	16	1,220
17	800	17	1020	17	1,290
18	850	18	1080	18	1,360
19	900	19	1,140	19	1,430
20	950	20	1,200	20	1,500
21	1,010	21	1,270	21	1,580
22	1,070	22	1,340	22	1,660
23	1,130	23	1,410	23	1,740
24	1,190	24	1,480	24	1,820
25	1,250	25	1,550	25	1,900
26	1,320	26	1,630	26	1,990
27	1,390	27	1,710	27	2,080
28	1,460	28	1,790	28	2,170
29	1,530	29	1,870	29	2,260
30	1,600	30	1,950	30	2,350
31 සිට සෑම ඒකකයක් ම රු. 80 බැගින් අය කෙරේ.		31 සිට සෑම ඒකකයක් ම රු. 90		31 සිට සෑම ඒකකයක් ම රු. 100	
මීටර් අක්‍රිය පාරිභෝගිකයින් සඳහා රු. 950		රු. 1200		රු. 1500	

උපලේඛනය (ii)

අම්බොක්ක ජල යෝජනා ක්‍රමයේ සංශෝධිත ජල ගාස්තු

ස්ථාවර - 200			
ඒකකය	*රු.*	*ඒකකය*	*රු.*
1	210	16	450
2	220	17	475
3	230	18	500
4	240	19	525
5	250	20	550
6	265	21	580
7	280	22	610
8	295	23	640
9	310	24	670
10	325	25	700
11	345	26	735
12	365	27	770
13	385	28	805
14	405	29	840
15	425	30	875

31 සිට සෑම ඒකකයක් ම රු. 40.00

මීටර් අක්‍රිය පාරිභෝගිකයින් සඳහා රු. 550

ඒකක 01 - ලීටර් 1000

12-205/15

පල්ලේපොල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා කසළ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(3) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂයේ නොවැම්බර් මස 18 වැනි දින තීරණ අංක 1228(XVI) යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. ඩී. පතිරාජ ,
ලේකම්,
පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 18 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු ගම් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට යෝජිත කොහොලන්වල උප නාගරික සීමාවේ පිහිටි ගෘහස්ථ හා වාණිජ දේපළයන්ගෙන් 2025 ජනවාරි සිට දෙසැම්බර් දක්වා පහත පරිදි කසළ ගාස්තු අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 09(03) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂයේ නොවැම්බර් මස 18 වැනි දින තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය I

කසළ ගාස්තු අය කිරීම (මසකට)	
විස්තරය	*ගාස්තුව (රු.)*
ගෘහ ඒකක	150 0
වාණිජ ඒකක	200 0

12-205/16

හම්බන්තොට මහා නගර සභාව

2025 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2025 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීමේ තීරණය මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

"252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 238 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මහා නගර සභා වෙත කරන ලද නියමය ප්‍රකාර හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත හම්බන්තොට නැගෙනහිර හා බටහිර යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවල පවතින සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා කවර වූ හෝ ගෙපත්වල වාර්ෂික තක්සේරු වටිනාකම් වශයෙන් 2024 වර්ෂයේ පිළිගෙන තිබූ වාර්ෂික තක්සේරු වටිනාකම් 2025 වර්ෂය සඳහා තක්සේරු වටිනාකම්, වශයෙන් පිළිගැනීමටත්,

එකී මහා නගර සභා ආඥාපනතේ 230 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් හම්බන්තොට මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත වාර්ෂික වටිනාකමෙන් සියයට අටක (8%) වරිපනම් මුදලක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

"252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 238 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මහා නගර සභා වෙත කරන ලද නියමය ප්‍රකාර හම්බන්තොට මහා නගර සභා නව බල ප්‍රදේශය ඇතුළත හම්බන්තොට සිරිබෝපුර, කොහොලංකල, කෑලියපුර, මිරිජ්ජවිල හා සාමෝදාගම යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවල පවතින සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා කවර වූ හෝ ගෙපත්වල වාර්ෂික තක්සේරු වටිනාකම් වශයෙන් 2024 වර්ෂයේ පිළිගෙන තිබූ වාර්ෂික තක්සේරු වටිනාකම්, 2025 වර්ෂය සඳහා තක්සේරු වටිනාකම් වශයෙන් පිළිගැනීමටත්,

එකී මහා නගර සභා ආඥාපනතේ 230 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් හම්බන්තොට මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත වාර්ෂික වටිනාකමෙන්,

වාණිජ දේපළ සඳහා	- සියයට හත (7%)
රජයේ දේපළ සඳහා	- සියයට හත (7%)
නේවාසික දේපළ සඳහා	- සියයට පහ (5%)

අනුව වරිපනම් බදු මුදලක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

2025 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් මුදල 2025 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර හම්බන්තොට මහා නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු මුදල් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදළ වරිපනම් බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට මත්තෙන් හම්බන්තොට මහා නගර සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට පහක (5%) වට්ටමක් ද, ලබාදීමටත්, සහ

ඒ වරිපනම් බදු මුදල්, එකී මහා නගර සභා ආඥාපනතේ 230 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 වැනි දිනවලින් අවසන් වන එක් එක් කාර්තුව අවසන් වීමට පෙර සමාන වාරික හතරකින් හම්බන්තොට මහා නගර සභාවට ගෙවීමට තීරණය කළ බව මෙයින් දන්වා සිටිම.

12-204/1

හම්බන්තොට මහා නගර සභාව

හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමේ ස්ථානයක් සඳහා මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ 2025 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2025 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

හම්බන්තොට මහා නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 1811 දරන 2013 මැයි මස 17 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල V, VI, VII, VIII, IX, X, XI, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XXI යන අතුරු ව්‍යවස්ථා ද අංක 541/17 දරන 1989 ජනවාරි 20 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල XIV, XXVII, XXVIII යන අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අනුව මෙහි පහත උපලේඛනයේ I වන කොටසේ සඳහන් කිසියම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් 2025 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා හම්බන්තොට මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයාගෙන් බලපත්‍රයක් ලබාගත යුතු බවත් එසේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් වෙනුවෙන් ම, එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම පහත සඳහන් උපලේඛනයේ 2 වන කොටසේ 1 වන තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක, එහි II වන තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ බලපත්‍ර ගාස්තුවක් 252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 (අ) වන වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, 2025 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු බවට තීණය කර මෙයින් දන්වා සිටිමි.

උපලේඛනය

1 වැනි කොටස

1. මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
2. මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
3. සිසිල් බීම කර්මාන්ත ශාලා ස්ථානයක් පවත්වාගෙන යාම
4. කොණ්ඩා සැකසීම, බාබර් සාප්පු, සැලූන් හා රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
5. බේකරියක් පවත්වාගෙන යාම
6. කිරිපට්ටියක් පවත්වාගෙන යාම
7. අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
8. බත් කඩ, ආපන ශාලා, තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම
9. හෝටලයක් පවත්වාගෙන යාම
10. නවාතැන්පලක් පවත්වාගෙන යාම
11. ලොන්ඩරියක් පවත්වාගෙන යාම
12. කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
13. අවමංගල්‍ය සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
14. ඌරන් ආදී සතුන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
15. පිහිනුම් තටාකයක් පවත්වාගෙන යාම

මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර (252 වැනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්ය සඳහා පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1. මිනිරන් වර්ග කිරීම හා සකස් කිරීම.
2. මිනිරන් ගබඩාකර තැබීම.
3. පොහොර නිෂ්පාදනය.
4. පොහොර ගබඩාකර තබා ගැනීම
5. හම් ගබඩා කර තැබීම.
6. උම්බලකඩ හොන්ඩර 5කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම
7. කුකුළු වෙළෙඳපොළක් පවත්වාගෙන යාම.
8. කළුගල් කැඩීම සහ කබොක් කැපීම.
9. බොරලු හැරීම.
10. අශ්වයන් හෝ ගවයන් සඳහා ඉස්තාලයක්, වෙළෙඳපොළක්, ගාලක් හෝ ලැයිමක් තබා ගැනීම.
11. පශු ගිලන් හලක් පවත්වාගෙන යාම.
12. රබර් සකස් කිරීම
13. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි ගබඩා කිරීම, ශුද්ධ කිරීම, අලුත්වැඩියා කිරීම හෝ ඒවායේ දූලි ඉවත් කිරීම
14. පුවක් සකස් කිරීම.
15. තලාතු මිනිරන් සකස් කිරීම.
16. බැටළුවන් හෝ එළුවන් හෝ දෙවර්ගයම හෝ 10 දෙනෙකුට වඩා ගාල්කොට තැබීම සඳහා වූ මඩුවක් හෝ ගාලක් තබා ගැනීම
17. උළු කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
18. හුණු ගබඩා කොට තැබීම.
19. බොම්බයි ලූණු හොණ්ඩර 05කට වඩා ගබඩා කොට තැබීම
20. අර්තාපල් හොණ්ඩර 05කට වඩා ගබඩාකොට තැබීම.
21. පොල්කටු අඟුරු හොණ්ඩරයකට වඩා ගබඩා කොට තැබීම.
22. කුරුඳු, කරදමුංගු හෝ කෙඳි, ගෙන්දගම් දුම් ගස්සා සකස් කිරීම.
23. පරණ ලෝහ ගබඩා කර තැබීම.
24. සිමෙන්ති හොණ්ඩර 25කට වඩා ගබඩාකර තැබීම.
25. කරවල හොණ්ඩර 10කට වඩා ගබඩාකර තැබීම.
26. ලුණු දැමූ මාළු හොණ්ඩර 10කට වඩා ගබඩාකර තැබීම.
27. රබර් ඔට්ටපාලු සුන්බුන් ඇඹරීම හෝ වේලීම.
28. ට්‍රංක් පෙට්ටි නිෂ්පාදනය.
29. මරා සකස් කරන ලද කුකුළු ආදී සතුන් විකිණීම සඳහා කඩයක් පවත්වාගෙන යාම.
30. ගම් වර්ග නිෂ්පාදනය.
31. විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය.
32. බැටරි පුරවනු ලබන්නාවූ හෝ බැටරි ගබඩා කොට තබනු ලබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම.
33. ටයර් ප්‍රතිසංස්කරණය කරනු ලබන්නා වූ හෝ කට්ට කැපීම කරන්නාවූ ආයතනයක් පවත්වාගෙන යාම.
34. ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කරන ආයතනයක් පවත්වාගෙන යාම.
35. හිස් බෝතල් 100 කට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
36. කුරුඳු පොතු හොණ්ඩරයකට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
37. කොකෝවා හොණ්ඩර 10කට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
38. මිනී පෙට්ටි සෑදීම හෝ ගබඩා කොට තැබීම
39. ගෘහ භාණ්ඩ සෑදීම හෝ ගබඩා කොට තැබීම
40. මැණික් වෙළෙන්දන් විසින් මැණික් කැපීම හා ඔපදැමීම.
41. බලපත්‍ර ලත් වෙළෙන්දන් විසින් රබර් ගබඩා කොට තැබීම.
42. වේවැල් බඩු සෑදීම හෝ ගබඩා කොට තැබීම
43. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කොට තැබීම.
44. යාන්ත්‍රික බලය යොදගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
45. පිටි හෝ කුළු බඩු ඇඹරීම.
46. පූන්නක්කු හැර සත්ව ආහාර හොණ්ඩර 20කට වඩා ගබඩාකර තැබීම.
47. සත්ත්ව ආහාර හැර වෙනත් කාර්යයන් සඳහා ධාන්‍ය ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම, එහෙත් සමුපකාර සමිතියක් විසින් ගබඩා කොට තබා ගන්නා එවැනි ධාන්‍ය මෙම නියමයට යටත් නොවේ.
48. රබර් භාණ්ඩ නිෂ්පාදනය.
49. මෝර වරල් සකස් කිරීම හා ගබඩා කොට තැබීම.
50. යන්ත්‍රානුසාරයෙන් ඇටකටු ඇඹරීම.
51. පූන්නක්කු ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.

52. පොලිතින් සෙල්ලුලොයිඩ් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය සහ ගබඩා කර තැබීම.
53. ඇසිඩ් ගැළුම් 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම.
54. කපුරු නිෂ්පාදනය.
55. බූට් සපත්තු සහ පාවහන් නිෂ්පාදනය.
56. ඉටිපන්දම් නිෂ්පාදනය.

මෙහි පහත දක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර (252 වැනි අධිකාරය) මහා නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්යය සඳහා අන්තරාදායක කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1. වාෂ්ප, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දූව හෝ ලී ඉරීම.
2. සිසිල් බීම නිෂ්පාදනය.
3. කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම.
4. යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් නිෂ්පාදනය.
5. යන්ත්‍රානුසාරයෙන් තල තෙල් නිෂ්පාදනය.
6. තෙල් හිඳීම සඳහා සෙක්කුවක් හෝ අත් මෝලක් තබා ගැනීම.
7. කෙඳි නිෂ්පාදනය හෝ ගබඩා කොට තැබීම
8. ගිනි පෙට්ටි නිෂ්පාදනය.
9. ඉඹුල් පුළුන් ගබඩා කොට තැබීම.
10. පොල් තෙල් ගැලුම් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
11. මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩා කොට තැබීම.
12. ඇසිටලීන් නිෂ්පාදනය.
13. උළු 500කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
14. ගඩොල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
15. කබොක් ගල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
16. සිගරට් නිෂ්පාදනය.
17. බීඩි නිෂ්පාදනය.
18. තීන්ත හෝ වාර්නිෂ් හොන්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
19. ලී පෙට්ටි හොණ්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම.
20. කොහු නිෂ්පාදනය.
21. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි හැර වෙනත් ගෝනි 100කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
22. පාවිච්චි කළ රබර් ටයර් හෝ ටියුබ් 150කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
23. රසකැවිලි නිෂ්පාදනය.
24. පොල් කටු අඟුරු හැර වෙනත් අඟුරු හොණ්ඩරයකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
25. බෝට්ටු හෝ බත්තල් සෑදීම.
26. ලී පෙට්ටි සෑදීම.
27. ඔක්සිජන් හා වෑල්ඩිං වැඩ කරනු ලබන්නා වූ ද මෝටර් වාහන අලුත්වැඩියා කරන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
28. මෝටර් වාහන අලුත්වැඩියා කරන්නා වූ ද යකඩ සහ ලෝහ වැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
29. මෝටර් වාහන අලුත්වැඩියා කරන ආයතනයක් පවත්වාගෙන යාම.
30. මෝටර් වාහන සර්විස් කරන ආයතනයක් පවත්වාගෙන යාම.
31. යාන්ත්‍රික බලය යොදා ගනු ලබන්නා වූ මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
32. අතින් හෝ පා පොලුවලින් ක්‍රියා කරවන යන්ත්‍රයක් පාවිච්චි කෙරෙන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
33. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තැබීම.
34. පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ලීටර් 54.5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
35. ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු කිලෝග්‍රෑම් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම.
36. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය.
37. 100කට අධික ප්‍රමාණයක් පතොරම් ගබඩාකර තැබීම.
38. කොහු හෝ පුළුන් මෙට්ට හෝ කොට්ට හෝ කුෂන් නිෂ්පාදනය සහ/හෝ ගබඩාකර තැබීම.
39. අලුත් ටයර් හෝ ටියුබ් 150කට අධික ප්‍රමාණයක් ගබඩාකර තැබීම.
40. පාවිච්චි කළ කඩදාසි කිලෝග්‍රෑම් 250කට අධික ප්‍රමාණයක් ගබඩාකර තැබීම.

41. ස්ප්‍රේ පේන්ටිං වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
42. යාන්ත්‍රික ශීතකරණය සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
43. යාන්ත්‍රික බලය පාවිච්චි කරනු ලබන්නා වූ ඇඳුම් මැසීම කරනු ලබන්නා වූ ද ආයතනයක් පවත්වාගෙන යාම.
44. කමිස කොලර් සහ කමිස අත් රැළි දමන ආයතනයක් පවත්වාගෙන යාම.

මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර (252 වැනි අධිකාරය) වන මහා නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්ය සඳහා අන්තරාදායක සහ පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1. ඩ්‍රයික්ලීන් වැඩ කරන ආයතනයක් පවත්වාගෙන යාම.
2. යාන්ත්‍රික බලය පාවිච්චි නොකරන, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ, ක්‍රෝමියම් ආලේප කිරීම, රන් ආලේප කිරීම, රිදී ආලේප කිරීම හෝ තඹ ආලේප කිරීම කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම.
3. යාන්ත්‍රික බලය පාවිච්චි කරන්නා වූ ද, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද ආයතනයක් පවත්වාගෙන යාම.
4. ගල් අඟුරු ගෑස් නිෂ්පාදනය සහ ගබඩා කිරීම.
5. කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදනය.
6. අශුද්ධ ලෝහ උණු කිරීම.
7. ගිණිකෙළි භාණ්ඩ ගබඩා කිරීම.
8. කිලෝග්‍රෑම් 2කට අධික ප්‍රමාණයකින් වෙඩි බෙහෙත් සහ පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීම.
9. ගම්, ඉටි හෝ දුම්මල (රෙසින්) ගබඩා කිරීම.
10. බිම ඔප දමන පොලිෂ් නිෂ්පාදනය.
11. තාර පෙරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
12. ශීතකරණ අලුත්වැඩියා කිරීම, ඊකන්ඩිෂන් කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
13. මෝටර් කාර් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
14. ස්කූටර් හෝ මෝටර් සයිකල් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
15. පුපුරන ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය සහ පොහොර විකිණීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
16. ගල් කොරියක් පවත්වාගෙන යාම.
17. ගල් මෝලක් පවත්වාගෙන යාම.
18. ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම.

උපලේඛනය

2 වැනි කොටස

	I වැනි තීරුව වාර්ෂික වටිනාකම	*II* වැනි තීරුව බලපත්‍ර ගාස්තුව රු. ශත
1.	රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	2,000 0
2.	රු. 1,501 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට	3,000 0
3.	රු. 2,501 ඉක්මවන විට	5,000 0

ඉහත 1 වන කොටසේ සඳහන් කර්මාන්ත අතරින් කිසියම් හෝටලයක්, ආපන ශාලාවක් නවාතැන් පොළක් 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ ද වන අවස්ථාවක, ඉහත 2 වැනි කොටසේ කුමක් සඳහන්ව තිබුණ ද ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන් පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන්පොළෙහි 2024 වර්ෂය තුළ ලැබීම්වලින් සියයට එකක් (1%) විය යුතු ය.

හම්බන්තොට මහා නගර සභාව

2025 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2025 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

''252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 ආ වන වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන්නා වූ මෙහි පහත උපලේඛනයේ 1 වන කොටසේ සඳහන් කිසියම් කර්මාන්තයක් හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2025 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම මෙහි පහත උපලේඛනයේ 2 වන කොටසේ I වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක එහි II වැනි තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ කර්මාන්ත බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී කර්මාන්ත බද්දට යටත් සෑම තැනැත්තෙක්ම, එකී කර්මාන්ත බද්ද 2025 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු බව තීරණය කර මෙයින් දන්වා සිටිමි''.

උපලේඛනය

1 වන කොටස

1.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
2.	පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
3.	වාස්තු වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
4.	ලී කැටයම් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
5.	වානේ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය හා අළුත්වැඩියාව.
6.	කොසු, ඉදල්, බුරුසු ආදිය නිෂ්පාදනය.
7.	පැන්ට්‍රි කබඩ් හා ඇලුමිනියම් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
8.	වීදුරු ආශ්‍රිත නිෂ්පාදන කටයුතු සිදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
9.	විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
10.	ජංගම දුරකථන අලුත්වැඩියාව කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
11.	පරිගණක යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
12.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
13.	ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
14.	මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
15.	රෙදි විවීමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
16.	රූපවාහිනී යන්ත්‍ර හා ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
17.	පාපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
18.	රෙදි පින්තාරු කිරීමේ හෝ බතික් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
19.	බ්‍රේක් ලයිනර් ඇලවීමේ හා සවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
20.	ඡායාරූප, දළ සේයාපට සේදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
21.	විකිණීම සඳහා බිම්මල් වගා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
22.	විදුලි කර්මාන්ත වැඩපලක් පවත්වාගෙන යාම.
23.	සබන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
24.	කුෂන් කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම.
25.	බ්ලොක් ගල් නිෂ්පාදනය සහ විකිණීම
26.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම.
27.	කොන්ක්‍රීට් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම
28.	වාහන සඳහා ටින්කරින් ටින්ටඩ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

උපලේඛනය

2 වැනි කොටස

	I වැනි තීරුව වාර්ෂික වටිනාකම	*II* වැනි තීරුව ගෙවිය යුතු බද්ද
		රු. ශත
1.	රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	2,000 0
2.	රු. 1,501 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට	3,000 0
3.	රු. 2,501 ඉක්මවන විට	5,000 0

12-204/3

හම්බන්තොට මහා නගර සභාව

2025 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2025 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

''252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 (ඇ) වන වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී අඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී ආඥාපනතේ 247 (ආ) වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ ද හා වෘත්තියක් නොවන්නා වූ ද මෙහි පහත උපලේඛනයේ 1 වැනි කොටසේ සඳහන් කිසියම් ව්‍යාපාරයක් හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2025 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 2 වැනි කොටසේ I වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක, එහි II වැනි තීරයේ අනුරූප සටහනෙ හි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී ව්‍යාපාර බද්දට යටත් සෑම තැනැත්තෙක් ම, එකී ව්‍යාපාර බද්ද 2025 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු බව තීරණය කර මෙයින් දන්වා සිටිමි.

උපලේඛනය

1 වැනි කොටස

1. කිරි පිටි, බිස්කට් වර්ග, රස කැවිලි හා ආහාරයට ගන්නා ද්‍රව්‍ය ගබඩාකර තැබීම, විකිණීම, බෙදාහැරීම හා අලෙවි නියෝජිත කටයුතු සිදු කරනු ලබන ආයතන.
2. සබන් හා එදිනෙදා භාවිතයට ගන්නා සනීපාරක්ෂක ද්‍රව්‍ය ගබඩා කර තැබීම, විකිණීම, බෙදාහැරීම හා අලෙවි නියෝජිත කටයුතු සිදු කරන ආයතන.
3. කෘෂි රසායන හා කෘෂිකාර්මික උපකරණ ගබඩාකර තැබීම, විකිණීම, බෙදාහැරීම හා අලෙවි නියෝජිත කටයුතු සිදු කරන ආයතන.
4. වෙළෙඳ ප්‍රචාරණ හා පුවත්පත් දැන්වීම් පළ කිරීම සිදුකරන ආයතනයක් පවත්වාගෙන යාම.
5. මෝටර් රථ කුළියට ලබාදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
6. විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
7. දුරකථන ඇමතුම් ලබාදීම, දුරකථන කාඩ්පත් අලෙවිය, ජංගම දුරකතන අලෙවිය හා සන්නිවේදන සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

8. දුරකථන සමාගම්වල ශාඛා හා නියෝජිත ආයතන පවත්වාගෙන යාම.
9. කර්මාන්ත සඳහා අවශ්‍ය උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
10. රියැදුරු පුහුණු පාසලක් පවත්වාගෙන යාම.
11. උත්සව භාණ්ඩ බදුදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
12. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
13. උපස්ථායක සේවා ලබාදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
14. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
15. ක්‍රීඩා උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
16. උත්සව ශාලා බදු දීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
17. පෞද්ගලික ආරක්ෂණ සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
18. ගණකාධිකාරී සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
19. විදේශ මුදල් හුවමාරු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
20. බැංකු සේවා හා උකස් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
21. ලීසිං හා ෆිනෑන්ස් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම, කොටස් වෙළෙඳපොළ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
22. ඉඩම් හා ගොඩනැගිලි විකිණීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
23. විදේශ ගුවන් ප්‍රවේශපත් අලෙවි කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
24. නිවාස සැළසුම් හා ගොඩනැගිලි ඉදිකිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
25. ගුවන් හෝ නැව් භාණ්ඩ නිෂ්කාශන සේවා සපයනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම.
26. රථවාහන තත්ත්ව සහතික ලබාදීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
27. ලුණු පැකට් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
28. ස්වර්ණාභරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
29. ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
30. විදුලි උපකරණ හා ඉලෙක්ට්‍රොනික උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
31. නිමි ඇඳුම් හා රෙදිපිළි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
32. සිල්ලර හා තොග වෙළෙඳාම සිදුකරන ස්ථානයක් පවත්වාගෙන යාම.
33. ෆාමසියක් පවත්වාගෙන යාම.
34. තෑගි භාණ්ඩ, විසිතුරු භාණ්ඩ, ළදරු භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
35. ගොඩනැගිලි ඉදිකිරීමේ අමුද්‍රව්‍ය හා උපකරණ ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
36. පුවත්පත් හා සඟරා අලෙවි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
37. පොත් පත් හා ලිපි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
38. පාවහන් හා සම්භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
39. ලියාපදිංචි කළ හා නොකළ වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
40. කෘෂිකාර්මික උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
41. ලිහිසි තෙල් හා ග්‍රීස් ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
42. ගෑස් ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
43. කෘෂි රසායන ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
44. දේශීය බෙහෙත් බඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
45. යකඩ, ඇලුමිනියම්, පීවීසී, තීන්ත යනාදිය ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
46. දේශීය හා විදේශීය මත් පැන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හා නීතීඥවරයෙකු වශයෙන් කටයුතු කිරීම
48. මුදල් අය කරන පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
49. පෞද්ගලික බටහිර වෛද්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම
50. පෞද්ගලික ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
51. විශේෂඥ වෛද්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
52. දුරකථන හා රූපවාහිනී සේවා සම්ප්‍රේෂණාගාර කුළුණු පවත්වාගෙන යාම
53. සාප්පු බඩු වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. ස්වර්ණාභරණ අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55. ආයුර්වේද බෙහෙත් බඩු වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
56. ලිපිද්‍රව්‍ය, පොත්පත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
57. ඇස් කණ්ණාඩි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. මෝටර් සයිකල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59. ඔරලෝසු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

60. වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. තුරඟ තරග ක්‍රීඩා පැවැත්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62. ධීවර ආම්පන්න අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
63. ෆ්ලෝටයිල්, වෝල් ටයිල් හා විවිධ සෙරමික් භාණ්ඩ අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64. සුරතල් මසුන් ඇති කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. පරිගණක යන්ත්‍ර හා අමතර කොටස් අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
67. විවිධ භාණ්ඩ බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (කුරියර් සර්විස්)
68. යතුරු කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. අත් යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
70. මිනිස් ශ්‍රමය සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම
71. පානය සඳහා ජලය පිරිසිදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

උපලේඛනය

2 වැනි කොටස

	I වැනි තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර 2024 වර්ෂයේ දී ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*	*II* වැනි තීරුව *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
(1)	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	අයකිරීමක් නැත
(2)	රු. 6,001 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
(3)	රු. 12,001 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
(4)	රු. 18,751 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
(5)	රු. 75,001 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
(6)	රු. 1,50,001 ඉක්මවන විට	3,000 0

12-204/4

හම්බන්තොට මහා නගර සභාව

2025 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු හා බැනර් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු අයකිරීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2025 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු හා බැනර් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු අයකිරීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

"252 වන අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 267 (27) වන වගන්තිය ප්‍රකාරව, මහා නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, හම්බන්තොට මහා නගර සභාව විසින් වැළඳගෙන ඇති අංක 541/17 හා 1989 ජනවාරි 20 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ "ප්‍රචාරක දැන්වීම්" අතුරු ව්‍යවස්ථාව යටතේ හම්බන්තොට මහා නගර සභා සීමාව තුළ යම් වීථියකට, පාරකට, මාවතකට, ඇළකට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර දැන්වීම් පුවරු, බැනර්, කටවුට් හා බිත්තිවල පින්තාරු කර ඇති දැන්වීම් වෙනුවෙන් පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් වර්ගයේ ප්‍රදර්ශනයන් වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක ගාස්තු පනවා අයකිරීමටත් තීරණය කර මෙයින් දන්වා සිටිමි.".

I තීරුව	*II තීරුව*		
දැන්වීම් වර්ගය	*වර්ග අඩියක් සඳහා අයකිරීම*		
	සතියක්	*මාසයක්*	*වර්ෂයක්*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
බැනර් (රාමු නොකරන ලද රෙදි දැන්වීම් ලද)	40 0	50 0	100 0
කටවුට් (රාමු කරන ලද රෙදි දැන්වීම් ලද)	40 0	50 0	100 0
ස්ථිර දැන්වීම් පුවරු		50 0	200 0
බිත්ති පින්තාරු		50 0	200 0
ආලෝක විමෝචක දියෝඩ නාම පුවරු			1,600 0

නගර සභාව මගින් ඉවත් කරනු ලබන දැන්වීම් පුවරුවක් නැවත ලබා දීම සඳහා පහත ගාස්තු අය කරනු ලැබේ :

	රු. ශත
එක් බැනරයක් හෝ කටවුටයක් සඳහා	100 0
එක් ස්ථාවර දැන්වීම් පුවරුවක් සඳහා	6,000 0

12-204/5

හම්බන්තොට මහා නගර සභාව

ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග හා රඟ දැක්වීම් පිළිබඳ ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2025 වර්ෂය සඳහා ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග හා රඟ දැක්වීම් පිළිබඳ ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

"හම්බන්තොට මහා නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 541/17 දරන 1989 ජනවාරි 20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ XXXI වන කොටසේ "ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග සහ රඟ දැක්වීම්" පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 3 වැනි වගන්තිය යටතේ හම්බන්තොට මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, පහත උපලේඛනයේ නිරූපිත ප්‍රමාණයක ගාස්තු පනවා අයකිරීමටත්, තීරණය කර මෙයින් දන්වා සිටිමි".

	බලපත්‍රය ලබා ගැනීමට අපේක්ෂිත ස්ථානයේ වර්ග ප්‍රමාණය	*එක් එක් දිනයක් සඳහා රු. ශත*
(අ)	වර්ග මීටර් 93 ක් නොඉක්මවන්නේ නම්	1,500 0
(ආ)	වර්ග මීටර් 93 ක් ඉක්මවන එහෙත් වර්ග මීටර් 186 ක් නොඉක්මවන විට	1,750 0
(ඇ)	වර්ග මීටර් 186 ක් ඉක්මවන එහෙත් වර්ග මීටර් 279 ක් නොඉක්මවන විට	2,000 0
(ඈ)	වර්ග මීටර් 279 ක් ඉක්මවන එහෙත් වර්ග මීටර් 465 ක් නොඉක්මවන විට	2,250 0
(ඉ)	වර්ග මීටර් 465 ක් ඉක්මවන විට	3,000 0

12-204/6

හම්බන්තොට මහා නගර සභාව

2025 වර්ෂය සඳහා විනෝද බදු ආඥාපනත යටතේ බදු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2025 වර්ෂය සඳහා විනෝද බදු ආඥාපනත යටතේ බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

"267 වන අධිකාරය වන විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, හම්බන්තොට මහා නගර සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන, එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට (චිත්‍රපට සංදර්ශනයක්, සර්කස් සංදර්ශනයක්, මැජික් සංදර්ශනයක්, ගායනයක්, සංගීත සංදර්ශනයක්, විවිධ ප්‍රසංගයක් හෝ මුදල් අයකරමින් පවත්වාගෙන යන ක්‍රීඩා කටයුත්තක්) වෙනුවෙන්, ඒ වෙනුවෙන් නිකුත් කරනු ලබන ටිකට් පත්වල වටිනාකමෙන් 20% ක විනෝද බද්දක් වශයෙන් පනවා අය කළයුතු යැයි ද, මෙම යෝජනාව 2025 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද යෝජනා කරන්නී ය. එසේම ඉහත පවරන ලද විනෝද බද්ද එකී විනෝද කාර්යය පැවැත්වීමට පෙර අදාළ සංවිධායක හෝ සංවිධායකවරුන් විසින් නිසි ලෙස හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් හම්බන්තොට මහා නගර සභාව වැඩිදුරටත් යෝජනා කරන්නී ය.".

උපලේඛනය

මීට අමතරව චිත්‍රපට සංදර්ශනයක් (චිත්‍රපට ශාලා අයත් නොවේ) සර්කස් සංදර්ශනයක්, මැජික් සංදර්ශනයක්, ගායනයක්, සංගීත සංදර්ශනයක්, විවිධ ප්‍රසංගයක්, වේදිකා නාට්‍යයක් හෝ මුදල් අයකරමින් පවත්වාගෙන යන ක්‍රීඩා කටයුත්තක් වෙනුවෙන් පහත පරිදි සංදර්ශන බලපත්‍ර ගාස්තු අයවිය යුතු අතර, වැඩිවන සෑම දිනක් සඳහාම රු. 100.00 ක අමතර ගාස්තුවක් අයකරනු ලැබේ.

		ගාස්තුව රු. ශත
01.	චිත්‍රපට සංදර්ශනයක් (චිත්‍රපට ශාලා අයත් නොවේ), සර්කස් සංදර්ශනයක්, මැජික් සංදර්ශනයක්, වේදිකා නාට්‍ය කටයුත්තක්	2,000 0
02.	සංගීත සංදර්ශනයක්, විවිධ ප්‍රසංගයක්, මුදල් අයකරමින් පවත්වාගෙන යන ක්‍රීඩා කටයුත්තක්	2,500 0

12-204/7

හම්බන්තොට මහා නගර සභාව

2025 වර්ෂය සඳහා හම්බන්තොට මහා නගර සභාව සතු බිම් තාවකාලික වෙළෙඳ කටයුත්තක් සඳහා බදු දීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2025 වර්ෂය සඳහා මහා නගර සභාව සතු බිම් තාවකාලිකව වෙළෙඳ කටයුතු වෙනුවෙන් බදු දීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

''252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතෙන් මහා නගර සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව, හම්බන්තොට මහා නගර සභා සීමාව තුළ පහත උපලේඛනයේ ඇති පරිදි මහා නගර සභාව සතු භූමි තාවකාලිකව බදු දීමේ ගාස්තු පනවා අයකිරීමටත්, තීරණය කර මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

	රු. ශත
වර්ග අඩි 01ක්	20 0
වෙළඳ ප්‍රවර්ධන ප්‍රචාරක කුඩා ලොරි රථයක් සඳහා	2,000 0
වෙළඳ ප්‍රවර්ධන ප්‍රචාරක මධ්‍යම ප්‍රමාණයේ ලොරි රථයක් සඳහා	2,500 0
වෙළඳ ප්‍රවර්ධන ප්‍රචාරක විශාල ප්‍රමාණයේ ලොරි රථයක් සඳහා	5,000 0

12 - 204/8

හම්බන්තොට මහා නගර සභාව

2025 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2025 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

''252 අධිකාරය වන මහා නගර සභා පනතේ 247 ඉ (1) හා (2) වගන්තිවලින් මහා නගර සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව, හම්බන්තොට මහා නගර සභා සීමාව තුළ යම් ඉඩමක් හිමිකරු විසින්, තැරැව්කරුවෙකු විසින්, වෙන්දේසිකරුවෙකු විසින්, ඔවුන්ගේ නියෝජිතයෙකු හෝ සේවකයෙකු විසින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකුණනු ලබන මුදලින් 1% ක මුදලක් ඉඩම විකුණනු ලබන පාර්ශ්වය විසින් හම්බන්තොට මහා නගර සභාව වෙත ගෙවිය යුතු බව තීරණය කර මෙයින් දැනුම් දෙමි.''

12 - 204/9

හම්බන්තොට මහා නගර සභාව

2025 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2025 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

''252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 247ඈ වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි කිසියම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර *නැනහොන්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි වන විටක, එවැනි යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්; හෝ
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක ; හෝ

එකී ඉඩම, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2025 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම පහක (0.5%) ක වාර්ෂික බද්දක් පැනවීමටත් එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2025 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු බව තීරණය කර මෙයින් දැනුම් දෙමි.''

12-204/10

හම්බන්තොට මහා නගර සභාව

2025 වර්ෂය සඳහා පුස්තකාල ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2025 වර්ෂය සඳහා පුස්තකාල ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

''හම්බන්තොට මහා නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 541/17 දරන 1989 ජනවාරි 20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 'පුස්තකාල' පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 7 වන සහ 12 වන වගන්තිවලට අනුව හම්බන්තොට මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී 7 වන අතුරු ව්‍යවස්ථාවේ (1) (ඇ) වන ඡේදයේ සඳහන් තැන්පත් මුදල.

පුස්තකාල ගාස්තු :

	රු. ශත
සාමාජික අයදුම්පත් ගාස්තු	100 0
වැඩිහිටි අනු පිටපත් සාමාජික ගාස්තු	300 0
ළමා සාමාජික ගාස්තු	500 0
ළමා අලුත් කිරීම්	200 0
ළමා අනුපිටපත් සාමාජික ගාස්තු	200 0
එක් දිනක් වෙනුවෙන් දඩ මුදල (එක් පොතකට)	5 0
අන්තර්ජාල ගාස්තු :	
1. පළමු පැයට	80 0
2. විනාඩි 30ක් සඳහා	40 0

	රු. ශත
ඡායා පිටපත් ගාස්තු :	
1. එක් පැත්තක් සඳහා	8 0
2. දෙපැත්ත සඳහා	15 0
ඩිජිටල් සාමාජික කාඩ්පත නැවත නිකුත් කිරීම සඳහා	500 0

විය යුතුය යන්න සහ මෙම තීරණය 2025 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද තීරණය කර මෙයින් දැනුම් දෙමි.

12 -204/11

හම්බන්තොට මහා නගර සභාව

2025 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2025 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

"හම්බන්තොට මහා නගර සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කරන පහත සඳහන් සේවා සහ වෙනත් ආනුෂංගික කාර්යයන් ඉටු කිරීමේ දී මහා නගර සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත්, මෙම සේවා ගාස්තු අය කිරීම 2025 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් තීරණය කර මෙයින් දැනුම් දෙමි''

අනු. අංකය	*සේවාව*	*ගාස්තුව රු. ශත*
01	ඔප්පු සාරංශ අයදුම්පත්	500 0
02	ඔප්පු සාරාංශයක් ලියාපදිංචි කිරීම	500 0
03	අතිරේක තක්සේරු දැන්වීමක් නිකුත් කිරීම	750 0
04	වරිපනම් සහතිකයක් නිකුත් කිරීම	1,000 0
05	මෘත දේහයක් භූමදනය සඳහා	250 0
06	භෂ්මාවශේෂ තැන්පත් කිරීම	200 0
07	රජයේ ශල්‍යාගාරවලින් ඉවත් කරන මෘතදේහ කොටස් මිහිදන් කිරීම	1,050 0
08	ආදාහනාගාරයක් රහිත සුසාන භූමියක සිහිවටන ඵලකයක් සඳහා	5,000 0
09	නගරය තුළ හා පොදු ස්ථානවල ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය (දිනකට)	1,000 0
10	ගුවන් යානයක් මහා නගර සභාව සතු ක්‍රීඩා භූමියකට ගොඩබැස්වීම සඳහා	15,000 0
11	මහජන පුස්තකාලයේ ඉහළ මහලේ ශාලාව බදු දීම (දිනකට)	5,000 0
12	පරිපාලන සංකීර්ණය අසල පුස්තකාල ගොඩනැගිල්ලෙහි රැස්වීම් ශාලාව බදුදීම	
	දිනකට ගාස්තු වායුසමීකරණ පහසුකම් සහිතව	15,000 0
	පැයක් සඳහා ගාස්තු වායුසමීකරණ පහසුකම් සහිතව	5,000 0
13	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ගාස්තු	1,000 0
14	කොම්පෝස්ට් පොහොර (කි.ග්‍රෑ.1)	10 0

12 - 204/12

හම්බන්තොට මහා නගර සභාව

2025 වර්ෂය සඳහා සේවා ගාස්තු හා වෙනත් ආදායම් ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2025 වර්ෂය සඳහා සේවා ගාස්තු හා වෙනත් ආදායම් ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

" හම්බන්තොට මහා නගර සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කරන පහත සඳහන් සේවා සහ වෙනත් අනුෂංගික කාර්යයන් ඉටු කිරීමේ දී මහා නගර සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත්, මෙම සේවා ගාස්තු අය කිරීම 2025 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය. "

සේවා සඳහා අය කරන ගාස්තු හා වෙනත් ආදායම් :

	වාහනය	*විස්තරය*	*ගාස්තුව (රු. ශත)*
01	බස් රථය	දිනකට කි.මී. 300 දක්වා (සභාවෙන් ඉන්ධන සපයා)	52,500.00
		වැඩිවන කි.මී. 01 ක් සඳහා	174.00
		වැඩිවන දිනක් සඳහා	10,000.00
		තවද කෙටි දුර සඳහා අවමය කි.මී. 60කි. වැඩි වන කි.මී. 1 ක් සඳහා රු. 174.00 කි. උපරිම රඳවා තබා ගැනීම කාලය පැය 08කි.	
02	ගලි රථය	එක් ගමන් වාරවාරයක් සඳහා ලීටර 1800	2,250.00
		යාමට සහ ඒමට ගතවන දුර සඳහා කි.මී. 1 කට	166.00
		එක් ගමන් වාරයක් සඳහා ලීටර් 4,000	4,500.00
		යාමට සහ ඒමට ගතවන දුර සඳහා එක් මී. පැ 1 සඳහා	2,060.00
03	බැක්හෝ යන්ත්‍රය	මීටර් පැය 01 ක් සඳහා (යාමට හා ඒමට මීටර් පැය ගණනය කරනු ලැබේ)	4,760.00
04	මෝටර් ග්‍රේඩරය	මීටර් පැය 01 ක් සඳහා (යාමට හා ඒමට මීටර් පැය ගණනය කරනු ලැබේ)	6,110.00
05	ටිපර් රථය	ටිපර් රථය අවම කි.මී. 20 දුරකට යටත්ව පැය 4 ක කාලයක් සඳහා කි. මී. 1කට	255.00
06	වතුර බවුසරය	ලීටර් 6000 ලොරි වතුර බවුසරය අවම කි.මී. 20 දුරකට යටත්ව පැය 4 ක රඳවා තබා ගැනීමේ කාලයකට යටත්ව එක් ගමන් වාරයකට	6,350.00
		වැඩිවන සෑම කි.මී. 1 ක් සඳහා	255.00
		වැඩිවන සෑම පැය 4 ක කාලයක් සඳහා	3,000.00
		ජලය ලීටර් 4000 බවුසරය සඳහා මීටර් පැය 3 ක උපරිම ධාවන දුරකට (යාමට සහ ඒමට) පැය 8 ක රඳවා තබා ගැනීමේ කාලයක් සඳහා	11,820.00
		ඉහත කාල සීමාව තුළ වැඩි වන එක් මීටර පැයක් සඳහා	3,300.00
		තවද ලීටර 4000 ජල බවුසරය කෙටිදුර මීටර් පැය 1 ක උපරිම ධාවන දුරක් සඳහා (යාමට සහ ඒමට) පැය 3 ක් රඳවා තබා ගැනීමේ කාලයක් සමඟ	4,200.00

	වාහනය	*විස්තරය*	*ගාස්තුව (රු. ශත)*
07	ට්‍රැක්ටර් රථ	මීටර් පැය 1 ක් සඳහා කම්කරුවන් රහිතව රඳවා ගැනීමේ කාලය පැය 4කට යටත්ව	2,370.00
		වැඩිවන සෑම මීටර් පැය 1 ක රඳවා තබා ගැනීමේ කාලයක් සඳහා	150.00
08	කම්පැක්ටර් රථය	ගමන් වාරයක් සඳහා (උපරිම දුර කි.මී. 10කි). (කම්කරුවන් දෙදෙනෙකු සමඟ, කසල ගාස්තුව රහිතව)	4,595.00
		වැඩි වන කි.මී. 01 ක් සඳහා	460.00

(ඉන්ධන, ලිහිසි තෙල් සහ අමතර කොටස් මිල වෙනස් වීම හේතුවෙන් ඉහත සඳහන් මිල ගණන් වෙනස් විය හැකිය. තවද ඉහත සඳහන් ගාස්තුවලට එකතු කළ අගය මත ඇතුළත් කළ යුතු බදු ඇතුළත් කර නොමැත.)

	විස්තරය	*ගාස්තුව (රු.ශත)*
01	අනතුරුදායක ගස් ඉවත් කිරීමේ අයදුම්පත්‍රය	500 0
02	මිශ්‍ර තැන්පත් මුදල	3,000 0
03	මාර්ග පළුදු කිරීම සඳහා ගමන් ගාස්තු	77 0
04	දීර්ඝ කාලීන බදු යටතේ ලබාදෙන ඉඩම් සහ අමාත්‍යාංශ වෙත ඉඩම් පැවරීම සඳහා නිර්දේශ ලබා දීමේ පරීක්ෂණ ගාස්තු	කි.මී. 01 ක් සඳහා රු. 77.00 (මෙම මුදල රටේ පවතින උද්දමනය සමඟ වෙනස් විය හැකිය)
05	ඉඩම් අනුබෙදුම් අයදුම්පත්‍ර ගාස්තුව	රු. 600.00 (දූනට භාවිතා කරනු ලබන ඉඩම් අනුබෙදුම් අයදුම් පත්‍රයෙහි ආකෘතිය ඉදිරි වර්ෂයේ දී වෙනස් කළ හොත් ඒ සඳහා යන වියදම අනුව ගාස්තුව වෙනස් විය හැකිය)
06	ගොඩනැගිලි සැළසුම් අයදුම්පත්‍ර ගාස්තුව	රු. 1,000.00 (දූනට භාවිතා කරනු ලබන ගොඩනැගිලි සැළසුම් අයදුම්පත්‍ර ආකෘතිය ඉදිරි වර්ෂයේදී වෙනස් කළ හොත් ඒ සඳහා යන වියදම අනුව ගාස්තුව වෙනස් විය හැකිය)
07	වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතිකපත්‍ර ගාස්තු	රු. 1,000.00

12-204/13

හම්බන්තොට මහා නගර සභාව

2025 වර්ෂය සඳහා ක්‍රීඩාපිටි සහ ක්‍රීඩා මණ්ඩපය වෙන් කිරීමේ ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2025 වර්ෂය සඳහා ක්‍රීඩාපිටිය සහ ක්‍රීඩා මණ්ඩපය වෙන් කිරීමේ ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

''හම්බන්තොට මහා නගර සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී හම්බන්තොට මහා නගර සභාව සතු ක්‍රීඩාපිටි හා ක්‍රීඩාංගණ වෙන් කිරීමේ ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත්, මෙම වෙන්කිරීමේ ගාස්තු අයකිරීම 2025 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.''

උපලේඛනය

ක්‍රීඩාංගණ ගාස්තු අය කිරීම :

අංකය	*විස්තරය*	*ආරක්ෂිත ඇප*	*ගාස්තු*	*වැඩිවන එක් දිනක් සඳහා අයකිරීම*
		රු.	*රු.*	*රු.*
01	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාංගණය මුදල් අයකරනු ලබන සංදර්ශනයකට භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට	50,000	12,000	5,000
02	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාංගණය නොමිලේ පවත්වනු ලබන සංදර්ශනයකට භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට	50,000	8,000	2,000
03	ක්‍රීඩාගාරය නොමිලේ පවත්වනු ලබන සංදර්ශනයක් වෙළඳ ප්‍රචාරණය සඳහා යොදාගනු ලබන්නේ නම් එක් දිනකට	20,000	5,000	2,000
04	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයක් හෝ රාජ්‍ය නොවන ආයතනයක් මගින් ක්‍රීඩා තරග/ තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට	10,000	5,000	2,000
05	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය රාජ්‍ය ආයතනයක් මගින් ක්‍රීඩා තරග/ තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට		3,000	
06	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය ප්‍රදේශයේ ක්‍රීඩා සමාජයක් ක්‍රීඩා තරගයක්/තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට		2,000	
07	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය ප්‍රදේශයේ පාසල් ක්‍රීඩා තරගයක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට		1,000	
08	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය, මහා නගර සභා බල ප්‍රදේශයෙන් බැහැර පාසල් ක්‍රීඩා තරගයක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට		2,000	
09	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය මෙම බල ප්‍රදේශයෙන් බැහැර ක්‍රීඩා සමාජයක් ක්‍රීඩා තරගයක් /තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට	10,000	5,000	2,000
10	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය ප්‍රදේශයේ ක්‍රීඩා සමාජයක් මුදල් අයකර පවත්වනු ලබන ක්‍රීඩා තරගයක්/තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට	10,000	5,000	

අංකය	*විස්තරය*	*ආරක්ෂිත ඇප*	*ගාස්තු*	*වැඩිවන එක් දිනක් සඳහා අයකිරීම*
		රු.	*රු.*	*රු.*
11	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය සැණකෙළියක් (කානිවල්) හෝ මුදල් අය කරනු ලබන වෙනත් කාර්යයක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් මුල් දින 05 සඳහා	100,000	30,000	5,000
12	ඉහත ගාස්තුවලට අමතරව විදුලි හා ජල ගාස්තු ගෙවීම (උදෑසන 8.00 සිට පස්වරු 5.00 දක්වා) වැඩිවන සෑම පැයකටම රු. 300 ක ගාස්තුවක් අය කරනු ලැබේ.)		1,500	

12-204/14

හම්බන්තොට මහා නගර සභාව

2025 වර්ෂය සඳහා හම්බන්තොට වෙරළ උද්‍යානය වෙන් කිරීමේ ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2025 වර්ෂය සඳහා හම්බන්තොට වෙරළ උද්‍යානය වෙන් කිරීමේ ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

''හම්බන්තොට වෙරළ උද්‍යානය වෙන් කිරීමේ ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත් මෙම වෙන් කිරීමේ ගාස්තු අය කිරීම 2025 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් තීරණය කර මෙයින් දැනුම් දෙමි.''

වෙරළ උද්‍යානය වෙන් කිරීමේ ගාස්තු අය කිරීම :

අංකය	*විස්තරය*	*ආරක්ෂිත ඇප*	*ගාස්තු*	*වැඩිවන එක් දිනක් සඳහා අයකිරීම*
		රු.	*රු.*	*රු.*
01	වොලිබෝල් ක්‍රීඩා පිටිය මුදල් අය කරනු ලබන සංදර්ශනයකට භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට	30,000	10,000	3,000
02	වොලිබෝල් ක්‍රීඩා පිටිය නොමිලේ පවත්වනු ලබන සංදර්ශනයකට භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට	30,000	5,000	3,000
03	ක්‍රීඩාංගනය නොමිලේ පවත්වනු ලබන සංදර්ශනයක් සැණකෙළියක් සඳහා යෙදවාගනු ලබන්නේ නම් එක් දිනකට	30,000	10,000	3,000
08	වෙරළ උද්‍යානය සැණකෙළියක් (කානිවල්) හෝ මුදල් අය කරනු ලබන වෙනත් කාර්යයක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම්	100,000	30,000	5,000

අංකය	*විස්තරය*	*ආරක්ෂිත ඇප*	*ගාස්තු*	*වැඩිවන එක් දිනක් සඳහා අයකිරීම*
		රු.	*රු.*	*රු.*
05	ඉහත ගාස්තුවලට අමතරව විදුලි හා ජල ගාස්තු ගෙවීම (උදෑසන 8.00 සිට පස්වරු 5.00 දක්වා) වැඩිවන සෑම පැයකටම රු. 500 ක ගාස්තුවක් අය කරනු ලැබේ.		2,500	
06	වොලිබෝල් ක්‍රීඩා පිටිය ක්‍රීඩා තරගයක් පැවැත්වීම සඳහා භාවිතා කරනු ලබන්නේ නම් (එක් දනකට)	10,000	10,000	3,000

12-204/15

හම්බන්තොට මහා නගර සභාව

2025 වර්ෂය සඳහා කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2025 වර්ෂය සඳහා කසළ බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

2025 වර්ෂය සඳහා කසළ ගාස්තු, හම්බන්තොට මහා නගර සභාව විසින් පහත වගුවෙහි සඳහන් ආකාරයට අය කිරීමට තීරණය කර ඇතිබව මෙයින් දැනුම් දෙමි.

කසළ වර්ගය	
දිරන කසළ	රු. 3.00 (කිලෝග්‍රෑම් 1ක් සඳහා අය කිරීම දිනකට)
නොදිරන කසළ	රු. 9.00 (කිලෝග්‍රෑම් 1ක් සඳහා අය කිරීම දිනකට)
කර්මාන්ත ශාලා අපද්‍රව්‍ය	රු. 20.00 (කිලෝග්‍රෑම් 1ක් සඳහා අය කිරීම දිනකට)
කඩා ඉවත් කරන ලද ගොඩනැගිලි සුන්බුන් (උළු කැබලි, ගඩොල් කැබලි, බදාම කැබලි)	රු. 750.00 (කියුබ් 1 ක් සඳහා)
වෙනත් අපද්‍රව්‍ය	රු. 30.00 (කිලෝග්‍රෑම් 1ක් සඳහා අය කිරීම දිනකට)

* වෙනත් අපද්‍රව්‍ය - මහා නගර සභාව විසින් කලින් කල තීරණය කරන පරිදි වේ.

තව ද මහා නගර සභා බල ප්‍රදේශය තුළ දෛනිකව කසළ බැහැර කරනු ලබන ව්‍යාපාරික ආයතනවලින් කසළ ගාස්තු අය කිරීමේ දී මසකට ලබා දෙනු ලබන කසළ ප්‍රමාණය කිලෝග්‍රෑම් 50ට අඩු නම් මාසික ගාස්තුව ලෙස රු. 100.00 ක මුදලක් ද, කසළ ප්‍රමාණය කිලෝග්‍රෑම් 50-200 අතර නම් මාසික ගාස්තුව ලෙස රු. 200.00 ක මුදලක් ද, කසළ ප්‍රමාණය කිලෝග්‍රෑම් 200ට වැඩි නම් ඉහත වගුවේ සඳහන් පරිදි කිලෝග්‍රෑම් ප්‍රමාණය අනුව ගාස්තු අය කරනු ලැබේ.

12-204/16

හම්බන්තොට මහා නගර සභාව

2025 වර්ෂය සඳහා මාගම්පුර දිවා සුරැකුම් පහසුකම් සහිත මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය සඳහා දරුවන් ඇතුළත් කර ගැනීමේදී සිදු කරනු ලබන අයකිරීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

2023.02.09 දින හම්බන්තොට මහා නගර සභාවේ පවත්වන ලද මහා සභාවේ තීරණය පරිදි සහ 2023.07.21 දින හම්බන්තොට මහා නගර සභාවේ පවත්වන ලද ප්‍රජා කාරක සභාවේ නිර්දේශය පරිදි මාගම්පුර දිවා සුරැකුම් පහසුකම් සහිත මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයට දරුවන් ඇතුළත් කර ගැනීම සඳහා සිදුකරනු ලබන අයකිරීම් මෙසේ හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නීය.

දිවා සුරැකුම් මධ්‍යස්ථානය වෙත දරුවන් ඇතුළත් කිරීම

- ✓ ඇතුළත් කර ගනු ලබන ළමුන් ප්‍රමාණය 12 කි.
    - වයස අවුරුදු 2ත් 5ත් අතර දරුවන් සඳහා මාසික අයකිරීම රු. 6,500.00 කි.
    - වයස අවුරුදු 6 ත් 12 ත් අතර දරුවන් සඳහා මාසික අයකිරීම රු. 4,000.00 කි.
    - එක් පවුලකින් වයස අවුරුදු 2-5 ත් අතර දරුවන් දෙදෙනෙක් පැමිණෙන්නේ නම් දරුවන් දෙදෙනා සඳහා මාසික අයකිරීම රු. 9,000.00 කි.
    - එක් පවුලකින් වයස අවුරුදු 6-12 ත් අතර දරුවන් දෙදෙනෙක් පැමිණෙන්නේ නම් දරුවන් දෙදෙනා සඳහා මාසික අයකිරීම රු. 6,000.00 කි.
    - එක් පවුලකින් වයස අවුරුදු 2ත් 5ත් අතර දරුවෙක් සහ වයස අවුරුදු 6-12 ත් අතර දරුවෙක් පැමිණෙන්නේ නම් දරුවන් දෙදෙනා සඳහාම මාසික අයකිරීම රු. 8,500.00 කි.
    - දරුවන්ගේ අයකිරීම් සෑම මසකම මුල් සතියේ සිදු කළ යුතුය.

මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය වෙත දරුවන් ඇතුළත් කර ගැනීම

- ✓ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය සඳහා ඇතුළත් කර ගනු ලබන ළමුන් ප්‍රමාණය - 20 කි.
    - එක් දරුවෙක් සඳහා පෙර පාසලෙහි මාසික අයකිරීම රු. 1,500.00 කි.

මෙම *ගැසට්* නිවේදනය සම්බන්ධව භාෂාවල යම් නොගැලපීමක් ඇති වුවහොත් සිංහල භාෂා පිටපත ප්‍රමුඛ වේ.

12-204/17

හම්බන්තොට මහා නගර සභාව

හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය තුළ කිසියම් සංචාරක වෙළඳාම් කටයුත්තක් පවත්වාගෙන යාමේ ස්ථානයක් සඳහා මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ 2025 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2025 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

2024 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

''හම්බන්තොට මහා නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 2013 මැයි 17 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ XIX යන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව මෙහි පහත උපලේඛනයේ I වන කොටසේ සඳහන් කිසියම් සංචාරක වෙළඳ කටයුත්තක් 2025 වර්ෂයේ දී කරගෙන යනු ලබ අවස්ථාවක, එකී සංචාරක වෙළඳාම පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා හම්බන්තොට මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයාගෙන් බලපත්‍රයක් ලබා ගත යුතු බවත්, එසේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රය් වෙනුවෙන්ම පහත සඳහන් උපලේඛනයේ 2 වන කොටසේ ඇතුළත් වූ බලපත්‍ර ගාස්තුවක් සභාවට ගෙවිය යුතු බව තීරණය කර මෙයින් දන්වා සිටිමි.

සංචාරක වෙළඳුන් සඳහා බලපත්‍ර ගාස්තු අය කිරීම :

අංකය	*ව්‍යාපාරයේ ස්වභාවය*	*බලපත්‍ර ගාස්තුවක් II තීරය*		
		මාසයක් සඳහා	*මාස හයක් සඳහා*	*අවුරුද්දක් සඳහා*
		රු.	*රු.*	*රු.*
01	රටකජු වෙළඳාම	100 0	200 0	300 0
02	තැඹිලි, කුරුම්බා වෙළඳාම	100 0	200 0	300 0
03	විදුලි උපකරණ අලෙවිය	100 0	200 0	300 0
04	පලතුරු වර්ග විකිණීම	100 0	200 0	300 0
05	එළවළු විකිණීම	100 0	200 0	300 0
06	කඩල, වඩේ, බයිට්ස්, මුරුක්කු වර්ග වෙළඳාම	100 0	200 0	300 0
07	පාවහන් වෙළඳාම	100 0	200 0	300 0
08	මල් පැළ, එළවළු පැළ හා පලතුරු පැළ අලෙවිය	100 0	200 0	300 0
09	පොත්, පත්තර වෙළඳාම	100 0	200 0	300 0
10	ධාන්‍ය වර්ග පැකට් කර විකිණීම	100 0	200 0	300 0
11	ලොතරැයි අලෙවිය	100 0	200 0	300 0
12	ඔරලෝසු වෙළඳාම	100 0	200 0	300 0
13	රෙදි වෙළඳාම	100 0	200 0	300 0
14	බුලත් විට වෙළඳාම	100 0	200 0	300 0
15	පොරි නිෂ්පාදනය හා විකිණීම	100 0	200 0	300 0
16	රබර් කාපට්, පාපිසි විකිණීම	100 0	200 0	300 0
17	ඉරිඟු වෙළඳාම	100 0	200 0	300 0
18	සෙල්ලම් බඩු වෙළඳාම	100 0	200 0	300 0
19	ඇලුමිනියම්, ප්ලාස්ටික් බඩු වෙළඳාම	100 0	200 0	300 0
20	සුවඳ විලවුන් පර්ස්, බෑග් විකිණීම	100 0	200 0	300 0
21	රඹුටන් වෙළඳාම	100 0	200 0	300 0
22	දූරියන් වෙළඳාම	100 0	200 0	300 0
23	ගල් සියඹලා වෙළඳාම	100 0	200 0	300 0
24	කොමඩු වෙළඳාම	100 0	200 0	300 0
25	නාරං	100 0	200 0	300 0
26	වෙනත්	100 0	200 0	300 0

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය කර්තව්‍ය ඉටු කරන, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. කේ. කපිල ජගත් ගුණතිලක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) උප වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134 වන වගන්තියේ (1) උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ, නොවැම්බර් මස 06 දින තීරණ අංක 26 යටතේ ගන්නට යෙදුන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. කේ. කපිල ජගත් ගුණතිලක,
ලේකම් හා බලතල කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 06 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

තීරණය

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය කර්තව්‍ය ඉටු කරන, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. කේ. කපිල ජගත් ගුණතිලක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) උප වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134 වන වගන්තියේ (1) උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බව තීරණය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1635 හා 2010.01.01 දිනැති *ගැසට් පත්‍රය* යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2023 වර්ෂය සඳහා වූ තක්සේරුව 2025 වර්ෂය සඳහා තක්සේරුව ලෙස සම්මත කළයුතු බවටත්, එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ 3 වන උප වගන්තිය සමඟ කියවිය යුතු 134 වන වගන්තියේ 1 වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපල මත ඉහත කී තක්සේරුව සඳහා

1. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ප්‍රදේශයේ දියුණු ගම් වශයෙන් ප්‍රකාශිත ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චිත දේපලක් මත සියයට හයක (6%) වරිපනමක් ද,

2. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශයේ මාරපන උප කාර්යාලය පිහිටි ප්‍රදේශයේ දියුණු ගම් වශයෙන් ප්‍රකාශිත ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපලක් මත සියයට හතරක (4%) වරිපනමක් ද, නියම විය යුතු බවටත්,

තවද, 2025 වර්ෂයෙහි මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 දිනයන්ට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2025 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, කාර්තු වශයෙන් අදාළ වරිපනම් බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එකී කාර්තුවේ පළමු මාසය තුළදී අදාළ මුදලින් 5% ක වට්ටමක්ද ප්‍රාදේශීය සභාව විසින් ලබාදිය යුතු බවටත් තීරණය කරමි.

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය කර්තව්‍ය ඉටු කරන, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. කේ. කපිල ජගත් ගුණතිලක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) උප වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134 වන වගන්තියේ (3) උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව අක්කර බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ, නොවැම්බර් මස 06 දින තීරණ අංක 27 යටතේ ගන්නට යෙදුන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. කේ. කපිල ජගත් ගුණතිලක,
ලේකම් හා බලතල කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 06 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

තීරණය

පැල්ඩුල්ල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. කේ. කපිල ජගත් ගුණතිලක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) උප වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134 වන වගන්තියේ (3) වන උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සහා සීමා ඇතුලත පිහිටියා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ හෙක්ටයාර් එකක් (01) වන 2025 වර්ෂය සඳහා රු. 10.00 ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කළ යුතු බවටත්,

තව ද, ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උප වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අක්කර බද්ද නියම කිරීමේ හා අයකිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් සලකනු ලබන බව අංක 544(IV) ඇ හා 1989.02.03 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති නියමයට ඇතුළත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ සෑම ඉඩමක් වෙනුවෙන්ම 2025 වර්ෂයට රුපියල් 50.00 බැගින්ද, ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහට වැඩිවන අවස්ථාවක රුපියල් 50.00ට අමතරව වැඩිවන සෑම හෙක්ටයාරක්ම සඳහා රුපියල් 10.00 බැගින්ද, 2025 වර්ෂය සඳහා වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට මම තීරණය කරමි.

තව ද, 2024 වර්ෂයෙහි පහත උපලේඛන අක්කර බදු සඳහා පදනම් කොට ගත් සත්‍යෝක්ෂණය 2025 වසර සඳහාද සත්‍යෝක්ෂණය ලෙස පිළිගැනීමටත් තවද, 2025 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද 2025 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද, එකී උප ලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ අක්කර බදු මුදල පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට මුදලින් 5%ක වට්ටමක්ද පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් ලබා දිය යුතු බවටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය ප්‍රකාරව මම තීරණය කරමි.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% ක වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2025 මාර්තු 31	2025 ජනවාරි 31
දෙවන කාර්කතුව	2025 ජුනි 30	2025 අප්‍රේල් 30
තුන්වන කාර්තුව	2025 සැප්තැම්බර් 30	2025 ජූලි 31
හතරවන කාර්තුව	2025 දෙසැම්බර් 31	2025 ඔක්තෝබර් 31

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. කේ. කපිල ජගත් ගුණතිලක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) උප වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 150(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළ කර්මාන්ත බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 06 වැනි දින තීරණ අංක 28 යටතේ ගන්නට යෙදුන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. කේ. කපිල ජගත් ගුණතිලක,
ලේකම් හා බලතල කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 06 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම ලේඛනයෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2025 වර්ෂය සඳහා නියම කර අය කිරීමක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය ප්‍රකාරව මම තීරණය කරමි.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්ත බදු*	*II වැනි තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ස්වර්ණාභරණ නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
02.	වාස්තු කර්මාන්තය	500 0	750 0	1,000 0
03.	විසිතුරු භාණ්ඩ නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
04.	කුළු බඩු / කසාය බඩු / බෙහෙත් ද්‍රව්‍ය පැකට් කිරීම	500 0	750 0	1,000 0
05.	පිංතූර රාමු කිරීම	500 0	750 0	1,000 0
06.	මැටි භාණ්ඩ නිපදවීම හා අලෙවිය	500 0	750 0	1,000 0
07.	කෘතිම මල් නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
08.	රූපවාහිනී ඇන්ටනා නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
09.	ධාන්‍ය ඇට පැකට් කිරීම	500 0	750 0	1,000 0
10.	තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	ලියුම් කවර හෝ වෙනත් කවර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
12.	මෙට්ට නිෂ්පාදනය	500 0	750 0	1,000 0
13.	හඳුන්කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
14.	බෑග් වර්ග මැසීම හා විකිණීම	500 0	750 0	1,000 0
15.	ඔරලෝසු අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
16.	පිත්තල භාණ්ඩ නිපදවීම හා අලෙවිය	500 0	750 0	1,000 0
17.	ඇඳුම් මැසීම	500 0	750 0	1,000 0
18.	ස්ටිකර් කැපීම / දැන්වීම් / නාමපුවරු සැකසීම	500 0	750 0	1,000 0
19.	යතුරු කැපීම / සීල් කැපීම	500 0	750 0	1,000 0

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. කේ. කපිල ජගත් ගුණතිලක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) උප වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 152(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළ ව්‍යාපාර බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 06 වැනි දින තීරණ අංක 29 යටතේ ගන්නට යෙදුන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. කේ. කපිල ජගත් ගුණතිලක,
ලේකම් හා බලතල කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 06 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍යය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2025 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තකුගෙන්ම එම ව්‍යාපාරයේ 2024 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවෙන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණයට ව්‍යාපාර බද්දක් 2025 වර්ෂය සඳහා නියම කර අය කිරීමට, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව		**II** *වැනි තීරුව*
බද්ද අදාළවන වර්ෂයට පෙර 2024 වර්ෂයේ ව්‍යාපාරයේ ලත් ලැබීම් ප්‍රමාණය		*ගෙවිය යුතු බද්ද රු. ශත*
01.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	අයකිරීමක් නැත
02.	රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
03.	රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
04.	රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
05.	රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
06.	රු. 150,000 ඉක්මවන විට	3,000 0

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථාව යටතේ 2025 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ පැල්මඩුල්ල ප්‍රදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව මම තීරණය කරමි.

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විටදී, ඊට අදාළ බලපත්‍ර ලබා දීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2024 වර්ෂයේ ආදායමින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මම තීරණය කරමි.

ආර්. කේ. කපිල ජගත් ගුණතිලක,
ලේකම් හා බලතල කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 06 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

අංක 01 උපලේඛනය - අන්තරායදායක ව්‍යාපාර

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*II වැනි තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	වඩු කර්මාන්තය	500 0	750 0	1,000 0
02.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ විකිණීම	500 0	750 0	1,000 0
03.	ගඩොල් හෝ උළු නිපදවීම හෝ විකිණීම	500 0	750 0	1,000 0
04.	පාවහන් අලුත්වැඩියාව හා නිෂ්පාදනය	500 0	750 0	1,000 0
05.	බ්ලොක් ගල් නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
06.	ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	ග්‍රිල් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	සිමෙන්ති භාණ්ඩ නිපදවීම / විකිණීම	500 0	750 0	1,000 0
09.	පත්තර රැස්කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
10.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	තේ කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
12.	ගල් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	ගල් මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අංක 02 උපලේඛනය - අප්‍රසන්න ව්‍යාපාර

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*II වැනි තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම (රුපියල්)*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	සත්ත්ව ආහාර අලෙවිය	500 0	750 0	1,000 0
02.	ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය විකිණීම	500 0	750 0	1,000 0
03.	කෘත්‍රිම පොහොර අලෙවිය	500 0	750 0	1,000 0
04.	පැණි, හකුරු නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
05.	අයිස්ක්‍රීම් / අයිස් පැකට් / යෝගට් විකිණීම	500 0	750 0	1,000 0
06.	රබර් මිලට ගැනීම හා විකිණීම	500 0	750 0	1,000 0
07.	රා එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	කුරුඳු මිලට ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	කුල් ස්පොට් එකක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	නූඩ්ල්ස් / ඉදිආප්ප / ක්ෂණික ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
11.	මෝටර් සයිකල් අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
12.	ශීත කළ මස් මාළු විකිණීම	500 0	750 0	1,000 0
13.	එළවළු වෙළඳාම	500 0	500 0	1,000 0
14.	පළතුරු වෙළඳාම	500 0	750 0	1,000 0
15.	සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
16.	සංචාරක වෙළඳාම	500 0	750 0	1,000 0
17.	තේ කුඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	මස් පිණිස සත්ත්ව ඝාතන මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	භෝජනාගාරයක් / බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	එළකිරි එකතු කිරීමේ හෝ වෙළඳාම් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	කේක් වර්ග අලෙවිය	500 0	750 0	1,000 0
26.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	සත්ත්ව ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0

අංක 03 උපලේඛනය - අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*II වැනි තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම (රුපියල්)*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	වැල්ඩින් කිරීම	500 0	750 0	1,000 0
02.	හුණු පිලිස්සීම	500 0	750 0	1,000 0
03.	ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
04.	මැණික් කැපීම හා ඔප දැමීම	500 0	750 0	1,000 0
05.	කෘෂි රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
06.	ගල් ස්මාරක හෝ ගලින් කරන ලද භාණ්ඩ අලෙවිය	500 0	750 0	1,000 0
07.	යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිපදවීම	500 0	750 0	1,000 0
08.	හුණු පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	ලෝහ තහඩුවලින් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10.	විදුලි උපකරණ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
11.	ලියවන පට්ටල් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	පැරණි යකඩ බඩු මිලට ගැනීම හා විකිණීම	500 0	750 0	1,000 0
13.	බැටරි චාර්ජ් කිරීම	500 0	500 0	1,000 0
14.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	රසකැවිලි නිපදවීම / අලෙවිය	500 0	750 0	1,000 0
16.	ඉංග්‍රීසි බෙහෙත් ශාලා	500 0	750 0	1,000 0
17.	ආයුර්වේද බෙහෙත් ශාලා	500 0	750 0	1,000 0
18.	මෝටර් රථ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
19.	ත්‍රිරෝද රථ අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
20.	රබර් කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
21.	අයිස්ක්‍රීම්/අයිස් පැකට්/යෝගට් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	සිසිල් බීම නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	නවාතැන් ගන්නා ස්ථානයක් / තානායමක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	වාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	වී මෝලක්/ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	ලුහු කර්මාන්තය (කම්මල් කර්මාන්තය)	500 0	750 0	1,000 0
31.	වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-221/5

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. කේ. කපිල ජගත් ගුණතිලක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) උපවගන්තිය සමඟ කියවිය

යුතු එම පනතේ 147 වන හා 148 වන වගන්තිවල විධිවිධාන ප්‍රකාරව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 06 වැනි දින තීරණ අංක 30 යටතේ ගන්නට යෙදුන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. කේ. කපිල ජගත් ගුණතිලක,
ලේකම් හා බලතල කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 06 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	රු. ශත
• මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා කාර්තුවකට	25 0
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -	
(අ) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම්	4 0
• සෑම කරත්තයක් සඳහා	10 0
• සෑම අත් කරත්තයක් සඳහා	10 0
• සෑම රික්ෂෝවක් සඳහා	7 50
• සෑම අශ්වයකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
• සෑම ඇතෙකු සඳහා	50 0

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ "වෙළඳ කාර්ය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-221/6

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අයකිරීම

පැල්ඩුල්ල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. කේ. කපිල ජගත් ගුණතිලක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) උප වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 220 (අ), 122 හා 126 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට

අදාළ ප්‍රචාරක දැන්වීම් මත බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 06 වැනි දින තීරණ අංක 31 යටතේ ගන්නට යෙදුන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. කේ. කපිල ජගත් ගුණතිලක,
ලේකම් හා බලතල කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 06 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාවට ඇතුලත් වූ ප්‍රදේශයෙහි ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා පහත සඳහන් අනු ප්‍රමාණ අනුව වූ ගාස්තුවක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම තීරණය කරමි.

උපලේඛනය

		රු. ශත
01.	බිත්තියක හා පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීම් සඳහා සෑම ව. අ. 01කට - වර්ෂයකට	150 0
02.	ඩිජිටල් දැන්වීම් පුවරු සඳහා ව.අ. එකකට	300 0
03.	බැනරයක් හෝ කටවුට් මගින් ප්‍රදර්ශනය කිරීම	
	මාසයක කාලයක් සඳහා ව. අ. 01කට	75 0
	මාස 03ක කාලයක් සඳහා ව. අ. 01කට	100 0
	මාස 03කට වැඩි කාලයක් සඳහා ව. අ. 01කට	150 0

12-221/7

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු අය කිරීම

පැල්ඩුල්ල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. කේ. කපිල ජගත් ගුණතිලක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) උප වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 153 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළ සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 06 වැනි දින තීරණ අංක 32 යටතේ ගන්නට යෙදුන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. කේ. කපිල ජගත් ගුණතිලක,
ලේකම් හා බලතල කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 06 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) (ආ) ඡේදය යටතේ වන ''සමානුපාතය'' වශයෙන් අදාළ ඉඩමේ ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 1 : 7 ක් වන සේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට 2%ක් වන බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12-221/8

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා සතිපොළ බදු අයකිරීම

පැල්ඩුල්ල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. කේ. කපිල ජගත් ගුණතිලක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) උප වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 119 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළ සතිපොළ ගාස්තු සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ 2024 ක් වූ නොවැම්බර් මස 06 වැනි දින තීරණ අංක 33 යටතේ ගන්නට යෙදුන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. කේ. කපිල ජගත් ගුණතිලක,
ලේකම් හා බලතල කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 06 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

		රු. ශත
01.	සතිපොළ ගොඩනැගිල්ල ඇතුළත ස්ථිර වෙළඳ ස්ථානයක් සඳහා	250 0
02.	සතිපොළ භූමිය තුළ තාවකාලික වෙළඳ ස්ථානයක් සඳහා	200 0
03.	මාර්ගය දෙපස තාවකාලික වෙළඳ ස්ථාන සඳහා	180 0
04.	වෙනත් සුළු වෙළඳුන් සඳහා (ජංගම වෑන් රථයක්/ත්‍රිරෝද රථය වැනි)	150 0

12-221/9

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා සපයනු ලබන සේවාවන් හා ආකෘතිපත්‍ර වෙනුවෙන් ගාස්තු අයකිරීම

පැල්ඩුල්ල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. කේ. කපිල ජගත් ගුණතිලක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) උප වගන්තිය අනුව, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළ වෙනත් ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ 2024 ක් වූ නොවැම්බර් මස 06 වැනි දින තීරණ අංක 34 යටතේ ගන්නට යෙදුන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. කේ. කපිල ජගත් ගුණතිලක,
ලේකම් හා බලතල කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 06 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

යෝජනාව

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන යම් යම් සේවාවන් හෝ පහසුකම් වෙනුවෙන් ඒ සඳහා විශේෂ වූ ගාස්තුවක් 2025 වර්ෂය සඳහා පහත පරිදි අය කිරීමට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

		රු. ශත
01.	වරිපනම් නම් වෙනස් කිරීමේ පෝරම ගාස්තු	1,000 0
02.	වීථි රේඛා සහ ගොඩනැගිලි සීමා ගාස්තු	1,500 0
03.	වරිපනම් ගෙවන බවට සහතික නිකුත් කිරීම	1,000 0
04.	විදුලිය ලබා ගැනීම සඳහා සහතික නිකුත් කිරීම	500 0
05.	ලේඛනවල පිටපත් නිකුත් කිරීම	150 0
06.	වසර දෙකකට වඩා පැරණි ලේඛන සෙවීම වර්ෂයකට	100 0
07.	වරිපනම් නොගෙවන බවට සහතික නිකුත් කිරීම	150 0
08.	අනතුරුදායක ගස් ඉවත් කිරීමේ පෝරම ගාස්තු	1,000 0
09.	ජල බවුසරය ලබා දීම (ලීටර් 5,000) දිනකට	7,500 0
10.	අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා ගාස්තු දිනකට	5,000 0
11.	සභාව සතු භූමිය කුළියට දීම - එක් දිනකට	7,500 0
12.	ඉඩම් වෙන්දේසි, ප්‍රසිද්ධ රැගුම් සඳහා බලපත්‍ර ලබා දීම	500 0
13.	ප්‍රවර්ධන වැඩසටහන් සඳහා අයදුම්පත් ගාස්තු	25 0
14.	දැන්වීම්/බැනර්/කටවුට් ප්‍රදර්ශනය සඳහා අයදුම්පත්‍ර ගාස්තු	25 0
15.	ජලය ලබා ගැනීමට මාර්ගය පළුදු කිරීම - (පරීක්ෂා කිරීම සඳහා සේවා ගාස්තු)	1,000 0 0
16.	බැකෝ යන්ත්‍රය ලබා දීම (එක් පැයක් සඳහා)	6,000 0
17.	GI-I හෝ GI-L හැඩයෙහි එක් කොඩි කණුවක් කුළියට දීමේ ගාස්තු දිනකට	30 0
18.	ගලි බවුසරය ලබා දීම (ලෝඩ් 1ක් වෙනුවෙන්) :	
	ආයතනයක් සඳහා	2,500 0
	නිවසක් සඳහා	2,000 0
	අයදුම්පත් ගාස්තුව	25 0
	අවසාන බැහැරලීම සඳහා	1,000 0
	සේවක ගාස්තු	1,500 0
	ප්‍රවාහන ගාස්තුව කි. මී. 1ක් සඳහා	200 0 බැගින්
	මීට අමතරව ඉල්ලුම්කරු හට බැහැරලීම සඳහා ස්ථානයක් තිබෙනම් අවසාන බැහැරලීම සඳහා අයකරනු ලබන රු. 1,000.00 ක ගාස්තුවෙන් නිදහස් කරයි.	
19.	ගොඩනැගිලි අයදුම්පතක් නිකුත් කිරීම (නා. සං. අධිකාරි ප්‍රදේශයට අයත් නොවන)	500 0

		රු. ශත
ගොඩනැගිලි අයදුම්පතක් නිකුත් කිරීම (නාගරික සංවර්ධන අධිකාරි ප්‍රදේශයට අයත්වන)		1,000 0
20. පුස්තකාල අයදුම්පත් ගාස්තු		10.00
පුස්තකාල සාමාජික ගාස්තු	පාසල් ළමුන් සඳහා	50.00
සාමාජිකත්වය අළුත්කිරීම	පාසල් ළමුන් සඳහා	15.00
පුත්තකාල සාමාජික ගාස්තු	වැඩිහිටියන් සඳහා	100.00
සාමාජිකත්වය අළුත්කිරීම	වැඩිහිටියන් සඳහා	30.00
පුස්තකාල දඩ මුදල් දිනකට		2.00

21. පරිසර බලපත්‍ර ස්ථාන පරීක්ෂණ ගාස්තු අය කිරීම මධ්‍යම පරිසර අධිකාරි පනත හා රෙගුලාසි අනුව සිදුකරනු ලැබේ.

22. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ භෞතික සැලසුම් කාර්යයන් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත්කර ඇති නාගරික සංවර්ධන අධිකාරි ප්‍රදේශය තුළ භෞතික සැලසුම් කාර්යයන් සඳහා වන ගාස්තු අය කිරීමේ දී 2021.07.08 වන දිනැති අංක 2235/54 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* සඳහන් ගාස්තු උපලේඛනයන්ට අනුකූලව සිදු කෙරේ.

3. කිරිදි ඇල්ල ප්‍රවේශ මාර්ගය භාවිතා කරමින් කිරිදි ඇල්ල නැරඹීම සඳහා නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍ර එනම්,

වැඩිහිටි	රු. 100 0
ළමා	රු. 50 0
විදේශ	ඩොලර් 5

24. ඉඩම් අනුබෙදුම් සඳහා

ඉඩමේ ප්‍රමාණය (ව. මී.)	*පෙරසැරි ගාස්තු* *රු. ශ.*
ව.මී. 150 - ව. මී. 300 කැබලි 1 ක් සඳහා	1,000 0
ව.මී. 301 - ව. මී. 600 කැබලි 600 කැබලි 1ක් සඳහා	800 0
ව.මී. 601 - ව. මී. 900 කැබලි 1 ක් සඳහා	600 0
ව.මී. 900 ට වැඩි කැබලි 1ක් සඳහා	500 0

නේවාසික හා නේවාසික නොවන ගොඩනැගිලි

ගෙබිම් ප්‍රමාණය (ව.මී. 1කට)	නේවාසික (ව.මීටර් 1කට)	නේවාසික නොවන (ව.මීටර් 1කට)	නේවාසික නොවන (ව.මීටර් 1කට)
	තනි පුද්ගල	මහල් නිවාස	
ව.මී. 400 දක්වා	රු. 20 0	රු. 25 0	රු. 25 0
ව.මී. 401 - 1000	රු. 22 0	රු. 27 0	රු. 27 0
ව.මී. 1001 - 1500	රු. 25 0	රු. 30 0	රු. 30 0

ගෙබිම් ප්‍රමාණය (ව.මී. 1කට)	නේවාසික (ව.මීටර් 1කට)	නේවාසික නොවන (ව.මීටර් 1කට)	නේවාසික නොවන (ව.මීටර් 1කට)
	තනි පුද්ගල	මහල් නිවාස	
ව.මී. 1501 - 2000	රු. 25 0	රු. 32 0	රු. 32 0
ව.මී. 2000 ට වැඩි	වැඩිවන සෑම ව.මී.90 ක් සඳහාම රු. 2,000.00 බැගින්	වැඩිවන සෑම ව.මී.90 ක් සඳහාම රු. 2,000.00 බැගින්	වැඩිවන සෑම ව.මී.90 ක් සඳහාම රු. 2,000.00 බැගින්

12-221/10

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා කසළ ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වැනි උපවගන්තිය අනුව පැල්ඩුල්ල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. කේ. කපිල ජගත් ගුණතිලක වන පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා කසළ ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය - 2024 ක් වූ නොවැම්බර් මස 06 වැනි දින තීරණ අංක 35 යටතේ ගන්නට යෙදුන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 ix(ආ) යටතේ පනවා ගන්නා ලද අතුරු ව්‍යවස්ථාවට අනුව සම්මත කර ගත් අංක 2274-2022 අප්‍රේල් 01 වන දින *රජයේ ගැසට්* පත්‍රයේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවට අනුව පහත සඳහන් පරිදි 2025 වර්ෂය සඳහා කසළ ගාස්තු අය කිරීමට වර්ෂ 2024 නොවැම්බර් මස 06 දින අංක 35 යටතේ ගන්නට යෙදුන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. කේ. කපිල ජගත් ගුණතිලක,
ලේකම් හා බලතල කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 06 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

දෛනික කසළ බදු ප්‍රමාණය	*මාසිකව අය කරන ගාස්තුව* රු. ශත
25 - 50 kg	1,000 0
51 60 kg	3,500 0
61 - 70 kg	7,000 0
71 - 80 kg	10,000 0
81 - 90 kg	12,000 0
91 - 100 kg	15,00 0
101 - 120 kg	20,000 0
121 වැඩිවන සෑම 10 kg ක් සඳහාම	1,000 0

12-221/11

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා සතිපොළ අසල රථගාල වෙනුවෙන් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සාදා සම්මත කරගත් අංක 1865 හා 2014 මැයි මස 30 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද වාහන නවතා තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ වාහනවලින් ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 06 වැනි වගන්තිය අනුව පහත සඳහන් ආකාරයට 2025 වර්ෂය සඳහා අය කිරීමට 2024 ක් වූ නොවැම්බර් මස 06 වැනි දින තීරණ අංක 36 යටතේ ගන්නට යෙදුන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. කේ. කපිල ජගත් ගුණතිලක,
ලේකම් හා බලතල කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 06 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

1. පාසල් බස් රථයක් සඳහා - දිනකට රු. 50 0
2. පාසල් වෑන් රථයක් සඳහා - දිනකට රු. 40 0

	පැයකට *රු. ශත*	*පළමු පැයට වැඩි සෑම පැයක් සඳහාම* *රු. ශත*
මෝටර් සයිකල්	10 0	10 0
ත්‍රීවීල් රථ	20 0	10 0
කාර්/වෑන්	30 0	10 0
බස් රථ/ලොරි රථ	50 0	10 0

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කරන ලද ත්‍රීරෝද රථ සංගම්වල සෑම ත්‍රීරෝද රථයක් සඳහාම මාසිකව රුපියල් 150.00ක මුදලක් අය කර ගැනීමට තීරණය කරමි.

12-221/12

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට අදාළව භෞතික සැලසුම් කාර්යයන් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත්කර ඇති නාගරික සංවර්ධන අධිකාරි ප්‍රදේශයෙන් පිටත ප්‍රදේශ වෙනුවෙන් ගාස්තු අය කිරීම

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍යය ඉටු කරන පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. කේ. කපිල ජගත් ගුණතිලක වන මම 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය අනුව, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාලව භෞතික සැලසුම් කාර්යයන් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත්කර ඇති නාගරික සංවර්ධන අධිකාරී ප්‍රදේශයෙන් පිටත ප්‍රදේශ වෙනුවෙන් ගාස්තු අය කිරීම සම්බන්ධව තීරණය වර්ෂ 2024 ක් වූ

නොවැම්බර් මස 06 වැනි දින තීරණ අංක 37 යටතේ ගන්නට යෙදුන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

"

ආර්. කේ. කපිල ජගත් ගුණතිලක,
ලේකම් හා බලතල කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 06 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

ඒ අනුව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ භෞතික සැලසුම් කාර්යයන් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත්කර ඇති නාගරික සංවර්ධන අධිකාරි ප්‍රදේශයෙන් බාහිර ප්‍රදේශය තුළ භෞතික සැලසුම් කාර්යයන් සඳහා වන ගාස්තු අය කිරීමේ දී 2021.07.08 වැනි දිනැති අංක 2235/54 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් ගාස්තු උපලේඛනයන්ට අනුකූලව එම ගාස්තු ප්‍රමාණයන්ගෙන් 50% ක ප්‍රතිශතයක් ගාස්තුව වශයෙන් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

12-221/13

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති තාවකාලික වෙළඳ ව්‍යාපාර පවත්වාගෙන යන ව්‍යාපාරිකයන්ගෙන් දෛනික ගාස්තුවක් අය කිරීම

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍යය ඉටු කරන, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්.කේ. කපිල ජගත් ගුණතිලක වන මම පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදු කරන ලද තාවකාලික වෙළඳ ව්‍යාපාර පවත්වාගෙන යන ව්‍යාපාරිකයන්ගෙන් දෛනික ගාස්තුවක් අය කර දෛනික අවසර පත්‍රයක් ලබා දීම සුදුසු බවටත්, ප්‍රාදේශීය සභාව මගින් දැනුම් දෙනු ලබන ඕනෑම අවස්ථාවක තාවකාලික වෙළඳ ව්‍යාපාර අදාල ස්ථානවලින් ඉවත් කර ගැනීමට ව්‍යාපාර හිමියන් කටයුතු කිරීම සුදුසු බවට දක්වෙන තීරණය 2024 ක් වූ නොවැම්බර් මස 06 වැනි දින තීරණ අංක 38 යටතේ ගන්නට යෙදුන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. කේ. කපිල ජගත් ගුණතිලක,
ලේකම් හා බලතල කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 06 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

යෝජනාව

	ගාස්තුව *රු. ශත*
මුහුණත දිග අඩි 5ට අඩු	50 0
මුහුණත දිග අඩි 5ත් 10ත් අතර	100 0
මුහුණත දිග අඩි 10ට වැඩි	150 0

12-221/14

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී වන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ටී. ආර්. සී. කේ. ගුණසේකර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කරමි. එනම්;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (I) වන උපවගන්තිය යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1524 හා 2007.11.16 දිනැති *ගැසට් පත්‍රය* යටතේ හා අංක 1617 හා 2009-08-28 දිනැති *ගැසට් පත්‍රය* යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2024 වර්ෂය සඳහා වූ තක්සේරුව 2025 වර්ෂය සඳහා තක්සේරුව ලෙස සම්මත කළයුතු බවටත්, එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 134(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට දහයක (10%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2025 වර්ෂයෙහි මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 දිනයන්ට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2025 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, කාර්තු වශයෙන් අදාළ වරිපනම් බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එකී කාර්තුවේ පළමුවන මාසය තුළ දී අදාළ මුදලින් 5% ක වට්ටමක් ද ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් තීරණය කරමි.

වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීමේ ගාස්තු රු. 250.00

ටී. ආර්. සී. කේ. ගුණසේකර,
ලේකම් හා බලතල, කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

12 - 155/1

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී වන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ටී. ආර්. සී. කේ. ගුණසේකර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(3) වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව හා එම විධිවිධාන අනුව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අක්කර බද්ද නියම කිරීමේ හා අය කිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් සලකණු ලබන බව අංක 544(IV) ආ හා 1989-02-03 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති නියමයට ඇතුළත් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා සීමා ඇතුළත පිහිටියා වූද, ස්ථීර හෝ නීතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු ස්ථීර හෝ නීතිපතා ගොවිතැන් යටතේ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ හෙක්ටයාර් එකක් සඳහා 2025 වර්ෂයට රුපියල් 50/- ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට ද ඒ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 5 හෝ ඊට වැඩි වන සෑම හෙක්ටයාර් එකක් මත 2025 වර්ෂය සඳහා රු. 10/- ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට මම තීරණය කරමි.

2024 වසරේ අක්කර බදු සඳහා පදනම් කොටගත් සත්‍යෝක්ෂණය 2025 වසර සඳහාද සත්‍යෝක්ෂණය ලෙස පිළිගැනීමටත් තව ද, 2025 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද 2025 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ හතරවන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ අක්කර බදු මුදල ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එම කාර්තුවට මුදලින් 5% ක වට්ටමක් ද ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් ලබා දිය යුතු බවටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව මම තීරණය කරමි.

ටී. ආර්. සී. කේ. ගුණසේකර,
ලේකම් හා බලතල, කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*10% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2025 මාර්තු 31	2025 ජනවාරි 31	2025 ජනවාරි 31
දෙවන කාර්තුව	2025 ජූනි 30		2025 අප්‍රේල් 30
තුන්වන කාර්තුව	2025 සැප්තැම්බර් 30		2025 ජූලි 31
හතරවන කාර්තුව	2025 දෙසැම්බර් 31		2025 ඔක්තෝබර් 31

12 - 155/2

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී වන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ටී. ආර්. සී. කේ. ගුණසේකර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය හා 148 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, පහත උපලේඛනයෙහි දක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව නියම කර අය කිරීමට මම තීරණය කරමි.

ටී. ආර්. සී. කේ. ගුණසේකර,
ලේකම් හා බලතල, කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

උපලේඛනය

		රු. ශත
මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා		25.00
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා :-		
(අ)	වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම්	18.00
(ආ)	වෙළඳ කාර්යය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම්	4.00
	සෑම කරත්තයක් සඳහා	20.00
	සෑම අත්කරත්තයක් සඳහා	10.00
	සෑම රික්ෂෝවක් සඳහා	7.50
	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15.00
	සෑම ඇතෙකු සඳහා	50.00

විෂ්කම්භය අගල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ "වෙළඳ කාර්යය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 155/3

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි වන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ටී. ආර්. සී. කේ. ගුණසේකර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අංක 2152/37 දරන 2019.12.05 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* නියම කර ඇති පරිදි, මහජන සෞඛ්‍යයට අදාළ වන, වාර්ෂික බලපත්‍රයක් ලබා ගත යුතු, පහත ලැයිස්තු අංක 01, ලැයිස්තු අංක 02, ලැයිස්තු අංක 03 හි දක්වා ඇති යම් වෙළෙඳාමක් හෝ කර්මාන්තයක් සඳහා යොදාගනු ලබන ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින්, එකී පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම මත, පහත උපලේඛන අංක 01හි නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපනශාලාවක්, නවාතැන්පළක් වන විටදී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2024 වර්ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2025 වර්ෂය සඳහා නියම කර අය කිරීමට මම තීරණය කරමි.

ටී. ආර්. සී. කේ. ගුණසේකර,
ලේකම් හා බලතල, කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

උපලේඛනය 01

I වැනි තීරය	*II වැනි තීරය* *රු. ශත*
වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක	500 0
වාර්ෂික වටිනාකම රු. 750 ඉක්වන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	750 0
වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක	1,000 0

ලැයිස්තු අංක 01

අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත

1. මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම.
2. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම.
3. සම් පදම් කිරීම.
4. රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබා ගැනීම.
5. රබර් භාණ්ඩ නිෂ්පාදනය.
6. ඔට්ටපාලු ගබඩාකර තැබීම හෝ විකිණීම.
7. පොල්කටු අඟුරු හෝ දූව අඟුරු නිපදවීම.
8. සත්ත්ව ආහාර නිපදවීම.
9. සබන් නිෂ්පාදනය කිරීම.
10. අලුත් ලෝහ හෝ පරණ ලෝහ මිලට ගැනීම හෝ ගබඩාකර තබා ගැනීම.
11. ලෝහ සුන්බුන් හා අබලි ද්‍රව්‍ය මිලට ගැනීම හෝ ගබඩාකර තබා ගැනීම.
12. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ඔපදැමීම.
13. වේවැල් භාණ්ඩ නිපදවීම.
14. වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
15. පොල් ලෙලි පෙඟවීම (පල් කිරීම).
16. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර).
17. යන්ත්‍රානුසාරයෙන් දූව ඉරීම.
18. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම.
19. කෙඳි සායම් කිරීම.
20. සම් භාණ්ඩ නිපදවීම.
21. රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ නැවත ඇසිරීම.
22. ගෑස් මැන්ටල් නිපදවීම.
23. පොටි නිපදවීම.
24. ඉටිපන්දම් හා පහන්තිර නිපදවීම.
25. කපුරු නිපදවීම.
26. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
27. රෙදි සෝදන නිල් නිපදවීම.
28. ලාකඩ නිපදවීම.
29. සුවඳ විලවුන් නිපදවීම.
30. පාසල් රටහුණු නිපදවීම.
31. ටයර් හෝ ටියුබ් නිපදවීම.
32. ටයර් නැවත පිරවීම.
33. කිරි පට්ටි හෝ කිරි වෙළඳාම
34. සිමෙන්ති ගබඩා කිරීම, ඇස්බැස්ටස් ගබඩා කිරීම.
35. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.
36. වැලි කඩදාසි නිපදවීම.

37. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කිරීම.
38. ගඩොල් පිළිස්සීම හා විකිණීම.
39. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම.
40. උළු නිපදවීම හා විකිණීම
41. භාවිතයට ගත් ගෝනි, බැරල් හා භාජන පිරිසිදු කර විකිණීම.
42. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම.
43. කුරුඳු, කරදමුංගු වේලා සකස් කිරීම හා ගබඩා කර තබා ගැනීම.
44. ගම් වර්ග නිපදවීම හෝ විකිණීම.
45. විෂබීජනාශක වර්ග නිෂ්පාදනය හෝ විකිණීම.
46. බැටරි පිරවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
47. පරණ බෝතල් එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
48. අවමංගල සේවාවක් පවත්වාගෙන යාම.
49. ගෘහ භාණ්ඩ නිපදවීම හා ගබඩාකර තබා ගැනීම.
50. මැණික් කැපීම හා ඔප දැමීම.
51. වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම.
52. යාන්ත්‍රික බලයෙන් රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
53. පිටි හෝ කුළුබඩු ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
54. සත්ත්ව ආහාර ගබඩාකර තබා ගැනීම.
55. ධාන්‍ය වර්ග ගබඩාකර තබා ගැනීම.
56. පොලිතීන් හෝ ඒ ආශ්‍රිත නිෂ්පාදන කිරීම හෝ විකිණීම.
57. සපත්තු නිෂ්පාදනය හා විකිණීම.
58. ඉටිපන්දම් නිෂ්පාදනය හා විකිණීම.
59. වෙනත් අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත.
60. කැබලි රෙදි අලෙවිය.

ලැයිස්තු අංක 02

අන්තරාදායක ව්‍යාපාර හෝ කර්මාන්ත

01. යාන්ත්‍රික බලයෙන් දැව ඉරීම.
02. කොප්පරා නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
03. යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් හෝ වෙනත් යම් තෙල් වර්ගයක් සිදීම හෝ ගබඩාකර තබා ගැනීම.
04. පුළුන් ගබඩාකර තබා ගැනීම හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සකස් කර විකිණීම.
05. ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.
06. මෙතිලේටඩ් ස්පිරිතු නිෂ්පාදනය.
07. කොහු හෝ වෙනත් කෙඳිවර්ග නිෂ්පාදනය.
08. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම.
09. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම.
10. ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම.
11. දැර විකිණීම.
12. උළු හා ගඩොල් ගබඩා කර තබා ගැනීම හා විකිණීම.
13. ටයර් ට්‍යුබ් විකිණීමට ගබඩාකර තබා ගැනීම.
14. දැව ආශ්‍රිත ලෑලි නිෂ්පාදනය සහ දැව කුඩු ආශ්‍රිත නිෂ්පාදන
15. කාඩ්බෝඩ් හා කඩදාසි භාවිතයෙන් කරන නිෂ්පාදන ගබඩා කර තබා ගැනීම හා විකිණීම.
16. ගල් හා පතුරු ගල් ආශ්‍රයෙන් කරන කර්මාන්ත.
17. මැටි හා මැටි ආශ්‍රිත කර්මාන්ත.
18. නිමි ඇඳුම් නිෂ්පාදන ආයතන.
19. රසායන ආශ්‍රිත රෙදි නිෂ්පාදන කර්මාන්ත.
20. රෙදි සේදීම් ස්ථාන.

21. බීඩි නිෂ්පාදනය හා ගබඩාකර තබා ගැනීම.
22. වාහන අලුත්වැඩියා කර තීන්ත ආලේප කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
23. වාහනවල බඳ කොටස අලුත්වැඩියා කර තීන්ත ආලේප කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
24. වාහන සේවා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
25. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
26. පරණ පත්තර හෝ කඩදාසි එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
27. පා පැදි, යතුරු පැදි හා මෝටර් වාහන අලුත්වැඩියා කිරීම.
28. විසිරි පින්තාරු කිරීම.
29. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිෂ්පාදනය හා ගබඩා කිරීම.
30. ලෝහ සංස්කාර්යය කර්මාන්ත යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම.
31. වෙනත් අන්තරාදායක ව්‍යාපාර හෝ කර්මාන්ත
32. ඉන්ධන පිරවුම්හල

ලැයිස්තු අංක 03

අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත

01. ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම.
02. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් කිරීම හෝ බතික් කිරීම.
03. විද්‍යුත් ලෝහ ආලේපණය කිරීම.
04. ශීතකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
05. තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම.
06. හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම.
07. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම.
08. ෆයිබර් නිෂ්පාදන.
09. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම.
10. ලෝහ වර්ග පෑස්සවීම.
11. යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.
12. වාත්තු වැඩපළක් පවත්වාගෙන යාම.
13. බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම.
14. මෝටර් වාහන බොඩි තැනීම.
15. කෘමිනාශක, දිලීරනාශක, පැළෑටිනාශක හෝ පළිබෝධනාශක නිපදවීම හෝ නැවත පිරවීම.
16. විෂබීජනාශක නිපදවීම සහ මදුරු දඟර නිපදවීම.
17. දැව ආරක්ෂණ නිපදවීම.
18. ගල් තාර හා සිමෙන්ති ආශ්‍රිත පූර්ව සැකසුම් මධ්‍යස්ථාන.
19. වීදුරු භාණ්ඩ නිපදවීම හා ගබඩා කිරීම.
20. යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.
21. පාස්සන ඊයම් නිපදවීම.
22. ඇළුමිනියම් භාණ්ඩ නිපදවීම.
23. කටු කම්බි නිපදවීම.
24. කම්බි ඇණ නිපදවීම.
25. කාබන් කඩදාසි හෝ යතුරු ලියන රිබන් නිපදවීම.
26. බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ කාබන් නිපදවීම.
27. ජී අයි සී බාල්දි නිපදවීම.
28. වායුසමන යන්ත්‍ර, ශීතකරණ, අධි ශීතකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම.
29. බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම හා අලුත්වැඩියා කිරීම.
30. යන්ත්‍රෝපකරණ නිපදවීම.
31. විදුලි භාණ්ඩ නිපදවීම
32. රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම.

33. සංවායත බැටරි නිපදවීම.
34. මෝටර් රථ වාහන එකලස් කිරීම.
35. රේඩියේටර් නිපදවීම.
36. ඉලෙක්ට්‍රොනික උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම.
37. වියළි කෝෂ බැටරි නිපදවීම.
38. විදුලි බුබුළු නිෂ්පාදනය සහ අලුත්වැඩියාව.
39. වෙනත් අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත.
40. ආහාර පිණිස සතුන් ඝාතනය කිරීම හා ඝාතනය සඳහා රඳවා තබා ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
41. ආහාර සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම (බේකරිය, රසකැවිලි නිෂ්පාදනය, පලතුරු බීම)
42. උත්සව ශාලාවක් පවත්වාගෙන යාම
43. එළවළු හෝ පළතුරු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
44. ගල්වලක් සහ ගල් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම
45. තේ, කෝපි කඩ හා කෙටි ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
46. මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48. රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
49. ලැඟුම්හලක් හා නවාතැන්පලවල් පවත්වාගෙන යාම
50. සංචාරක වෙළඳාමක් පවත්වාගෙන යාම
51. සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යාම
52. හෝටලයක් පවත්වාගෙන යාම

12 - 155/4

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි වන ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ටී. ආර්. සී. කේ. ගුණසේකර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150(1) වගන්තියෙ හි විධිවිධාන ප්‍රකාරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙ හි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙ හි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2025 වර්ෂය සඳහා නියම කර අය කිරීමට මම තීරණය කරමි.

ටී. ආර්. සී. කේ. ගුණසේකර,
ලේකම් හා බලතල, කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

උපලේඛනය

අනු. අංකය	I වැනි තීරුව කර්මාන්තය	II වැනි තීරුව පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු. 750.0 නොඉක්මවන අවස්ථාවක	රු. 751.0 ඉක්මවන එහෙත් රු. 1,500.0 නොඉක්මවන අවස්ථාවක	රු. 1,501.0 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
01.	අභ්‍යාස පොත් නිපදවීම	500.0	750.0	1,000.0
02.	ඇඳ ඇතිරිලි, කොට්ට උර, තිර රෙදි නිපදවීම හා අලෙවිය	500.0	750.0	1,000.0
03.	ඇඳුම් මැසීමේ ස්ථාන	500.0	750.0	1,000.0
04.	කඩදාසි බෑග් නිෂ්පාදනය	500.0	750.0	1,000.0
05.	ජී අයි බාල්දි නිපදවා විකිණීම	500.0	750.0	1,000.0
06.	පාවහන් නිෂ්පාදනය	500.0	750.0	1,000.0
07.	පැණි නිපදවා විකිණීම	500.0	750.0	1,000.0
08.	ප්‍රචාරක දැන්වීම් පුවරු/බැනර් සකස් කිරීම	500.0	750.0	1,000.0
09.	බෙලෙක් වැඩපලවල්	500.0	750.0	1,000.0
10.	මදුරු දැල් මසා අලෙවිය	500.0	750.0	1,000.0
11.	මැටි භාණ්ඩ නිපදවීම/අලෙවිය	500.0	750.0	1,000.0
12.	සිමෙන්ති භාණ්ඩ නිපදවීම හා අලෙවිය	500.0	750.0	1,000.0
13.	බිම්මල් නිෂ්පාදනය	500.0	750.0	1,000.0
14.	තේ කොළ ඇසුරුම් කිරීම	500.0	750.0	1,000.0

12 - 155/5

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි වන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ටී. ආර්. සී. කේ. ගුණසේකර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 (1) උපවගන්තියෙ හි විධිවිධාන ප්‍රකාරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්;

අප්‍රසන්න වෙළෙඳ ව්‍යාපාර	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750.00 දක්වා*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751.00 සිට රු. 1,500.00 දක්වා*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,501.00ට වැඩි*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
4 ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම, අලුත්වැඩියා කිරීම හා අලෙවි කිරීම (ගුවන් විදුලි, රූපවාහිනී, ශීතකරණ)	500 0	750 0	1,000 0
5 අලුත් ටයර්, රීබිල්ඩ් ටයර් ගබඩා කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
6 මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7 විංකලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8 දැව ගබඩා කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
9 වැලි ගොඩ දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සහ වෙළඳාම	500 0	750 0	1,000 0
10 ලොරි බොඩි සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11 කෘමිනාශක විකිණීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12 පින්තාරු, තීන්ත, ඩිස්ටැම්පර්, පොලිෂ් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13 රථ වාහන අමතර කොටස් විකිණීම ගබඩා කිරීම	500 0	750 0	1,000 0
14 පරණ ලෝහ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
15 දැති සහිත අත් කියත් භාවිත ව්‍යාපාර	500 0	750 0	1,000 0
16 මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17 පරණ පත්තර බෝතල්, යකඩ එකතු කර විකිණීම	500 0	750 0	1,000 0
18 කුකුළු ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19 සිසිල් බීම, සරුවත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20 ඡායා පිටපත් කිරීම, රෝනියෝ කිරීම, ලැමිනේටින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21 බිත්තර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (තොග හා සිල්ලර)	500 0	750 0	1,000 0
22 අවමංගල භාණ්ඩ නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23 ජංගම දුරකතන අලෙවි කිරීමේ හා අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24 විසිතුරු පින්තාරු කිරීමේ (ස්ප්‍රේ පේන්ටින්) ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25 ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26 බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27 විවිධ ද්‍රව්‍ය පැකට් කර අලෙවි කිරීම	500 0	750 0	1,000 0
28 බිත්තර රැක්කවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29 කෘෂි නිෂ්පාදන එකතු කිරීම හා අලෙවි කිරීම	500 0	750 0	1,000 0
30 ත්‍රී රෝද රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම හා අමතර කොටස් විකිණීම	500 0	750 0	1,000 0
31 සිමෙන්ති බ්ලොක් ගල්, මල් පෝච්චි නිපදවීම	500 0	750 0	1,000 0
32 සිමෙන්ති භාණ්ඩ, කොන්ක්‍රීට් කණු, සිලින්ඩර් නිපදවීම	500 0	750 0	1,000 0
33 මෙම ව්‍යාපාරයන්ට අයත් නොවන ව්‍යාපාර සඳහා	1,000 0	1,000 0	1,000 0
අන්තරායදායක අප්‍රසන්න නොවන වෙළෙඳාම :			
1 මස් ප්‍රවාහනය කිරීම	500 0	750 0	1,000 0
2 ක්‍රීඩා සමාජශාලා පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3 හුණු පෝරණුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
4 ගඩොල් පෝරණුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5 තේ කොළ පැකට් කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව		*II වැනි තීරුව*	
අප්‍රසන්න වෙළෙඳ ව්‍යාපාර	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750.00 දක්වා* රු. ශත	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751.00 සිට රු. 1,500.00 දක්වා* රු. ශත	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,501.00ට වැඩි* රු. ශත
6 ලියුම් කවර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
7 හඳුන්කුරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8 බිම් මල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9 ධාන්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10 මැණික් මිළදී ගැනීම සඳහා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
11 රෙදි හෝ ඇඳුම් මැසීම	500 0	750 0	1,000 0
12 සාප්පු බඩු අලෙවි කිරීම	500 0	750 0	1,000 0
13 බීජ අර්තාපල්, වියළි බීජ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
14 සංචාරක වෙළඳාම	500 0	750 0	1,000 0
15 මිරිස්, තුනපහ පැකට් කිරීමේ ආයතනයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
16 රසකැවිලි නිපදවීම හා පැකට් කිරීම	500 0	750 0	1,000 0
17 අමු තේ දළු එකතු කිරීම	500 0	750 0	1,000 0
18 බීඩි, සිගරට් තොග විකිණීම	500 0	750 0	1,000 0
19 පාසල් පොත්, ලිපි ද්‍රව්‍ය, සඟරා පුවත්පත් විකිණීම	500 0	750 0	1,000 0
20 තේ කොළ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළ කරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂාවලින් පළ කිරීමේ දී යම් නොගැලපීමක් ඇති වුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.

12 - 175/16

බදුල්ල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ගාස්තු හෝ සේවා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 8 (1) වගන්ති ප්‍රකාරව ලැබී ඇති බලතල ප්‍රකාරව බදුල්ල ප්‍රාදේශීය සභාව මගින් බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සේවාවන් සැපයීමේ දී 2025 වර්ෂයට අදාළව පහත උපලේඛනයේ පරිදි ගාස්තු අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වන උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 සැප්තැම්බර් මස 31 වැනි දින තීරණ අංක 2024/09/30/987 යටතේ පහත සඳහන් තීරණය කළ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. එම්. එස්. එන්. වික්‍රමසිංහ,
සභා ලේකම්,
බදුල්ල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 30 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඇමුණුම් අංක 01
පුස්තකාලය :

	රු. ශත
01. පුස්තකාල සාමාජික ගාස්තු	50 0
02. පුස්තකාල සාමාජික තැන්පත් මුදල් (වැඩිහිටි)	200 0

		රු. ශත
03.	පාසල් ළමුන් සඳහා සාමාජික ගාස්තු හා තැන්පත් මුදල් ගාස්තු (අවු. 12ට අඩු)	100 0
04.	පුස්තකාල දඩ (දිනකට)	5 0
05.	පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීම පාසල් ළමුන් සඳහා	100 0
06.	පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීම - වෙනත්	150 0
07.	පුස්තකාල සාමාජික මුදල් (ළමුන් සඳහා)	50 0
08.	පුස්තකාල සාමාජික මුදල් (වැඩිහිටි සඳහා)	250 0
09.	පොතක් නැතිකළහොත් පොතේ වටිනාකම මෙන් දෙගුණයක්	
10.	පවුලේ සාමාජික ගාස්තු	300 0
11.	පවුලේ සාමාජිකත්වය අලුත් කිරීම	250 0
12.	අන්තර්ජාල පහසුකම් පැය එකක් සඳහා	50 0

ජල සේවා :

01.	10 km ක් තුළ ජල බවුසර් ගාස්තු	2,750 0
02.	ලොරි බවුසරය ලීටර් 10000/1KM	8,000 0
03.	රියදුරු සඳහා	200 0
04.	ට්‍රැක්ටර් රථයෙන් ලීටර් 4000 ක ජලය ප්‍රවාහනයේ දී	3,500 0
05.	ජල ටැංකි (ප්ලාස්ටික්) ලීටර් 500 - රු. 250 0, ලීටර් 1000 - රු. 500 0, ලීටර් 2000	1,000 0
06.	ජලය ලබාගන්නා ස්ථානයේ සිට කි.මී. 05කට වැඩිවන සෑම කි.මී. 01ක් සඳහාම බැගින් අමතර ගාස්තුවක් අය කරනු ලැබේ. (ජල බවුසර් සැපයීමේ දී)	රු. 100 0

සුභ සාධන කටයුතු සඳහා ගාස්තු අය කිරීම :

01	තාවකාලික වැසි ආවරණය (ටෙන්ට් රෙදි 01 ට) එක් දිනකට කුළියට දීම : (පොදු කටයුතු)	500 0
02	ප්ලාස්ටික් පුටුවක් සඳහා එක් දිනකට අයකරනු ලබන ගාස්තුව	20 0
03	වී.අයි.පී. හට් 01 ක් දින 01 ක් සඳහා (සවි කිරීමේ හා ගලවා ඉවත් කිරීමේ ගාස්තු හා ප්‍රවාහනය කිරීම ඇතුළත්ව)	20,000 0
04	10' x 10' වැසි ආවරණ 01ක් දින 01ක් සඳහා	750 0
05	10' x 15' වැසි ආවරණ 01ක් දින 01ක් සඳහා	1,000 0
06	10' x 20' වැසි ආවරණ 01ක් දින 01ක් සඳහා	1,500 0
07	G.I. බට 01 ක් දින 01 ක් සඳහා	30 0

ගොඩනැගිලි හා දේපළ :

01.	ගොඩනැගිලි අයදුම්පත් සඳහා	500 0
02.	වීථි රේඛා සහතිකයක් නිකුත් කිරීම හා අයදුම්පත් ගාස්තු	1,000 0
03.	නොපවරා ගැනීමේ සහතිකයක් නිකුත් කිරීම සඳහා	1,000 0
	පරීක්ෂණ ගාස්තු සඳහා	500 0
04.	අනුකූලතා සහතිකයක් සඳහා	1,000 0
	පරීක්ෂණ ගාස්තු	500 0
05.	ඉඩම් කට්ටි සැලසුම් අනුමත කිරීම - එක් කට්ටියක් සඳහා	1,000 0
05. 1.	පර්චස් 06ට අඩු ඉඩම් කට්ටි සැලසුම් අනුමත කිරීම - එක් කට්ටියක් සඳහා	5,000 0
06.	මිනින්දෝරු සැලැස්මක් අනුමත කිරීම සඳහා	1,000 0
07.	හිමිකම් සහතිකයක් (වරිපනම්) නිකුත් කිරීම සඳහා	1,000 0

		රු. ශත
08.	අනු බෙදුම් සහතිකයක් සඳහා (එක් බිම් කට්ටියක් සඳහා)	1,000 0
09.	දේපළ අයිතිය හැරවීමේ ගාස්තුව	2,000 0
	පරීක්ෂණ ගාස්තු සඳහා	500 0
10.	ගොඩනැගිලි සැලැස්මේ කාලය දීර්ඝ කිරීම	1,000 0
11.	පස් කියුබ් 01ක් ප්‍රවාහනයේ දී	300 0
12.	පස් ග්‍රැවල් 01ක් ප්‍රවාහනයේ දී (තිරුවානා ගල් සහිත පස්)	500 0
13.	කුඹුරු ඉඩම් ගොඩ කිරීමේ නිර්දේශ ගාස්තු - එක් කට්ටියක් සඳහා	1,000 0
14.	තාවකාලික වෙළඳාමට බිම් කුළිය දිනකට	100 0
15.	තාවකාලික බලපත්‍ර ලබාගෙන වර්ග අඩි 100ට වැඩි ඉඩ ප්‍රමාණයක් (දිනකට)	300 0
16.	සභාව සතු දේපලක් වෙනත් අයෙකුට පැවරීමේ ගාස්තු	150,000 0
17.	ඥාතීත්වයට පැවරීමේ ගාස්තු	50%

මාර්ගය පළුදු කිරීමේ ගාස්තු - ජල සම්බන්ධතා ලබා ගැනීමේදී

1.	මාර්ගය පළුදු කිරීමේ ගාස්තු (අවම)	2,000 0
2.	ඇස්තමේන්තු මුදලින්	25%
3.	කොන්ක්‍රීට් මාර්ගයක වර්ග මීටරයක් සඳහා	6,038 75
4.	කොන්ක්‍රීට් මාර්ගයක දික් මීටරයක් සඳහා	1,811 50
5.	කොන්ක්‍රීට් මාර්ගයක 3'.0 x 3'.0 කොටසකට	4,891 00
6.	තාර මාර්ගයක වර්ග මීටරයක් සඳහා	3,945 00
7.	තාර මාර්ගයක දික් මීටරයක් සඳහා	1,183 00
8.	තාර මාර්ගයක 3'.0 x 3'.0 කොටසකට	3,195 00
9.	කාපට් මාර්ගයක වර්ග මීටරයක් සඳහා	9,416 50
10.	කාපට් මාර්ගයක දික් මීටරයක් සඳහා	2,825 00
11.	කාපට් මාර්ගයක 3'.0 x 3'.0 කොටසකට	7,627 00
12.	කුට්ටි ගල් වර්ග මීටරයක් සඳහා	4,034 50
13.	කුට්ටි ගල් දික් මීටරයක් සඳහා	1,268 00
14.	කුට්ටි ගල් මාර්ගයක 3'.0 x 3'.0 කොටසකට	3,268 00

වෙනත් කටයුතු :

01.	කර්මාන්ත සඳහා පරිපාලන ගාස්තුව (ගිවිසුම් ගත මුදලින්) 1%	
02.	විනෝද බද්දෙන් නිදහස් කිරීමේ ඉල්ලුම් පත්‍රයක්	500 0
03.	කොන්ත්‍රාත්කරුවෙකු, බ්‍රෝකර්වරයෙකු, වෙන්දේසිකරුවෙකු, සැපයුම්කරුවෙකු වශයෙන් ලියාපදිංචි වීමේ ගාස්තු	1,000 0
04.	ටෙන්ඩර් පෝරම ගාස්තු	1,000 0
05.	වරිපනම් ලේඛන සෙවීමේ ගාස්තු	100 0
06.	විරෝධතාවයක් නොමැති බවට සහතිකයක් (ජල සම්පාදන හා විදුලි බල මණ්ඩල)	1,000 0
07.	තාවකාලික වරිපනම් අංක ලබා දීමේ ගාස්තු	1,000 0
7.1	තාවකාලික විදුලි සහතික ලබාදීමේ ගාස්තු	1,000 0
09.	ආයුර්වේද වෛද්‍ය සහතිකයක්	200 0
10.	ආයුර්වේදයේ ලේ පරීක්ෂා කිරීමේ ගාස්තු	100 0
11.	පෙර පාසැල් ඇතුළත් කිරීමේ ගාස්තු	1,500 0
12.	කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය කුළියට දීම (දවසකට)	4,000 0
13.	ජේ.සී.බී. යන්ත්‍රය සඳහා පැයක කුළිය	5,750 0
14.	ජේ.සී.බී. යන්ත්‍රය පැයක් හෝ ඊට අඩු කාලයක් සඳහා ලබා දීමේදී අවම ගාස්තුව	8,000 0
15.	ටිපර් රථය සඳහා දිනකට කුළිය (තෙල් නොමැතිව රියදුරු සමඟ)	15,000 0
16.	ටිපර් රථය (පැය 6ක් සඳහා තෙල් නොමැතිව රියදුරු සමඟ)	8,000 0

		රු. ශත
17.	ටිපර් රථය වැඩිවන සෑම පැයකටම	1,500 0
18.	ගල් රෝල කුළියට දීම පැයක් සඳහා (අවම පැය 04) තෙල් රහිත	4,000 0
19.	උඩවෙල පොදු වෙළෙඳ සංකීර්ණයේ ඉදිරිපිට ප්‍රචාරක රැස්වීම් සඳහා බිම් කුළිය (දිනකට)	2,000 0
20.	ට්‍රැක්ටර් ගාස්තු දිනකට	6,000 0
21.	සොහොන් භූමි ස්මාරක තැනීම සඳහා ගාස්තු වර්ග අඩි 01 ක් සඳහා (පූජ්‍ය පක්ෂය හා රණවිරුවන් සඳහා නොමිලේ විශේෂ අවසරය මත පමණක් හා ප්‍රදේශයට යම් විශිෂ්ට සේවාවක් සිදු කළ අයෙක් සිටීනම් මහ සභාවේ විශේෂ අනුමැතියට යටත්ව)	10,000 0
22.	අන්තරාදායක ගස් ඉවත් කිරීමේ ස්ථාන පරීක්ෂා කිරීම	1,000 0
23.	සේවා ගාස්තු	100 0
24.	පොදු රැස්වීම් පවත්වන ස්ථාන සඳහා (මංසන්ධි)	1,000 0
25.	ස්වේච්ඡා සමිති ලියාපදිංචි ගාස්තු	500 0
26.	ග්‍රැවල් ප්‍රවාහනයේදී කියුබ් 01ක් සඳහා	500 0
27.	සභාව සතු මාර්ගවල දැව ප්‍රවාහනයේදී ආපසු නොගෙවන මුදල	100 0
28.	සභාව මගින් සේවාවන් සැපයීමේදි සිදුකරන ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු	4,500 0
29.	කසල බදුන් වෙළඳපොළෙන් මිලදී ගන්නා මිලට අනුව සේවාදායකයින් හට ලබා දෙයි.	

30. බදුල්ල ප්‍රාදේශීය සභාවට අයත් සන්නිවේදන මධ්‍යස්ථානයේ ගාස්තු අය කිරීම (වෙළඳපල මිල අනුව මෙම මිල ගණන් සංශෝධනය විය හැක.)

01.	A4 කොළයක්	5 0
02.	ඡායා පිටපත් තනි පැත්ත (කළු සුදු)	10 0
03.	ඡායා පිටපත් තනි පැත්ත A4 වර්ණ	50 0
04.	ඡායා පිටපත් දෙපැත්ත මුද්‍රණය කිරීම (කළු සුදු)	10 0
05.	ඡායා පිටපත් දෙපැත්ත මුද්‍රණය කිරීම (වර්ණ)	80 0
06.	යතුරු ලියන මුද්‍රිත තනි පැත්ත (කළු සුදු)	50 0
07.	යතුරු ලියන මුද්‍රිත දෙපැත්ත (කළු සුදු)	100 0
08.	යතුරු ලියන මුද්‍රිත තනි පැත්ත (වර්ණ)	50 0
09.	යතුරු ලියන මුද්‍රිත දෙපැත්ත (වර්ණ)	100 0
10.	මුද්‍රිත පිටපත් තනි පැත්ත (කළු සුදු A4)	10 0
11.	මුද්‍රිත පිටපත් තනි පැත්ත (වර්ණ A4)	50 0
12.	මුද්‍රිත පිටපත් දෙපැත්ත (කළු සුදු A4)	10 0
13.	මුද්‍රිත පිටපත් දෙපැත්ත (කළු සුදු A4)	80 0
14.	ජාතික හැඳුනුම්පත් පිටපත් (කළු සුදු A4)	10 0
15.	ජාතික හැඳුනුම්පත් පිටපත් (කළු සුදු A5)	5 0
16.	ලැමිනේටින් අවම (ප්‍රමාණය අනුව වෙනස් වේ)	60 0
17.	පොත් බයිංඩින් කිරීම (පිටපත් ප්‍රමාණය මත ගාස්තුව සංශෝධනය වේ)	200 0

ප්‍රාදේශීය සභා නව රැස්වීම් ශාලාව කුළියට ලබා දීම

01.	පළාත් සභාව යටතේ පවතින ආයතන හා රාජ්‍ය නොවන ආයතනවලට දිනකට (උත්සව හා පුහුණු වැඩසටහන් සඳහා)	10,000 0
02.	උත්සව සඳහා දිනකට (පෞද්ගලික ආයතන හා පුද්ගලයින් සඳහා)	40,000 0
03.	ආපසු ගෙවන තැන්පත් මුදල	25,000 0
04.	ස්වේච්ඡා සංවිධාන සමිති සමාගම්වල රැස්වීම් සඳහා (උපරිම පැය 03)	2,500 0
05.	ස්වේච්ඡා සංවිධාන සමිති සඳහා (වැඩිවන සෑම පැයකටම)	500 0
06.	ආපසු ගෙවන තැන්පතු ගාස්තු	1,000 0

	රු. ශත
07. රජයේ ආයතන හා රාජ්‍ය නොවන ආයතනවල රැස්වීම්	5,000 0
08. ආපසු ගෙවන තැන්පතු ගාස්තු	1,000 0
09. චේදිකා නාට්‍ය හා සංදර්ශන සඳහා ගාස්තු	50,000 0
10. ශබ්ද විකාශන සමග	65,000 0
11. පාසල් අධ්‍යාපනික වැඩසටහන් සඳහා	3,000 0
12. උත්සව පහසුකම් සැපයීම (දිනකට)	
I. බුෆේ සෙට් එක (දිනකට) - කෑලි 12	2,750 0
II. බුෆේ සෙට් එක (දිනකට) - කෑලි 06	1,650 0
III. පිඟන් 01	10 0
IV. වීදුරු 01	8 0
V. ගෑස් ලිප් 01	550 0
VI. ප්ලාස්ටික් මේස 01	110 0
VII. පිල්ටර් 01	275 0
VIII. සාස් පාන් 01 - 20kg ඉහළට	275 0
IX. තාච්චි 01	165 0
X. සැලඩ් කප් 01	5 0
XI. උත්සව ශාලාව සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීම	5,500 0
XII. උත්සව සඳහා පෝරුව	16,500 0
XIII. සෙට් බැක් එක	11,000 0
XIV. පිළිගැනීමේ පුවරු	5,500 0
XV. ගෑස්ලිප හා රෙගියුලේටරය	650 0
XVI. රයිස් කුකර් 7.8L	1,500 0
XVII. රයිස් කුකර් 5.6L	1,100 0
XVIII. ප්‍රෙෂර් කුකර් 5.6L	700 0
XIX. බ්ලෙන්ඩර්	900 0

උත්සව උපකරණ පලුදු වූ අවස්ථාවක වෙළඳපලේ වටිනාකම අය කරනු ලැබේ.

සන්නිවේදන කුළුණු ඉදි කිරීම - කුළුණේ උස

01. පළමු අඩි 100 සඳහා - එක් අඩියකට	1,000 0
02. දෙවන අඩි 100 සඳහා - එක් අඩියකට	800 0
03. තෙවන අඩි 100 සඳහා - එක් අඩියකට	400 0

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළ කරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂාවලින් පළ කිරීමේදී යම් නොගැලපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.

ස්වභාවික උපද්‍රව වංසගත හා ආර්ථික ගැටළු පාදක කරගෙන පවතින මිලගණන් සහා තීරණය පරිදි ගාස්තු වෙනස් කළ හැකිය.

තිහගොඩ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉහත කී පනතේ 149 වන වගන්තිය සමඟ කියවිය යුතු හා එකී පනතේ 147(1) වගන්තිය යටතේ සාදන ලද 1988.08.23 දිනැති අංක 520/7 අංක දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙන්* තිහගොඩ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථා නියමයන් අනුව තිහගොඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටා ඇති ව්‍යාපාර ස්ථානයක් හා පරිශ්‍රයක් පවත්වාගෙන යන සෑම තැනැත්තෙකු විසින්ම උපලේඛන 01 ලෙස පහත දක්වා ඇති ප්‍රමාණයන්ට අනුකූල වන අකාරයට බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂයට පනවා අය කිරීමට තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2024/09/26/ 363 යටතේ තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

එමෙන්ම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය අනුව සාදන ලද අංක 520/7 දරන 1988 අගෝස්තු මස 23 වන අඟහරුවාදා *අති විශේෂ ගැසට් පත්‍රය* මඟින් ප්‍රකාශයට පත්කොට ඇති එකී නිවේදනයේ 21 වගන්තියට අනුව අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් ලෙස හඳුන්වා ඇත්තා වූ සියලුම ව්‍යාපාර ස්ථාන සඳහා පහත උපලේඛන 02 හි I වන තීරයේ සඳහන් යම් පරිශ්‍රයක් හා ස්ථානයක් සඳහා II වන තීරයේ සඳහන් අනුප්‍රමාණයෙන් යුතු බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂයට පනවා අය කිරීමටත්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත අනුව සංචාරක මණ්ඩලයේ අනුමත හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන් පොළක් සඳහා ඊට අදාළ බලපත්‍ර ලබා දීමේදී අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම්වලින් 1% ක අනුප්‍රමාණයක් බලපත්‍ර ගාස්තුවක් ලෙස 2025 වර්ෂයට අදාළව ද නියම කල යුතු බවටත්, ඉහත සඳහන් සියලුම බලපත්‍ර 2025.03.31 වන දිනට පෙර අදාළ ගාස්තුව ගෙවා තිහගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය වෙතින් අදාළ ස්ථානයන් පවත්වාගෙන යනු ලබන අයවලුන් විසින් ලබා ගත යුතු බවටත් තවදුරටත් නිවේදනය කරමි.

මීටිතොට හේවගේ ගීතා නිහාරී.
ලේකම් හා බලතල, කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිළධාරී,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 25 වැනි දින.
තිහගොඩ ප්‍රාදේශීය සභා කර්යාලයේ දී ය.

උපලේඛන 01

I වන තීරුව	*II වන තීරුව*		
ව්‍යාපාරය	*වාර්ෂික වටිනාකම රු.750/=ට නොවැඩි*	*වාර්ෂික වටිනාකම රු.750/= රු. 1,500/- දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,500/- ට වැඩි වන විට*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01. බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02. බත් කඩයක් හෝ භෝජනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03. තේ/කෝපි කඩයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
04. ලැගුම්හලක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
05. බාබර් සාප්පුවක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
06. මස් වෙළඳසැලක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
07. මාළු වෙළඳසැලක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
08. ලොන්ඩරියක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0

I වන තීරුව	*II වන තීරුව*		
ව්‍යාපාරය	*වාර්ෂික වටිනාකම රු.750/=ට නොවැඩි*	*වාර්ෂික වටිනාකම රු.750/= රු. 1,500/- දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,500/- ට වැඩි වන විට*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
09. සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
10. කිරි වෙළඳසැලක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
11. ගව ගාලක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
12. අවමංගල්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
13. හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. සංචාරක වෙළෙන්දෙකු සඳහා	500 0	750 0	1,000 0
15. රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
උපලේඛන 02 (අන්තරාදායක හා අප්‍රසන්න කර්මාන්ත)			
01. ගල් වලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,00 0
02. කම්මලක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
03. කළුගල් පිපිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04. වාහන සේවා (සර්විස්) කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05. පෑස්සුම් (වෙල්ඩින්) කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06. විසිරි පින්තාරු (ස්ප්‍රේ පේන්ට්) කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07. ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08. එළවළු, පළතුරු විකිණිමේ ස්ථායක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
09. ශීත කළ මස් වර්ග විකිණීමේ ස්ථායක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10. කුකුළු කොටුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11. ලියවන පට්ටලයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
12. වෙල්ඩින් වැඩපලක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0

12-111/1

තිහගොඩ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තිය යටතේ කර්මාන්ත බද්ද පැනවීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා 150 වගන්තිය (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2024.09.26.363 යටතේ බලාත්මක කොට ඇති පරිදි තිහගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් කර්මාන්තයක් පවත්වා ගෙන යනු ලබන සෑම තැනැත්තෙකු විසින් ම එකී පනතේ 150 වන වගන්තියේ (1) (2) උප වගන්ති අනුව දක්වා ඇති පහත උපලේඛනයෙහි I වන තීරුවේ සඳහන් කර්මාන්තයේ වාර්ෂික වටිනාකමට අනුරූපීව II වන තීරුවේ නිරූපිත

ප්‍රමාණයක කර්මාන්ත බද්දක්, බද්දට යටත් යම් තැනැත්තෙකු විසින්ම එකී කර්මාන්ත බද්ද 2025 වර්ෂයේ ජුනි මස 30 වන දිනට පෙර තිහගොඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

මීටිතොට හේවගේ ගීතා නිහාරී,
ලේකම් හා බලතල,කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිළධාරී,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 25 වැනි දින.
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උප ලේඛනය 01

I වන තීරුව	*II වන තීරුව*		
කර්මාන්තය	*වාර්ෂික වටිනාකම රු.750/=ට නො-ඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු.750/= රු. 1,500/- නොඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු. 1,500/- ට වැඩි ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.	500 0	750 0	1,000 0
02. ඇලුමිණියම්, ප්ලාස්ටික්භාණ්ඩ අලෙවිසැලක් පවත්වා ගෙන යාම.	500 0	750 0	1,000 0
03. තේ කුඩු, කුළු බඩු පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.	500 0	750 0	1,000 0
04. පා පැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
05. වී මෝල්ක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
06. යතුරු පැදි,ත්‍රී රෝද රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
07. සිමෙන්ති ගඩොල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08. ටයර් ටියුබ් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
09. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
10. පොල් තෙල් මෝල්ක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
11. ගුවන්විදුලි හා රූපවාහිනී යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
12. ලියවන පට්ටලයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
13. ඩිජිටල් තාක්ෂණයෙන් මුද්‍රණාලයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
14. වඩු මඩුවක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
15. කුෂන් වැඩපලක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
16. ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
17. බීරළු ලී කැටයම් වැඩපලක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
18. නුණු පිළිස්සීම් හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.	500 0	750 0	1,000 0
19. කොප්පරා නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.	500 0	750 0	1,000 0
20. ගිණි කෙළි භාණ්ඩ නිපදවීම/විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
21. රබර් කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
22. වායු සමීකරණ, ශීතකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
23. ඉදල්, පාපිසි, කොහු ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
24. මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
25. රන්, රිදී, ලෝහ ආලේප කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0

I වන තීරුව	*II වන තීරුව*		
කර්මාන්තය	*වාර්ෂික වටිනාකම රු.750/=ට නො-ඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු.750/= රු. 1,500/- නොඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු. 1,500/- ට වැඩි ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
26. මැණික් කැපීමේ හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
27. ප්ලාස්ටික්, ෆයිබර් ග්ලාස් නිපදවන කර්මාන්තයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
28. ලී මෝලක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
29. ගල් මෝලක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
30. කිරි ශීත කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
31. කුරුඳු තෙල් නිස්සාරණය කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
32. ඇඹරුම්හලක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
33. සිල්ලර	500 0	750 0	1,000 0
34. පැල තවානක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
35. ස්වර්ණාභරණ සෑදීමේ හෝ විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
36. පින්තූර රාමු කිරීම හා විදුරු කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
37. ලිපි ද්‍රව්‍ය හෝ පොත් සාප්පුවක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
38. පරිගණක මෘදුකාංග සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
39. සුරතල් මසුන් අලෙවි කරන මධස්ථානයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
40. අයිස්ක්‍රීම් නිෂ්පාදන හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0

111/2

තිහගොඩ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය යටතේ ව්‍යාපාර බද්ද පැනවීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 152 වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ 147 වැනි වගන්තිය හෝ එකී පනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධි විධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන්නා වූ හා එකී පනතේ 150 (1) වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ තිහගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන් ම 2025 වර්ෂයේ දී එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මත මෙහි පහත උපලේඛන I හි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනු ප්‍රමාණය අනුව වූ උපලේඛන II හි සඳහන් පරිදි ව්‍යාපාර බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2025 වර්ෂයේ ජුනි මස 30 වැනි දිනට පෙර තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය වෙත ගෙවා අවසන් කළ යුතු බව තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2024/09/26/363 යටතේ මා විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

මීවිතොට හේවගේ ගීතා නිහාරී,
ලේකම් හා බලතල, කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිළධාරී,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 25 වැනි දින.
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය I

I තීරුව *2024 වර්ෂයේ ව්‍යාපාරයේ ආදායම*		*II තීරුව* *ගෙවිය යුතු බදු ප්‍රමාණය (රු.)*
01.	රු.6,000/=ක් නොඉක්මවන අවස්ථාවක	අයකිරීමක් නැත
02.	රු.6,000/=ක් ඉක්මවන, එහෙත් රු.12,000/=ක් නොඉක්මවන අවස්ථාවක	90.00
03.	රු.12,000/=ක් ඉක්මවන, එහෙත් රු.18,750/=ක් නොඉක්මවන අවස්ථාවක	180.00
04.	රු.18,750/=ක් ඉක්මවන, එහෙත් රු.75,000/=ක් නොඉක්මවන අවස්ථාවක	360.00
05.	රු.75,000/=ක් ඉක්මවන, එහෙත් රු.150,000/= ක් නොඉක්මවන අවස්ථාවක	1200.00
06.	රු.150,000/=ක් ඉක්මවන අවස්ථාවක	3000.00

උපලේඛනය II

01. රෙදිපිළි, නිමි ඇඳුම් අලෙවි සැලක් පවත්වාගෙන යාම .
02. සාප්පු බඩු අලෙවි සැලක් පවත්වාගෙන යාම.
03. පාවහන් අලෙවි සලක් පවත්වාගෙන යාම.
04. සන්නිවේදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
05. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.
06. වර්ණ රසායනාගාරයක් පවත්වාගෙන යාම.
07. අපනයන සඳහා තේ සැකසුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
08. අමු තේ දළු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
09. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
10. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
11. තීන්ත අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
12. යකඩ බඩු (හාඩ්වෙයාර්) විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
13. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම.
14. පෙර පාසල් දිවා සුරකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
15. පරිගණක පුහුණු පාඨමාලාවක් පවත්වාගෙන යාම
16. ජ්‍යෝතිෂ්‍ය සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
17. රියදුරු පුහුණුව සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
18. ඉංග්‍රීසී බෙහෙත් වෙළඳාම් කරන ස්ථානයක් (ෆාමසියක්) පවත්වාගෙන යාම.
19. දුරකථන සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
20. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
21. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම.
22. සත්ව සායනයක් පවත්වාගෙන යාම.
23. නීතිඥ ,නොතාරිස් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
24. විගණන හෝ ගණකාධිකාරී සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
25. වාණිජ බැංකුවක් පවත්වාගෙන යාම.
26. රක්ෂණ සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
27. ලිසීං සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
28. මිනින්දෝරු සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
29. ගෘහ නිර්මාණ සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
30. වාස්තු විද්‍යා සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
31. ඉංජිනේරු සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
32. විශේෂඥ වෛද්‍ය සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
33. පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම.

34. ඇඟලුම් කම්හලක් පවත්වාගෙන යාම.
35. ස්වර්ණාභරන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
36. පරිගණක හා උපාංග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
37. ලී බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
38. ප්‍රචාරක කටයුතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
39. උත්සව භාණ්ඩ කළීයට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
40. ඇස් කණ්ණාඩි සාප්පුවක් පවත්වාගෙන යාම.
41. ලොතරැයි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
42. පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන අලෙවිසැලක් පවත්වාගෙන යාම.
43. රේස් බුකියක් පවත්වාගෙන යාම.
44. නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම.
45. රබර්, කුරුඳු මිලට ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම.
46. දුරකථන සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
47. ජංගම දුරකථන අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
48. රැකියා නියෝජිත ස්ථානයක් පවත්වාගෙන යාම.
49. උකස් බඩු ගන්නා ආයතනයක් පවත්වාගෙන යාම.
50. වීඩියෝ පට සංයුක්ත තැටි විකිණීම හෝ කුළියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
51. ලිපි ද්‍රව්‍ය හෝ පොත් සාප්පුවක් පවත්වාගෙන යාම.
52. ලී වෙළඳසැලක් පවත්වාගෙන යාම.
53. සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යාම. (මිශ්‍ර)
54. සංගීත භාණ්ඩ හෝ ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
55. ගබඩාවක් ලෙස කුළියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම.
56. තොග වශයෙන් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
57. විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
58. ප්‍රසිද්ධ සමාගම්වල භාණ්ඩ බෙදා හැරීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
59. ප්‍රසිද්ධ සමාගම්වල භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
60. වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
61. යතුරු පැදි, ත්‍රීරෝද රථ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
62. පා පැදි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
63. වාහන අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
64. යතුරු පැදි, ත්‍රී රෝද රථ අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
65. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම.
66. අරක්කු, බියර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
67. සිනමා ශාලාවක් පවත්වාගෙන යාම.
68. රියදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම.
69. මැණික් මිල දී ගන්නා ස්ථානයක් හෝ මැණික් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
70. විදේශ රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
71. සුපිරි වෙළඳ සැලක් (ෆුඩ් සිටි) පවත්වාගෙන යාම.
72. දුරකථන පෙර ගෙවුම් කාඩ් අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම.
73. තේ කම්හලක් පවත්වාගෙන යාම.
74. අන්තර්ජාල සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
75. සුරතල් මසුන් අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම.
76. කුළු බඩු, හාල්, සීනි, කිරිපිටි සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
77. කුළු බඩු, හාල්, සීනි, කිරිපිටි තොග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
78. ශීත කළ මාළු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
79. යෝගට් නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
80. පොහොර වෙළඳසැලක් පවත්වාගෙන යාම.
81. අවමංගල්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.

82. රසකැවිලි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
83. පරණ ලෝහ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
84. දත් බඳින, ගලවන ස්ථානයක් පවත්වාගෙන යාම.
85. කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
86. බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
87. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
88. ගෑස් ගබඩා කිරීම හා විකිණීම.
89. උත්සව ශාලාවක් පවත්වාගෙන යාම.
90. දුරකථන සංඥා කුළුණු පවත්වාගෙන යාම.
91. පරණ ලෝහ, පත්තර එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
92. ස්වයංක්‍රීය බැංකු ඒකකයක් පවත්වාගෙන යාම.
93. එළවළු හා පළතුරු තොග හා සිල්ලර/සිල්ලර අලෙවිය පවත්වාගෙන යාම.
94. මූල්‍ය ආයතනයක් පවත්වාගෙන යාම.

12-111/3

තිහගොඩ ප්‍රාදේශීය සභාව

අක්කර බදු අය කිරීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (i) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර තිහගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමකම 2024 වර්ෂයේදී බලාත්මක වූ සත්‍යෝක්ෂණ වටිනාකම 2025 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත් තිහගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර් එකකට නොඅඩු එහෙත් හෙක්ටයාර් පහකට අඩු සෑම ඉඩමක් මත රුපියල් පනහක (50.00) අනු ප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි සෑම ඉඩමකටම සෑම හෙක්ටයාරයක් මත රුපියල් දහය (10.00) බැගින් වූ වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

ඉහත කී පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, යථෝක්ත බද්ද 2025 වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු 04 තුළදී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස, බද්දට යටත් සෑම තැනැත්තෙකුට විධාන කළ යුතු යැයි ද, තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2024/09/26/363 යටතේ ම විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

එමෙන්ම 2025 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බදු 2025 වර්ෂයේ ජනවාරි මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%)ක වට්ටමක් ද එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%)ක වට්ටමක් ද ගෙවනු ලබන බවද මෙයින් වැඩි දුරටත් නිවේදනය කරමි.

තවද ඔබ විසින් ඉහත සඳහන් කර ඇති දිනයන් අවසාන වන විට අදාළ අක්කර බදුගෙවීමට අපොහොසත් වන්නේ නම් හෝ පැහැර හරිනු ලබන්නේ නම් කාර්තුවේ වටිනාකමට සියයට දහයක (10%) අධි ගාස්තුවකට යටත්වේ. එමෙන්ම අක්කර බදු ගෙවීම පැහැර හරිනු ලබන සෑම තැනැත්තෙකුට ම අයත් එහෙත් තම ජීවන වෘත්තිය කර ගෙන යාමට අදාළ නොවන සියළු චංචල දේපළ තහනමට ගැනීම හා විකිණීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය යටතේ සභාවට බලතල පැවරී ඇති බවද තවදුරටත් දැනුම් දෙමි.

මීටිතොට හේවගේ ගීතා නිහාරී,
ලේකම් හා බලතල,කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිළධාරී,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 25 වැනි දින.
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	රු. ශත
හෙක්ටයාර් 01 ට නොඅඩු හෙක්ටයාර් 05 ට අඩු	50 0
හෙක්ටයාර් 05 ක් හෝ ඊට වැඩි සෑම හෙක්ටයාර් 01 කටම	10 0

12-111/4

තිහගොඩ ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් සඳහා බදු අය කිරීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා 122 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති තිහගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2016.02.05 වැනි දින අංක 1953 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රය යටතේ සහා සම්මත කොට ඇත්තා වූ 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි කොටස් සඳහා අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි ඡේදය යටතේ තිහගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදි කිරීම හා ප්‍රදර්ශනය කිරීම මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි එක් එක් දැන්වීමකට අදාළ ගාස්තුවක් 2025 වර්ෂයට පනවා අය කිරීම කළ යුතු බවට, තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2024/09/26/363 යටතේ ම විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

මීවිතොට හේවගේ ගීතා නිහාරී,
ලේකම් හා බලතල,කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිළධාරී,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 25 වැනි දින.
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉහත කී උපලේඛනය

ප්‍රචාරක දැන්වීම් විස්තර			*අවසර පත්‍ර සඳහා ගාස්තු වර්ෂයකට රු.ශත*
01.	(*අ*)	ස්ථිර දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කරන දැන්වීමකට සෑම වර්ග අඩියකට ම	75 0
	(*ආ*)	ප්‍රතිදීප්ත ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට ම	100 0
02.	(අ)	පුද්ගලයෙකු විසින් ගෙන යනු ලබන හෝ ගමන් කරනු ලබන වාහනයක සවිකොට ඇති පුවරුවක හෝ ආධාරකයක් මගින් ප්‍රචාරය කරනු ලබන දැන්වීමක් සඳහා (මසකට) රෙදි හෝ ඩිජිටල් මුද්‍රිත බැනර් උපයෝගී කර ගනිමින් (ඉඩම් වෙන්දේසි) දැන්වීම් ප්‍රදර්ශනය සඳහා වර්ග අඩි 1 ට	25 0
	(ආ)	ඉහත 2(අ) කොටස සඳහා මසකට වැඩියෙන් ප්‍රචාරය කරන්නේ නම් වර්ග අඩියක් සඳහා	40 0
03.		කිසියම් පෞද්ගලික හෝ පොදු නිවසක හෝ ගොඩනැගිල්ලක බිත්තියක වහලයක හෝ තාප්පයක මහජනයාට පෙනෙන පරිදි කිසියම් වෙළඳ ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය වීමට සැලැස්වීම සඳහා වර්ග අඩියකට වර්ෂයක් සඳහා	20 0

* ඉහත අංක 1,2,3 මඟින් දැක් වූ දැන්වීම් පුවරුවක දැන්වීම ප්‍රදර්ශනය වන පැති ගණන අනුව ගණනය කරන ලද වර්ග අඩි ප්‍රමාණය මත ගාස්තු අය කරනු ලැබේ.

12-111/5

තිහගොඩ ප්‍රාදේශීය සභාව

සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු අය කිරීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ (1) වැනි උප වගන්ති ප්‍රකාරව තිහගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති සීමාව ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක ;

(*අ*) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ ;

(*ආ*) එම ඉඩමෙහි ගොඩනැගිලිවලට සත්‍ය වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය හා එම ඉඩමෙහි සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය නියමිත ප්‍රමාණයට වඩා අඩු නම් ප්‍රාදේශීය සභා යෝජනා සම්මතයක් මඟින් දරන්නා වූ හෝ ;

(*ඇ*) ඒ ඉඩමේ ස්ථාවර නැතහොත් නිතිපතා කරන ගොවිතැනට යොදවා නොමැති අවස්ථාවක ප්‍රාදේශීය සභාව විසින් ඒ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක් (2%) වූ බද්දක් සංවර්ධනය නොකළ ඉඩම්වලින් බදු වශයෙන් ඉඩම් අයිතිකරුවන්ගෙන් 2025 වර්ෂය සඳහා අය කළ යුතු බවට තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2024/09/26/363 යටතේ ම විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

මීටිතොට හේවගේ ගීතා නිහාරී,
ලේකම් හා බලතල,කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිළධාරී,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 25 වැනි දින.
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.
12-111/6

තිහගොඩ ප්‍රාදේශීය සභාව

ඇතැම් ඉඩම් විකිණීම මත බදු අය කිරීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තියේ (1) වගන්ති ප්‍රකාරව එකී පනතේ (8) වගන්තියේ (1) උප වගන්ති ප්‍රකාරව ඉඩමක් අයිතිකරුවෙකු, වෙන්දේසිකරුවෙකු, තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයන් හෝ අනුයෝජකයන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියකින් හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන්නේ නම් එම ඉඩමේ විකුණුමෙන් ලත් මුදලින් 1% ක මුදලකට සමාන මුදලක් අයිතිකරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයන් හෝ අනුයෝජකයන් විසින් 2025 වර්ෂය සඳහා ගෙවිය යුතු බවට තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2024/09/26/363 යටතේ ම විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

ඉහත දක්වා ඇති ආකාරයට කටයුතු කරනු නොලබන අයවලුන්ට එරෙහිව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 154 (2) 1 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලබන බව ද වැඩිදුරටත් නිවේදනය කරමි.

මීටිතොට හේවගේ ගීතා නිහාරී,
ලේකම් හා බලතල,කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිළධාරී,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 25 වැනි දින.
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.
12-111/7

තිහගොඩ ප්‍රාදේශීය සභාව

විනෝද බදු ආඥාපනත යටතේ බදු අය කිරීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතින් දෙවන වගන්තියේ (1) වැනි උපවගන්තිය ප්‍රකාර චිත්‍රපට දර්ශනයක්, මැජික් දර්ශනයක්, සර්කස් දර්ශනයක් හා සෑම සංගීත සංදර්ශනයක් සඳහාම මුද්‍රණය කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10% ක විනෝද බද්දක් තිහගොඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත්, මීට අමතරව ඉහත කී පවත්වනු ලබන සංදර්ශනයක් වෙනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන පරිදි බලපත්‍ර ගාස්තුවක් ද ගෙවිය යුතු බවට තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2023/11/07/245 යටතේ මා විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

මීවිතොට හේවගේ ගීතා නිහාරී,
ලේකම් හා බලතල,කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිළධාරී,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 25 වැනි දින.
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

		ගාස්තුව රු. ශත
i. මුදල් අය කරන සංගීත සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව	-	1,000. 00
ii. මුදල් අය නොකරන සංගීත සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව	-	500. 00
iii. මුදල් අය කරන සර්කස් සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව	-	1,000. 00
iv. නාට්‍ය සංදර්ශනයක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තුව	-	500. 00

12-111/8

තිහගොඩ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා කසළ ශෝධන ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12 වැනි වගන්තිය සහ 126 (ix) ආ වගන්තිය ප්‍රකාරව ලැබී ඇති බලතල මත තිහගොඩ ප්‍රාදේශීය සභාව විසින් කසල ශෝධන සේවාව සලසනු ලබන යටියන උප නගරය, තිහගොඩ උප නගරය, තිහගොඩ බටහිර, මැද උයන්ගොඩ සහ කපුටුව 5 කණ්ඩුව ඇතුළු කසළ එකතු කිරීමේ විශේෂ ව්‍යාපෘතියට ඇතුළත් වීමට කැමති හා මාර්ගවල පදිංචි වරිපනම්, බදු අය නොකරන නිවෙස්වලින් රු.200 ක කසළ ගාස්තුවක් ද ,ව්‍යාපාරික ස්ථානවලින් රු.300 ක කසළ ගාස්තුවක් ද, එළවළු තොග කඩවලින් රු.600 ක් ද ,හෝටල සහ උත්සව ශාලාවලින් රු.500 ක් ද, සේවා මධ්‍යස්ථානවලින් රු.500 හා විශේෂ ව්‍යාපෘතිවලින් රු.12000 ක් ද මසකට වරක් අය කිරීම සුදුසු යැයි තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2024/09/26/363 යටතේ ම විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

මීවිතොට හේවගේ ගීතා නිහාරී,
ලේකම් හා බලතල,කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිළධාරී,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 25 වැනි දින.
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-111/9

තිහගොඩ ප්‍රාදේශීය සභාව

ගොඩනැගිලි ඉදි කිරීම මත වෙනත් ගාස්තු අය කිරීම - 2025 වර්ෂය සඳහා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 21,49 ,78 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 1988.08.23 වැනි දින අංක 520 /7 දරන පළාත් පාලන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* iv (ආ) කොටසේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව නිවාස හා නගර සංවර්ධනය ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 වර්ෂයට බල පැවැත්වෙන පරිදි තිහගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල යම් ඉදි කිරීමක් සිදු කරනු ලබන තැනැත්තෙකු විසින් පහත උපලේඛනයේ සඳහන් වන පරිදි ගාස්තු අය කිරීම සිදු කළ යුතු බවට තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2024/09/26 /363 යටතේ ම විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

ඉහත කී ආකාරයට කටයුතු නොකරනු ලබන සියලු ඉදිකිරීම් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරි විසින් නිකුත් කොට ඇති 2021.07.08 දිනැති හා 2235/54 අංක දරන *අති විශේෂ ගැසට්* පත්‍රයේ 2 වන උපලේඛනය අනුව දඩ හා ගාස්තු අයකිරීම සිදු කරනු ලබන බව ද තව දුරටත් නිවේදනය කරමි.

මීටිතොට හේවගේ ගීතා නිහාරි,
ලේකම් හා බලතල, කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිළධාරි,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 25 වැනි දින.
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

<table>
<tr><th>සංවර්ධන කාර්යයේ ස්වභාවය</th><th>භාවිතාකළ යුතු ආකෘති පත්‍රය</th><th colspan="2">අය කළ යුතු ගාස්තුව</th></tr>
<tr><td>1. ඉඩම් අනු කොටස්වලට බෙදීම සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම.</td><td>"අ"</td><td>1. පෙරසැරි ගාස්තු බිම් කට්ටියක ප්‍රමාණය

• ව.මී.150 - 300 අතර
• ව.මී.301 - 600 අතර
• ව.මී.601 - 900 අතර
• ව.මී.901 ට වැඩි</td><td>එක් බිම් කට්ටියකට අය කළ යුතු මුදල (මාර්ග කාණු හා පොදු බිම් කොටස් හැර)

රු.1000.00
රු.800.00
රු.600.00
රු.500.00</td></tr>
<tr><td>ගොඩනැගිලි ඉදි කිරීම /කොටසක් එකතු කිරීම/නැවත ඉදි කිරීම සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම.</td><td>"ආ"</td><td colspan="2">2. ආවරණ අනුමැතිය සඳහා ගාස්තු එක් බිම් කොටසකට රු.750 බැගින්

I. පෙරසැරි ගාස්තු පදිංචිය සඳහා
වාණිජ හෝ වෙනත්
ගෙබිම් විශාලත්වය වර්ග මීටර් 1 ට

<table><tr><th></th><th>රු.</th><th>රු.</th></tr><tr><td>400 දක්වා</td><td>20</td><td>25</td></tr><tr><td>401 - 1000</td><td>22</td><td>27</td></tr><tr><td>1001 - 1500</td><td>25</td><td>30</td></tr><tr><td>1501 - 2000</td><td>25</td><td>32</td></tr></table>
2000 වැඩි වන සෑම වර්ග මීටර 90 ක් සඳහාම රු:2000 බැගින්</td></tr>
</table>

තිහගොඩ ප්‍රාදේශීය සභාව

සේවා ගාස්තු නියම කිරීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් පහත සඳහන් පොදු උපයෝගී සේවා සහ සුබ සාධන සේවා හා වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය කරන සේවා සැපයීම වෙනුවෙන් 2025 වර්ෂය තුළ දී ගාස්තු අය කිරීමට නියම කරන බවට තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2024/09/26/363 යටතේ ම විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

මීටිතොට හේවගේ ගීතා නිහාරී,
ලේකම් හා බලතල,කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිළධාරී,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 25 වැනි දින.
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	සේවාව	*රු. ශත.*
1.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව	1000.00
2.	වීථි රේඛා හා නොපවරා ගැනීමේ සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා ගාස්තු අය කිරීම	1000.00
3.	අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා අයදුම්පත්‍ර ගාස්තුව (එක් ගසක් සඳහා)	
	(i) කොස් ගසක් සඳහා	750.00
	(ii) වෙනත් ගසක් සඳහා	500.00
4.	ගොඩනැඟිලි අනුකූලතා සහතිකපත්‍ර සඳහා ගාස්තුව	4000.00
5.	වෙනත් සහතික පත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පතක් නිකුත් කිරීමේ ගාස්තුව	300.00
6.	කර්මාන්ත ගිවිසුම් පත්‍රයක් නිකුත් කිරීමේ ගාස්තුව (පිටපත් 04 සඳහා)	2000.00
7.	ටෙන්ඩර් අයදුම්පතක් නිකුත් කිරීමේ ගාස්තුව	
	(i) රු. 10000 අඩු ටෙන්ඩර් සඳහා	500.00
	(ii) රු. 10000 ට වැඩි ටෙන්ඩර් සඳහා	1000.00
8.	තාවකාලික වෙළඳ කුටි ඉදිකිරීමේ දී එක් දිනකට වර්ග අඩියට	10.00
9.	අලෙවි කටයුත්තක් සඳහා සභාව සතු භූමියේ නිශ්චිත ස්ථානයක් ලබා දීම. (එක් දිනක් සඳහා)	2000.00
10.	ඉඩම් අනු බෙදුම් අයදුම්පත්‍ර ගාස්තුව	300.00
11.	පුස්තකාල සාමාජික ඇප තැන්පත්	100.00
12.	පුස්තකාල සාමාජික අයදුම්පත් ගාස්තු	100.00
13.	සභාව සතු ප්‍රජා ශාලා පෞද්ගලික පෙර පාසල් සඳහා බදු දීම එක් ළමයෙකුගෙන් මසක් සඳහා	100.00
14.	සභාව සතු ක්‍රීඩා භූමි පරිහරණය කිරීම වෙනුවෙන් එක් දිනක් සඳහා	2000.00
15.	සභාව සතු සුසාන භූමිය - එක් මරණයක් මිහිදන් කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම.	1000.00
16.	සභාව සතු ආදාහනාගාරය පරිහරණය කිරීම.	
	(i) බල ප්‍රදේශය තුළ එක් මරණයක් අදාහනය සඳහා	10000.00
	(ii) බල ප්‍රදේශයෙන් පිට එක් මරණයක් අදාහනය සඳහා	11000.00
17.	තලන රෝල් දිනකට	50000.00
18.	බැකෝ යන්ත්‍රය පැයකට	6000.00
19.	ජල බවුසරය දිනකට	5000.00
20.	බොබ් කැට් යන්ත්‍රය දිනකට	12000.00
21.	ට්‍රැක්ටරය දිනකට	12000.00
22.	**හෙළ බොජුන්හල ගාස්තු දිනකට**	
	(i) ජූස් මැෂිම සමඟ එක් ව්‍යවසායකයෙකුගෙන් දිනකට	200.00
	(ii) අනෙක් එක් ව්‍යවසායකයෙකුගෙන් දිනකට	150.00
23.	වරිපනම් බදු නොගෙවන බවට සහතිකපතක් නිකුත් කිරීම	250.00
24.	වරිපනම් බදු නව සංශෝධනය කිරීම හා නව අංක ලබා ගැනීමට අයදුම්පත් ගාස්තුව	250.00
25.	කොඩි කණුවක් එක් දිනකට	20.00

තිහගොඩ ප්‍රාදේශීය සභාව

පොදු වෙළඳපොළ බදු මුදල් ප්‍රකාශයට පත්කිරීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සති පොළ බදු පනවා අය කිරීම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සහ 126 (ix) ආ වගන්තිය ප්‍රකාරව ලැබී ඇති බලතල මත තිහගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2006.06.16 දින අංක 1450 යටතේ සම්මත කර ගත් 1988.08.23 අංක 520/7 සම්මත අතුරු ව්‍යවස්ථාවේ 33 ජේදය අනුව තිහගොඩ ප්‍රාදේශීය සභාවේ සති පොළ භූමිය තුළ යම් සංචාරක ව්‍යාපාරිකයෙකු වෙනුවෙන් පොළ පැවැත්වෙන එක් දිනක් සඳහා 2025 වර්ෂය සඳහා පහත සඳහන් ගාස්තු පනවා අයකිරීමට තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2024/09/26/363 යටතේ ම විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

මීවිතොට හේවගේ ගීතා නිහාරී,
ලේකම් හා බලතල,කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිළධාරී,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 25 වැනි දින.
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

අඩි 6x8 ප්‍රමාණය අල්ලියක් සඳහා,

1.	එළවළු වෙළඳාම සඳහා	රු:-100.00
2.	පළතුරු වෙළඳාම සඳහා	රු. 100.00
3.	සිල්ලර වෙළඳාම සඳහා	රු. 100.00
4.	වෙනත් වෙළඳ කටයුතු සඳහා	රු. 100.00
5.	මාළු වෙළඳාම සඳහා (ස්ථීර වෙළඳුන් හැර ආධුනික වෙළඳුන් සඳහා)	
6.	ජංගම වෙළඳ රථයක් සඳහා	රු. 100.00
7.	අල්ලිවලින් පිටත සුළු වෙළඳ කටයුතු සඳහා	රු. 50.00

12-111/12

තිහගොඩ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා 134(1) වගන්තිය සමඟ කියවිය යුතු හා එකී පනතේ 146(1) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2024/09/26/363 යටතේ බලාත්මක කොට ඇති පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2009 හා 2017.03.03 දිනැති *ගැසට් පත්‍රයෙන්* දියුණු කළ ප්‍රදේශයක් ලෙස පත්කර ඇත්තා වූ තිහගොඩ ප්‍රාදේශීය සභාව ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශය තුළ පිහිටි සියලු නිවාස.ගොඩනැගිලි ඉඩම් හා ගෙපත් යන නිශ්චල දේපළවලට අදාළව 2019 වර්ෂයේ තක්සේරු කරන ලද වාර්ෂික වටිනාකම මත සියයට අට (8%) අනු ප්‍රමාණයට යටත්ව 2025 වර්ෂය සඳහා වාර්ෂික වරිපනම් බදු පනවා අය කිරීමට තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

එසේම ඉහත කී පනතේ 134 (6) වන වගන්තිය අනුව 2025 වර්ෂයේ මාර්තු 31, ජූනි 30 හා සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්වලින් අවසන් වන කාර්තු හතර (4) තුළ දී සමාන වාරිකවලින් ගෙවීමට හැකියාව තිබෙන බවත්, එසේ ගෙවීමේ දී 2025 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක(10%)ක වට්ටමක් ද එක් එක් කාර්තුවේ පළමු මාසය තුළ දී අදාළ වරිපනම් බදු ගෙවන්නේ නම් එම කාර්තුවකට අදාළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ලබා ගත හැකි බව වැඩිදුරටත් දැනුම් දෙමි.

තවද ඔබ විසින් ඉහත සඳහන් කර ඇති දිනයන් අවසාන වන විට අදාළ වරිපනම් බදු ගෙවීමට අපොහොසත් වන්නේ නම් හෝ පැහැර හරිනු ලබන්නේ නම් කාර්තුවේ වටිනාකමට සියයට දහයක (10%) අධි ගාස්තුවකට යටත් වේ. එමෙන්ම වරිපනම් බදු ගෙවීම පැහැර හරිනු ලබන සෑම තැනැත්තෙකුටම අයත් එහෙත් තම ජීවන වෘත්තිය කරගෙන යාමට අදාළ නොවන සියලු චංචල දේපළ තහනමට ගැනීම හා විකිණීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්තිය 158 (1) වගන්තිය යටතේ තිහගොඩ සභාවට බලතල පැවරී ඇති බව ද තවදුරටත් දැනුම් දෙමි.

මීවිතොට හේවගේ ගීතා නිහාරී,
ලේකම් හා බලතල,කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිළධාරී,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 25 වැනි දින.
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-111/13